# බස්නාහිර පළාතේ පළාත් සභාව
## மேல் மாகாண மாகாண சபை
## WESTERN PROVINCE PROVINCIAL COUNCIL

**2015 ඔක්තෝබර් 06** වන අඟහරුවාදා
2015 ஐப்பசி 06 செவ்வாய்க் கிழமை
Tuesday 06th October 2015

**බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි බස්නාහිර පළාතේ සභා ගොඩනැඟිලි සංකීර්ණයේ නව සභා ශාලාවේදී පැවැති සභා රැස්වීම**

பத்தரமுல்ல .இல ,டென்சில் கொப்பேகடுவ மாவத்தை .ஸ்ரீ ஜயவர்த்தனபுர , 204இல் மேல் மாகாண சபையின் புதிய கட்டடத் தொகுதியில் அமைந்துள்ள புதிய சபை மண்டபத்தில் நடைபெற்ற கூட்டம்

The meeting held at the Western Provincial Council new building complex at No.204, Denzil Kobbekaduwa Mawatha, Sri Jayawardhanapura, Battaramulla.

**පූ.භා. 09.33 ට පළාත් සභාව රැස් විය.**
*மு.ப. 09.33 க்கு சபை கூடியது*
*The Provincial Council met at 09.33 a.m.*

**ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනාරූඪ විය.**
*திரு .தவிசாளர் [சுனில் விஜேரத்ன அவர்கள்] தலைமை வகித்தார்.*
*Mr. Chairman [Sunil Wijerathne] in the Chair*

# සභාපතිවරයාගේ නිවේදන
## ANNOUNCEMENTS OF CHAIRMAN

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*i*

*"සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීමේදී තීරණය වූ පරිදි, මන්ත්‍රී පෞද්ගලික කාර්ය මණ්ඩල සාමාජිකයින් සඳහා පුහුණු වැඩමුළුවක්, 2015 ඔක්තෝබර් මස 30 වන දින කොළඹ දී පැවැත් වීමට අදහස් කර තිබෙනවා.*

*ඒ සඳහා අවශ්‍ය තොරතුරු එක් රැස් කර ගැනීම සඳහා, සභා ලේකම්තුමාගේ අත්සනින් වූ ලිපියක් අද දින ගරු මන්ත්‍රීවරුන්ගේ සභා මේසය මත තබා තිබෙනවා.*

*ඒ සමඟ ඇති ආකෘති පත්‍රය සම්පූර්ණ කර 2015.10.13 දිනට පෙර සභා ලේකම්තුමා වෙත එවන මෙන් දැනුම් දෙන අතර,*

*හැකියාවක් ඇත්නම් අද දින තුළදීම එම ආකෘති පත්‍රය සම්පූර්ණ කර භාර දීමට කටයුතු කරන්නේ නම් වඩාත් පහසු වන බව ද කාරුණිකව දැනුම් දෙනවා."*

*ii*

*"එස්. කුහවර්දන් ගරු මන්ත්‍රීතුමා, ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණ නැමැති දේශපාලන පක්ෂයේ බස්නාහිර පළාතේ පළාත් සභාවේ මන්ත්‍රී කණ්ඩායමේ නායක ලෙස නම් කරන බව එම පක්ෂයේ මහ ලේකම් විසින් 2015.09.22 දිනැතිව ලිඛිතව දැනුම් දීමක් කර තිබෙනවා.*

*ඒ අනුව එම කණ්ඩායම් නායක ලෙස නම් කිරීම අද දින සිට වලංගු වන පරිදි මා විසින් පිළිගන්නා ලද බව කාරුණිකව දැනුම් දෙනවා.*

*මේ අවස්ථාවේ එතුමා සභා ගර්භය තුළ නොසිටියත්, මම බස්නාහිර පළාත් සභාවේ සභාපතිතුමා වශයෙනුත් සියලුම ගරු මන්ත්‍රීතුමන්ලාගේ සුභ පැතුම් එතුමාට පිරිනමනවා."*

*iii*

***කාරක සභා පත් කිරීම් :***

*"මේ වන විට පුරප්පාඩුව පවතින ප්‍රඥප්ති හා නීති කාරක සභාවේ පුරප්පාඩු වෙනුවෙන් ආණ්ඩු පක්ෂය වෙනුවෙන් රසික මංජුල බුද්ධදාස ගරු මන්ත්‍රීතුමා සහ ජනක දීපාල් වැලිවත්ත ගරු මන්ත්‍රීතුමා අද දින සිට පත් කර ඇති බව කාරුණිකව සභාවට දැනුම් දෙනවා."*

*"සභා කටයුතු කාරක සභාවේ ඇති වී තිබෙන පුරප්පාඩුව සඳහා සරත් සුමනසේකර ගරු මන්ත්‍රීතුමා සහ මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා අද දින සිට එම කාරක සභාවට පත් කර ඇති බව සභාවට මම දැනුම් දෙනවා."*

*"ඒ වාගේම පෙත්සම් කාරක සභාව සඳහා ආණ්ඩු පක්ෂය නියෝජනය කරමින් ඇති වූ පුරප්පාඩුවට ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමාව අද දින සිට එම කාරක සභාවට පත් කර ඇති බව කාරුණිකව දැනුම් දෙනවා.*

*iv*

*"මෙම සභාවේ ආසන සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීවරුන්ට යම් ගැටලුවක්, ඉල්ලීමක් හෝ යෝජනාවක් ඇත්නම් මා වෙත හෝ සභා ලේකම්තුමා වෙත ලිඛිතව යොමු කරන මෙන් කාරුණිකව දැනුම් දෙනවා.*

*ඒ සම්බන්ධව සභා රීති ප්‍රකාරව හා සභා සම්ප්‍රදායන්ට අනුකූලව ලබා දිය හැකි සහනයක් ඇත්නම්, ලබා දීමට උත්සාහ කරන බවත් සභාවට කාරුණිකව දැනුම් දෙනවා."*

*V*

ඇතැම් ගරු මන්ත්‍රීතුමන්ලාගේ සභා මේස මත අපි ගොඩාක් ලිපි ලේඛන තැන්පත් කර තිබෙනවා. හැන්සාඩ් වාර්තා, කාරක සභා වාර්තා ආදී සියල්ලක්ම මේසය මත තිබෙනවා. නමුත් බොහෝ දුරට ගරු මන්ත්‍රීතුමන්ලා මේ ලේඛන, ලිපි අරගෙන යන්නේ නැහැ. ඒ සම්බන්ධයෙන් බලවත් ප්‍රශ්නයක් තිබෙනවා. ඒ නිසා අපි තීන්දු කරලා තිබෙනවා, බෙදා හරින ලද ලිපි ලේඛන මාස 06 ක් ඇතුළත අරගෙන යන්නේ නැත්නම් - මේක ඉතාමත් කනගාටුදායක තත්ත්වයක්. මාස 06 ක් තුළවත් තමන්ට අදාළ මේසය මත තිබෙන ලිපි ලේඛන අරගෙන යන්නේ නැත්නම් අපි ඒවා අයින් කරනවා. බොහොම කනගාටුදායක තත්ත්වයක්. අපි බොහෝ මුදලක් වැය කරලා, පළාත් සභාවේ මහජන මුදල් විශාල ප්‍රමාණයක් වැය කරලා මේ පොත් මුද්‍රණය කරලා ගරු මන්ත්‍රීතුමාට අදාළ මේසය මත තිබුණාට මම දන්නේ නැහැ, ගරු මන්ත්‍රීතුමන්ලා මේවා කියවනවාද කියලා. කෙහොම හරි මාස ගණනක් තිබෙනවා. ඒ නිසා මම ඉතාමත් කාරුණිකව ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් ඉල්ලා සිටිනවා, එහෙම කරන්න එපා. ඔබතුමන්ලාගේ ලිපි ලේඛන, වටිනා දේවල් සඳහන් වෙලා තිබෙනවා. නිවේදන, අවශ්‍ය නොයෙකුත් දේවල්. ඒ නිසා අවශ්‍ය ගරු මන්ත්‍රීවරුන් එම ලේඛන රැගෙන යාමට කටයුතු කරනු ඇතැයි අපේක්ෂා කරන බවත් කාරුණිකව දැනුම් දෙනවා.

2015.09.22 වන දින නිල වාර්තාවේ (හැන්සාඩ්) සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා විසින් කරන ලද පෞද්ගලික පැහැදිලි කිරීම ඇතුළත් 20 වන පිටුවේ, 1240 තීරුවේ, 10 වන පේළියේ සඳහන් "අයිවන් සරත්" යන්න "අයිවන් සනත්" ලෙස නිවැරැදි වෙනවා ඇත.

## කාරක සභා වාර්තා
## COMMITTEE REPORTS

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

2015.09.23 වන දින පැවැති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම් වාර්තාව මම ගරු මන්ත්‍රීතුමන්ලා වෙත පිළිගන්වනවා.

***අදාළ වාර්තාවේ පිටපත් ගරු මන්ත්‍රීවරුන්ගේ මේසය මත තබා ඇති බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.***

*The Hon. Chairman declared that a copy of the relevant report is placed on the tables of the Hon. Members.*

## පෙත්සම්
## PETITIONS

**ගරු යසපාල කෝරළගේ - නියෝජ්‍ය සභාපතිතුමා**
Hon . Yasapala Koralage - Deputy Chairman

ගරු සභාපතිතුමනි, හොරණ, පානදුර පාර, අංක 151/10 හි පදිංචි ඩබ්.එල්. ජයතිලක, හොරණ, පානදුර පාර, අංක 151/6 හි පදිංචි එම්. ජේ. කීර්තිවංශ සහ හොරණ, පානදුර පාර, අංක 151/8 හි පදිංචි එස්. හෙන්දවිතාරන යන ආදිය නමින් ඇති පෙත්සම මම ඉදිරිපත් කරනවා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, පානදුර, පොන්සේකා පාර, 11 B හි පදිංචි පී. මොහාන් ඩයස් යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

**ගරු කාමල් කුරුප්පු**
Hon. Kamal Kuruppu

ගරු සභාපතිතුමනි, මීරිගම, වේවැල්දෙණිය, ඉහළගම, අංක 51 හි පදිංචි පී.ඩී. සිරිනිමල් යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

**ගරු සුමිත් ලාල් මැන්දිස් -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Sumith Lal Mendis - Chief Government Whip

ගරු සභාපතිතුමනි, පහත සඳහන් පෙත්සම් මම ඉදිරිපත් කරනවා.

i. කළුතර උතුර, පොන්සේකා පටුමඟ, අංක 24/27 හි පදිංචි පී. ධම්මික ප්‍රනාන්දු යන අයගේ පෙත්සම සහ,

ii. කළුතර, කලමුල්ල, අලුත් පල්ලිය පිටුපස හි පදිංචි ටී.ඒ. නීල් ශාන්ත ප්‍රනාන්දු යන අයගේ පෙත්සම.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, කොළඹ දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා කොට්ඨාශයට අයත්, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ සහන රියැදුරන් වන ඩබ්.ඒ. සමන් පුෂ්පකුමාර, ආර්.ඒ. ජයන්ත රේණුක සහ එම්.එස්.පී. සිගේරා යන අයවලුන්ගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

ගරු සභාපතිතුමනි, පහත සඳහන් පෙත්සම් මම සභාවට ඉදිරිපත් කරනවා.

i. පොල්ගස්ඕවිට, අම්බලන්ගොඩ, අංක 46/1 හි පදිංචි දයන්ත පී. කුමාර යන අයගේ පෙත්සම සහ

ii. හෝමාගම, පිටිපන උතුර, 116/15/2 හි පදිංචි එම්.ඩබ්. ඉන්දික යන අයගේ පෙත්සම.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් කාරක සභාවට යොමු කළ යුතු යැයි නියෝග කරන ලදී.***

*Petitions Presented, ordered to refer to the Petitions committee*

# ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## ORAL ANSWERS TO QUESTIONS

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ප්‍රශ්න අංක 01. මංජු ශ්‍රී අරංගල ගරු විපක්ෂ නායකතුමා විසින් සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය ගරු අමාත්‍යතුමාට ඉදිරිපත් කරන ලද ප්‍රශ්නයට පිළිතුරු ලබා දීමේ අවස්ථාව.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ** (සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන, පරිවාස හා ළමා රක්ෂණ සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා)
**Hon. Nishantha Sri Warnasinghe** (Minister of Health, Indigenous Medicine, Social Welfare, Probation and Child Care Services, Women's Affairs and Council Affairs.)

ගරු සභාපතිතුමනි, ගරු විපක්ෂ නායකතුමා විසින් යොමු කරන ලද මෙම ප්‍රශ්නයට පිළිතුරු ලබා දීම සඳහා ඊළඟ සභා වාරය තෙක් කල් ලබා දෙන ලෙස මම කාරුණිකව ඉල්ලා සිටිනවා. මොකද, නවක ඇමැතිවරයෙක් විධියට මම හිතන්නේ මෙම ප්‍රශ්නය මීට ප්‍රථමත් ටිකක් ආන්දෝලාත්මක, මතභේදාත්මක ප්‍රශ්නයක්. ඉතින් මේ ප්‍රශ්නය පිළිබවදව මම ඒ වගකිවයුතු නිලධාරිතුමිය සමග කථා කළා. නමුත් මට මේ සඳහා පිළිතුරු බඳින්න තවමත් එතැනින් පිළිතුරක් ලැබිලා නැහැ. ඒ නිසා ඉදිරි සභා වාරයේදී මේ පිළිබඳව මගේ අවධානය යොමු කරලා පිළිතුරක් මේ සභාවට ලබා දෙන්න කටයුතු කරනවා.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම මේ පළාත් සභාවේ මම අහපු ප්‍රශ්නය විතරක් නොවෙයි. මේකට අදාළව. මේ පළාත් සභාව තුළ අවිධිමත් ලෙස වාහන පාවිච්චි කරනවා. මම හිතන්නේ, පළාත් සභාවේ අමාත්‍යාංශවල අනෙකුත් තැන්වල මේ අවිධිමත් ආකාරයට වාහන පාවිච්චි කිරීම අපි සමාජයට දෙන ආදර්ශයක් නොවෙයි. මේක සමාජයේ සේවකයන් අතර කථා බහට ලක් වෙනවා. ඒ නිසා මේ කාරණය සම්බන්ධයෙනුත් මගේ පුංචි පැමිණිල්ලක් තිබෙනවා. අදාළ අමාත්‍යාංශ ලේකම්වරුන්ගෙන්, ආයතන ප්‍රධානීන්ගෙන් අපි යමක් ඉල්ලුවාම ඒ පිළිබඳව නිරවුල්ව, නිවැරැදිව අපට අදාළ තොරතුරු හම්බ වෙන්න ඕනෑ. මම මේ ප්‍රශ්නය ගරු ඇමැතිතුමාට මතු කළේ මොකුත් නොවෙයි. පුද්ගලිකව මම උපදේශක කාරක සභාවේදී මේ ප්‍රශ්නය ඇහුවා. හැබැයි, මට උත්තරය හම්බ වුණේ යන්නේ කොහේද මල්ලේ පොල් වාගේ කථාවක්. විශේෂයෙන්ම ඔබතුමාගේ මාර්ගයෙන් ගරු ප්‍රධාන ඇමැතිතුමාට, අනෙකුත් ගරු ඇමැතිවරුන්ට නියෝගයක් කරන්නය කියලා ඉල්ලා සිටිනවා. යම් මන්ත්‍රීවරයෙක් මේ සභාවේ විනය පවත්වාගෙන යැම සඳහා යම් තොරතුරක් ඉල්ලුවාම, ඒක නිවැරැදිව දෙන එක නිලධාරීන්ගේ වගකීමක්. එහෙම නැත්නම් මේ පළාත් සභාව දවසින් දවස පිරිහුණු තැනක් බවට පරිවර්තනය වෙනවා. ඒ නිසා මේ සම්බන්ධයෙන් ඔබතුමාගේ අවධානය යොමු කරන්න. මම මෙයට පිළිතුරු ඉල්ලලාත් හය මාසයකට වැඩියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මට මතකයි.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

මේ ලියුමට මම පිළිතුරු ඉල්ලලා හය මාසයකට වැඩියි. අදාළ නිලධාරීන් මෙය දෙන්නේ නැහැ. වසන් කරගෙන ඉන්නවා. මේක වැරැදි පූර්වාදර්ශයක්. මෙය නිවැරැදි කරන්නය කියලා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු විපක්ෂ නායකතුමා විසින් ඉදිරිපත් කරපු කාරණා පිළිබඳව මමත් ඇත්ත වශයෙන්ම එතුමාට ගරු කරනවා. මොකද, මට මතකයි එතුමා මේ ප්‍රශ්නය දැනට මාස 06 ක් තිස්සේ ඉදිරිපත් කරනවා. නමුත් මම කනගාටු වෙනවා, දැන් අලුත් ඇමැතිවරයෙක් ඉන්නේ. මම හිතන්නේ ඔබතුමාටත් ඉහළින් ද දන්නේ නැහැ ඒ නිලධාරීන් ඉන්නේ. ඒ නිසා මම ඔබතුමාගෙන් විශේෂයෙන් ඉල්ලා සිටිනවා. ඔබතුමා අමාත්‍යාංශයේ ලේකම්ට වහාම උපදෙස් දෙන්න. ඊළඟ සභාවට ඒ ප්‍රශ්නයට නිවැරැදි, එතුමා කිව්වා වාගේ බොරු උත්තර නොවෙයි. නිවැරැදි උත්තරයක් සකස් කරලා ඔබතුමා සභාවට ඉදිරිපත් කරන්න.

**ගරු රංජිත් සෝමවංශ** (අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමා)
Hon. Ranjith Somawansa (Minister of Education, Cultural and Arts Affairs, Sports and Youth Affairs and Information Technology.)

නොලැබුණොත් ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නොලැබුණොත් ඔබතුමා මොකක් හරි තීන්දුවක් ගන්න. තව එකක් මම ගරු මන්ත්‍රීතුමන්ලාට මතක් කරනවා. මේ පළාත් සභාවේ බලගතු කාරක සභාවක් තිබෙනවා. අවදි කාරක සභාව. ඒ කාරක සභාව බොහොම බලගතු කාරක සභාවක්. නමුත් තවම ඒ කාරක සභාවට ප්‍රශ්න යොමු වෙන්නේ නැහැ. මට මතකයි, අවුරුදු 10 කට ඉස්සෙල්ලා අසෝක සපුමල් ගරු මන්ත්‍රීතුමා යෝජනාවක් ඉදිරිපත් කළා, ගම්පහ ශ්‍රී බෝධි පිට්ටනිය සම්බන්ධව. අන්තිමේදී ඒ ප්‍රශ්නයේදී නිලධාරීන් අසරණ වුණා. නිලධාරීන් භය වුණා. මේ ප්‍රශ්නයේදී කාරක සභාවේ තීන්දුවක් අරගෙන මොකක් හරි ගැටලුවක් ඇති වෙයි කියලා. මම ඔබතුමාට විශේෂයෙන් මතක් කරනවා, අවදි කාරක සභාවට ඔය ප්‍රශ්නය යොමු කරන්න. ඇත්ත වශයෙන්ම අවභාවිතයක් තිබෙන්නේ. ඒ නිසා ඔබතුමාට අයිතියක් තිබෙනවා, ඒ සම්බන්ධව අවදි කාරක සභාවට ඒ ප්‍රශ්නය යොමු කරන්න. ඊට පස්සේ අපට පුළුවන් කාරක සභාව හරහා තීන්දුවක් ගන්න. එහෙම උත්තරයක් එන්නේ නැත්නම්.

මීළඟට අජන්ත නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමා විසින් අධ්‍යාපන හා සංස්කෘතික, කලා කටයුතු ගරු අමාත්‍යතුමාට ප්‍රශ්නය ඉදිරිපත් කිරීමේ අවස්ථාව.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු සභාපතිතුමනි, ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

**02.**

**නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමා විසින් අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/VI(1)/15/28)**

අ. කෝට්ටේ ආනන්ද බාලිකා විද්‍යාලයේ විදුහල්පතිනිය හා සම්බන්ධව කරන ලද විමර්ශනයේ වාර්තාව ඔබතුමාට ලැබුණාද?

ආ. එහි සඳහන් චෝදනා මොනවාද?

ඇ. එම වාර්තාව සම්බන්ධයෙන් ගෙන ඇති පියවර කවරේද?

ඈ. විදුහල්පතිනිය විසින් විදේශ නිවාඩු අනුමත කර නොගෙන පාසල් දරුවන්ද සමඟ මැලේසියාවේ සංචාරකයක යෙදී ඇති බවත්, එම සංචාරයට සහභාගි වූ පාසල් දරුවන්ගේ පැමිණීම ලේඛනවල සටහන්ව ඇති බවත් ඔබතුමා දන්නවාද?

ඉ. ඒ සම්බන්ධව ගන්නා ක්‍රියා මාර්ග කවරේද?

ඊ. එම සංචාරය පිළිබඳව විමර්ශන වාර්තාවේ සඳහන්ව තිබේද?

උ. විමර්ශන වාර්තාව සභාගත කරන්නේද?

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

අ. ඔව්.

ආ. ආයතන සංග්‍රහයේ 48 වන පරිච්ඡේදයේ රාජ්‍ය නිලධාරීන් විසින් සිදු කළ හැකි වරදවල් සම්බන්ධව පළමුවන උප ලේඛනයේ 7, 8, 9, 10, 12, 15, 16 වන වගන්ති යටතට ගැනෙන වරදක් සිදු කිරීම.

ඇ. චෝදනා පත්‍රයක් නිකුත් කර ඇත.

ඈ. නැත.

ඉ. ඉදිරියේදී ඒ සම්බන්ධයෙන් විමර්ශනයක් සිදු කරනු ලැබේ.

ඊ. නැත.

උ. නැත.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු සභාපතිතුමනි, මම අලුත් අධ්‍යාපන ඇමැතිතුමා ගැන දුක් වෙනවා. නැත, ඇත, නැත, ඔව්, නැහැ, බැහැ වැඩ සටහනක් නොවෙයි මේක. මේක මහජන මුදල් හොරකම් කරපු වැඩක්. ගරු සභාපතිතුමනි, මම එතුමාගෙන් අහන පළමු අතුරු ප්‍රශ්නය තමයි, අවුරුදු 1 ½ ක් තිස්සේ මේ විමර්ශනය කරමින් පවතින නිලධාරීන් සම්බන්ධයෙන් ඔබතුමා ගන්නා පියවර මොකක්ද?

දෙවැනි අතුරු ප්‍රශ්නය තමයි විදුහල්පතිතුමිය පාසල් දරුවන්ගේ Attendant Sheetවල 1 දාලා විදේශ සංචාරයක් අරගෙන යැමට ඇයට තිබෙන බලතල කුමක්ද?

තුන්වැනි අතුරු ප්‍රශ්නය තමයි, පාසලේ සෙලාන් බැංකුව විසින් නිකුත් කරපු චෙක්පතක් පාසලේ ගිණුම නමින් වෙනත් ගිණුමක දාගෙන සහ පාසලේ අයථා මූල්‍ය ගනුදෙනු සම්බන්ධයෙන් විමර්ශන කණ්ඩායම කරපු පරීක්ෂණ වාර්තාව සභාගත කරනවාද? ඒ ප්‍රශ්න 03 යි මම අහන්නේ අධ්‍යාපන ඇමැතිතුමනි?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමා ඔබතුමාට අතුරු ප්‍රශ්න තුනක් යොමු කළා.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමනි, අලුත් අධ්‍යාපන ඇමැතිතුමා ගැන දුක් වෙන්න එපා. මම මේවා හරියට කරන්න කැමැති කෙනෙක්. ඔබතුමා ටිකක් මගේ පරණ යාළුකමත් අමතක කරලා වාගේ. ඔව්, නැහැ, බැහැ නොවෙයි. අපි මේ සම්බන්ධයෙන් විමර්ශනයක් කරනවා, ගරු මන්ත්‍රීතුමා. ඒ හින්දා මේ ආවට ගියාට ප්‍රශ්නවලට උත්තර දීලා වගකීමෙන් තොර ප්‍රකාශ කරන්න බැහැ. ඔබතුමා මේක කියෙව්වා නම් තියෙනවා, මේකේ විමර්ශනයක් කරනවා. ඔබතුමාට හැකි ඉක්මණින් සාධාරණ උත්තරයක් දෙනවා.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

විමර්ශනය කරලා අවසානයි කියලා ඔබතුමාගේ ලේකම්තුමා අධ්‍යාපන උපදේශක කාරක සභාවේ කිව්වා.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

මම දැන් අලුත් අධ්‍යාපන ඇමැති නේ? සති දෙකක් දෙන්න. බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, සමාවෙන්න. එතුමා සති දෙකක කාලයක් ඉල්ලනවා. අපි සති දෙකක කාලයක් දෙමු.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

විමර්ශනය කරලා අවසානයි කියලා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. හරි. සති දෙකක කාලයක් ඉල්លුවා නේ?

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ඔබතුමාට ප්‍රශ්න තුනයි නේ අහන්න පුළුවන්.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

හරි. හරි. ඒ අහපු එකට කිව්වේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, එතුමා පොරොන්දු වුණා නේ දැන්. එතුමා සුමාන දෙකක් ඇතුළත ඒකට උත්තරයක් දෙනවා.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු සභාපතිතුමනි, ඔබතුමා අවදි කාරක සභාව ගැන මතු කරපු නිසා. මම ඒකේ සාමාජිකයෙක්. කිසිදු දෙයක් එන්නේ නැහැ. මුලින්ම මෙහි කාර්ය භාරය පිළිබඳව සභාපතිවරයා විධියට ගරු මන්ත්‍රීවරු දැනුවත් කරන්නය කියලා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඒක රීති පොතේ තිබෙනවා. පොඩ්ඩක් කියවන්න.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

මම ඒකේ ඉන්නවා. මම කියන්නේ එහි කාර්යය පිළිබඳව තව තවත් ගරු මන්ත්‍රීවරු දැනුවත් කරන්නය කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම හිතන හැටියට ඒ කාරක සභාව බොහොම කාලයකින් රැස් වුණේ නැහැ. ඒ නිසා අපි රැස් වෙමු. අපට මොනවා හරි කරුණු ටිකක් ඒකට එවන්න.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

රැස් වෙන්නේ, ඒකේ දෙන නියෝග ක්‍රියත්මක කරන්නේ නැහැ. ඒකයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා අපට ඒකට මොනවා හරි යොමු කරන්න. අපි ඒ සම්බන්ධයෙන් රැස් වෙලා සාකච්ඡා කරමු. දැන් ගරු විපක්ෂ නායකතුමාගේ ප්‍රශ්නය. ඔබතුමාගේ ප්‍රශ්නය. මුදල් පිළිබඳව අවභාවිතයක් තිබෙන්නේ. වංචාවක් තිබෙන්නේ. එතැනට මේවා එවන්න. අපි සාකච්ඡා කරමු.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

නියෝග ක්‍රියාත්මක වෙන්නේ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ක්‍රියාත්මක වුණු ඒවාත් තිබෙනවා. මට මතකයි, ගම්පහ ශ්‍රී බෝධි ක්‍රීඩාංගණය පිළිබඳ ප්‍රශ්නයේදී ගරු මන්ත්‍රීතුමා අවුරුදු 10 කට කලින් ප්‍රශ්න කළා. වරුණ දීප්ති රාජපක්ෂ ගරු මන්ත්‍රීතුමාත් ඒ කමිටුවේ හිටියා. අන්තිමට ඒ ඉඩමෙන් පස් ඉවත් කරන්න සිද්ධ වුණා. අපි ගත් තීන්දුවට හය වෙලා ක්‍රියාත්මක වුණා. අපි උත්සාහ කරමු. (බාධා කිරීම්) මට මතකයි. ඒ ප්‍රශ්නය. දෙකක් නේ මෙතැන. ගම්පහ ශ්‍රී බෝධි ප්‍රශ්නය වුණේ නිලධාරීන්. ඔතැන දේශපාලන අධිකාරිය සම්බන්ධයකුත් තිබුණා නේ. ඒ නිසා දේශපාලන අධිකාරිය අභිබවා යන්න බැරි මට්ටමක් ඇති වෙන්න ඇති. ඒකයි.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ගරු සභාපතිතුමනි, දේශපාලන අධිකාරිය සම්බන්ධයෙන් නම් අවදි කාරක සභාවට දාන එකේ තේරුමක් නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

තීන්දුව අපි ගන්නවා. එය ක්‍රියාත්මක කරන්නත් අපි ඉස්සරහාට බලමු.

ප්‍රශ්න අංක 03, මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන ඇමැතිතුමාට ඉදිරිපත් කිරීම සඳහා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු සභාපතිතුමනි, ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, ගරු මන්ත්‍රීතුමනි, සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු ඇමැතිතුමනි, විශේෂයෙන් මම මේ ප්‍රශ්නය යොමු කළේ - ඔබතුමා සොයා බලන්න. විශේෂයෙන් ජයවර්ධනපුර කලාපයේ ගුරුවරුන්ට ගැටලුවක් මතු වෙලා තිබෙනවා. මේ කාර්ය සාධන පත්‍රිකාව නොමැති නිසා

වැටුප් වර්ධක නොගෙවන වටපිටාවක්. ඒක වැරැදියි. නීත්‍යානුකූල නැහැ. ඒ නිසා ඒ සම්බන්ධයෙන් සොයා බලන්න. මොකද, සති දෙක වෙන කොටත් ගුරුවරුන් පීඩාවට පත් වෙනවා. ඒ සම්බන්ධයෙන් සොයා බලන්න කියලා ඉල්ලා සිටනවා.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ඔබතුමාට හැකි කමක් තිබෙනවා නම්, පුද්ගලිකවත් මට යොමු කරන්න. මම අවශ්‍ය කටයුතු කරනවා.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ගරු සභාපතිතුමනි, රීති ප්‍රශ්නයක්. මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමා යොමු කරපු ප්‍රශ්නය සම්බන්ධව කථා කරලා ඒ කාරණයට මේ සභාවේ හිටපු අධ්‍යාපන ඇමැතිතුමා හැටියට එකඟත්වයක් දුන්නා, මෙහෙම නිර්දේශයක් අවශ්‍ය නැහැයි කියලා. එය හැන්සාඩ් ගත වෙලා තිබෙනවා. එහෙම නිර්දේශයක් අවශ්‍ය නැහැයි කියලා තිබෙද්දී තමයි මේ ආකාරයට ගුරුවරුන්ගේ වැටුප් වර්ධක සම්බන්ධයෙන් නිර්දේශ ලබා ගන්නේ. එය හැන්සාඩ් ගත වෙලා තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ සම්බන්ධයෙන් මම බලන්නම්. ඒක හැන්සාඩ් වෙලා තිබෙනවා.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ඔව්.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඒ වාගේම ලේකම් මට දැනුම් දීලා තිබෙනවා, ගුරු සංගමයේ ප්‍රධාන ලේකම්වරයා ලෙස. එහෙම අවශ්‍යතාවයක් නැහැයි කියලා. මට මතක හැටියට අරුණ දීපාල් ගරු මන්ත්‍රීතුමා ඒ ලිපිය සභාගත කළා.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

එදා ප්‍රශ්නයට උත්තර දුන්නේ ගරු මහ ඇමැතිතුමා වෙනුවෙන් උදය ගම්මන්පිල හිටපු ගරු ඇමැතිතුමා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ප්‍රශ්න අංක 04. එම ප්‍රශ්නයත් මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන ඇමැතිතුමාට යොමු කිරීමට.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු සභාපතිතුමනි, ප්‍රශ්නය යොමු කරනවා.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, ඒ සඳහාත් සති දෙකක කාලයක් අවසර ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

05 වැනි ප්‍රශ්නය නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍යතුමාට ප්‍රශ්නය ඉදිරිපත් කිරීමේ අවස්ථාව.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු සභාපතිතුමනි, ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

**05.**

**නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/VI(1)/15/31)**

අ. ගොරකපිටිය ප්‍රදේශයේ පිහිටි බීජිං ලංකා කර්මාන්ත ශාලාවේ වර්ග අඩි 37000 ක ගොඩනැඟිලි සැලැස්මක් කැස්බෑව නගර සභාව විසින් එහි නිල කාලය අවසන් වීමට සති කිහිපයකට පෙර 2015.03.04 දින අනුමත කර තිබේද?

ආ. එම ගොඩනැඟිලි සැලැස්ම අනුමත කර දින 14 ක් තුළ අනුකූලතා සහතිකයද නිකුත් කර ඇති බව ඔබතුමා දන්නවාද?

ඇ. මීට වසර කිහිපයකට පෙර අනුමැතියකින් තොරව ඉදිරිපත් කර ඇති මෙම ගොඩනැගිල්ල සඳහා පසුව වංචනික ලෙස අනුමැතිය ලබා දීම හේතුවෙන් ප්‍රාදේශීය සභාවට සිදුව ඇති අලාභය කොපමණද?

ඈ. මේ ආකාරයට අයථා ලෙස අනුමැතිය ලබා දීමට කටයුතු කළ නිලධාරීන් සම්බන්ධව ගන්නා ක්‍රියා මර්ගය කුමක්ද?

ඉ. මේ සම්බන්ධව පළාත් පාලන කොමසාරිස් විසින් ගෙන ඇති පියවර කවරේද?

**ගරු ඉසුර දේවප්‍රිය** (ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බල ශක්ති, පරිසර කටයුතු, ජල සම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමා)
Hon. Isura Devapriya (Chief Minister and Minister of Finance and Planning, Engineering Services, Law and Order, Local Government and Provincial Administration, Economic Promotion, Electricity and Energy, Environmental Affairs, Water Supplies and Drainage and Tourism Affairs)

අ. ඔව්

ආ. ඔව්

ඇ. මේ සම්බන්ධයෙන් සිදු කරන ලද පරීක්ෂණ මෙතෙක් අවසන් වී නොමැති බැවින් අලාභය සම්බන්ධයෙන් නිශ්චිතව ප්‍රකාශ කළ නොහැක.

ඈ. පරීක්ෂණය අවසන් වීමෙන් අනතුරුව තීරණය කළ යුතුව ඇත.

ඉ. කරුණට අදාළව 2015.08.27 දිනෙන් පරීක්ෂණ ආරම්භ කර ඇත. ඔබතුමාගේ ප්‍රශ්නයට සාධාරණත්වයක් ඉටු වනු ඇත.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

හොඳමයි ගරු ප්‍රධාන ඇමැතිතුමනි. දින 14 ක් ඇතුළත වර්ග අඩි 37,000 ක ගොඩනැගිල්ලක් හදන්න ඒ මහා ආශ්චර්යය කරපු අයට බස්නාහිර පළාත් සභාවෙන් සම්මානයක් ලබා දෙන්නත් කටයුතු කරන්නය කියලා ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ප්‍රශ්න අංක 06. ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන ඇමැතිතුමාට ප්‍රශ්නය ඉදිරිපත් කිරීමේ අවස්ථාව.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු සභාපතිතුමනි, ප්‍රශ්නය යොමු කරනවා.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු මන්ත්‍රීතුමා, බොහොම ස්තූතියි. මම අලුත් අධ්‍යාපන ඇමැති නිසාවෙන් සති දෙකක කාලයක් ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ප්‍රශ්න අංක 07. සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන ඇමැතිතුමාට යොමු කිරීමට අවස්ථාව.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, ප්‍රශ්නය යොමු කරනවා.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු මන්ත්‍රීතුමා, බොහොම ස්තූතියි. මම අලුත් අධ්‍යාපන ඇමැති නිසාවෙන් සති දෙකක කාලයක් ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, මේක නිකන් වෛරස් එක වාගේ පැතිර යනවා. මොකද, මේ වාර්තා හදන්නේ මේ ඇමැතිවරු නොවෙයි. මේ ඇමැතිවරුන්ට ඕවා ගැන තේරුමක් නැහැ. ඇත්ත කියනවා නම්. අපි ඉල්ලීමක් කරනවා. නිලධාරීන් ඉන්නේ ඒවා කරන්න.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

එහෙම කියන්න එපා. ඔබතුමා කොහොමද එහෙම කියන්නේ?

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

හැමෝම මේක -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

විවාදවලට යන්න දෙන්න බැහැ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

අපි සෑහෙන කාලයක් ලබා දීලා තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා කරුණාකර වාඩි වෙන්න. විවාදවලට යන්න දෙන්න බැහැ. මේ ප්‍රශ්න ඉදිරිපත් කිරීමේ අවස්ථාව.

ප්‍රශ්න අංක 08, මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන ඇමැතිතුමාට ප්‍රශ්නය යොමු කිරීමේ අවස්ථාව.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු සභාපතිතුමනි, ප්‍රශ්නය යොමු කරනවා.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු මන්ත්‍රීතුමා, සමාවෙන්න. අලුත් අධ්‍යාපන ඇමැති නිසා සති දෙකක් කාලය ඉල්ලා සිටිනවා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු ඇමැතිතුමා, නිලධාරීන් ඉන්නේ මොකටද දන්නේ නැහැ.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

මොකක්ද?

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඔබතුමාට ප්‍රශ්නවලට උත්තර හදා දෙන්න ඕනෑ නිලධාරීන් නේ?

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

මම සුපුරුදු පරිදි අපේ අධ්‍යාපන අමාත්‍යාංශයේ - වැඩිමනක් උත්තරයක් දෙන්නේ. අවසර දෙනවා නම් විතරක්. මොකද, අධ්‍යාපන අමාත්‍යාංශය තිබුණේ ශ්‍රාවස්ති මන්දිරයේ. ඉතින් අපට එතැන ඉඩකඩ නොලැබුණ නිසාවෙන් අපි වෙනත් ගොඩනැඟිල්ලකට ගිහිල්ලා, ඒ ගොඩනැඟිල්ල වෙනම සකස් කර ගෙන, වෙනම අවශ්‍ය ඩෙස් පුටු අරගෙන ගිහිල්ලා මේ දවස් ටිකේ මහන්සි වුණා. කලින් තිබුණේ අධ්‍යාපන අමාත්‍යාංශයයි මහ ඇමැතිතුමායි එකට. ඒ Staff එකත් එකට. කාර්ය මණ්ඩලය එකට. අපි ඒවා ප්‍රධාන ලේකම්තුමියට ඉදිරිපත් කරලා, සාකච්ඡා කරලා, අපේ කාර්ය මණ්ඩලය වෙන් කර ගෙන, ෆයිල් පවා ලොරිවල දාගෙන ඇවිල්ලා සකස් කරමින් මේ දවස් කීපය තුළ ඒ කටයුතු සිද්ධ කරන්න වුණා. ඒ නිසාවෙන් තමයි මේ ප්‍රමාදය ඇති වෙන්නේ. බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හැබැයි, ඊළඟ සභාවට නම් එතුමාට අලුත් අධ්‍යාපන ඇමැතිතුමා කියන්න බැහැ. මේ පාර විතරක් අපි එතුමාට අවස්ථාව දෙමු. ඊළඟ පාර එතුමා පැහැදිලිව උත්තර දෙයි.

මීළඟට ප්‍රශ්න අංක 09 යටතේ රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමිය විසින් සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුබසාධන ගරු අමාත්‍යතුමාට ප්‍රශ්නය යොමු කිරීමේ අවස්ථාව.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු සභාපතිතුමනි, ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

**09.**

**රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමිය විසින් ගරු සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/VI(1)/15/35)**

අ. බස්නාහිර පළාත් සභාව මගින් පාලනය වන මහල් 06 කින් යුත් මීගමුව රෝහල් ගොඩනැගිල්ල කඩා ඉවත් කිරීමට නිර්දේශ වී තිබේද?

ආ. එකී ඉවත් කරන ගොඩනැගිල්ල වෙනුවට නව ගොඩනැගිල්ලක් ඉදි කිරීමට නිර්දේශ කර තිබේද?

ඇ. එවැනි නව ගොඩනැගිල්ලක් ඉදි කිරීමට මධ්‍යම රජයේ සෞඛ්‍ය ඇමැතිවරයා විසින් රුපියල් මිලියන 500 ක් ලබා දීමට එකඟවීද?

ඈ. එකී ගොඩනැගිල්ල ඉදි කිරීමට සැලැසුම් සකස් කර තිබේද?

ඉ. එකී ගොඩනැගිල්ල ඉදි කරන තෙක් රෝගීන් මුහුණ දෙන ප්‍රශ්න විසඳීමට ගෙන ඇති පියවරයන් කවරේද?

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ -** අමාත්‍යතුමා
Hon. Nishantha Sriwaranasinghe - Minister

අ. නැත. උක්ත ගොඩනැගිල්ලේ ස්ථායීත්වය සම්බන්ධයෙන් මොරටුව විශ්ව විද්‍යාලයේ සිවිල් ඉංජිනේරු අංශය හා පරමාණුක බලශක්ති අධිකාරිය එක්ව පරීක්ෂණයක් පවත්වන ලද අතර ගොඩනැගිල්ලේ පදනම ශක්තිමත් බවත්, ගොඩනැගිල්ල ප්‍රතිස්ථාපනය කර භාවිතයට ගත හැකි බවටත් නිර්දේශ ලබා දී ඇත.

ආ. නැත. සත් මහල් ගොඩනැගිල්ලේ ප්‍රතිස්ථාපන කටයුතු මොරටුව විශ්ව විද්‍යාලයේ සිවිල් ඉංජිනේරු අංශයේ නිර්දේශ මත දැනටමත් ආරම්භ කර ඇති අතර ඊට සමගාමීව තාවකාලික ගොඩනැගිලි ඉදි කරමින් පවතී.

ඇ. නව ගොඩනැගිල්ලක් සඳහා නොව සත් මහල් ගොඩනැගිල්ලේ ප්‍රතිස්ථාපන කටයුතු සඳහා රුපියල් මිලියන 300 ක් හා තාවකාලික ගොඩනැගිලි ඉදි කිරීම සඳහා රුපියල් මිලියන 200 ක් ලබා දීමට මධ්‍යම රජයේ සෞඛ්‍ය අමාත්‍යවරයා විසින් එකඟතාව ලබා දී ඇත.

ඒ අනුව, අමාත්‍ය මණ්ඩල සංදේශයක් හරහා ලබා ගත් තීරණයක් මත මධ්‍යම රජයේ සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් රුපියල් මිලියන 500 ක මුදලකට ගොඩනැගිල්ලේ ප්‍රතිස්ථාපන කටයුතු හා රෝහල් භූමියේ තාවකාලික ගොඩනැගිලි ඉදි කිරීම සඳහා රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව වෙත පවරා ඇත.

ඈ. තාවකාලික ගොඩනැගිලි 04 ක් ඉදි කරමින් පවතින අතර එයින් 03 ක වැඩ අවසන් අදියරේ පවතී. එමෙන්ම සත්මහල් ගොඩනැගිල්ලේ අලුත් වැඩියා කටයුතු ද ආරම්භ කර ඇත.

ඉ. i. දැනට රෝහලේ ඇති අනෙකුත් ගොඩනැගිලි භාවිත කර රෝගී සත්කාරක සේවා අපහසුවකින් තොරව ඉටු කිරීමට කටයුතු කර ඇත.

ii. අත්‍යවශ්‍ය එක්ස්-රේ පරීක්ෂණ හා ශල්‍යාගාර පහසුකම්, දැඩි සත්කාර පහසුකම් ආසන්න පරිබාහිර ආයතන වෙතින් ඉටු කර ගැනීමට කටයුතු කර ඇත.

iii. එමෙන්ම රෝහල් භූමියේ ඉදි කරමින් පවතින තාවකාලික ගොඩනැගිලි තුළ, ශල්‍යාගාර පහසුකම් හා වාට්ටු සඳහා පහසුකම් සලසා ඇති බැවින් කඩිනමින් රෝගී සත්කාරක සේවා සඳහා එමගින් අවස්ථාව සලසා ගත හැකිය.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු සභාපතිතුමනි, වර්ෂ 10 ක් වාගේ ආසන්න කාලයක් තුළ දී මහල් හයකින් යුත් මෙවැනි ගොඩනැගිල්ලක් මේ මිලියන 200 ක වියදමින් ප්‍රතිසංස්කරණය කිරීමට සිදුව ඇති හේතුව කවරේද?

ඊළඟ ප්‍රශ්නය, මෙම ගොඩනැගිල්ලේ ගෙවීම් සඳහා අනුමැතිය දුන් ඒ නිලධාරීන් කවුද කියන එක සොයා බලා තිබේද? එම අනුමැතිය දීම්වලදී යම්කිසි අකටයුත්තක්, අක්‍රමිකතාවයක් සිදු වී තිබේ නම් ඒ සම්බන්ධයෙන් යම් පියවරක් ගැනීමට අමාත්‍යතුමා කටයුතු කරන්නේද?

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ -** අමාත්‍යතුමා
Hon. Nishantha Sriwaranasinghe - Minister

ගරු මන්ත්‍රීතුමිය, ඔබතුමිය විසින් යොමු කරන ලද මේ ප්‍රශ්න සම්බන්ධයෙන්, මීගමුව දිස්ත්‍රික් රෝහලේ ඒ සත් මහල් ගොඩනැගිල්ලේ වර්තමාන තත්ත්වය පිළිබඳව මම අධ්‍යයනය කරමින් තිබෙන්නේ. ඉදිරියේදී ඒ පිළිබඳව සොයා බලලා මේ සභාවට පිළිතුරක් සපයන්න බලාපොරොත්තු වෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ප්‍රශ්න අංක 10. සුනිල් ජයමිණි ගරු සභා නායකතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍යතුමාට ප්‍රශ්නය යොමු කිරීමේ අවස්ථාව.

**ගරු සුනිල් ජයමිණි - සභා නායකතුමා**
Hon. Sunil Jayamini - Leader of the House

ගරු සභාපතිතුමනි, ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

මහින්දගේ කණ්ඩායමයි, මෛත්‍රීගේ කණ්ඩායමයි -

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

නැහැ, එහෙම කණ්ඩායම් නැහැ. ඉතා වගකීමෙන් කියන්න ඕනෑ. ඒ කණ්ඩායම් ගිය මාසයේ අට වැනිදායින් පස්සේ ඉවරයි. කාටවත් එහෙම කණ්ඩායම් හදන්නත් බැහැ. විශේෂයෙන් එක්සත් ජාතික පක්ෂයේ විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාට එහෙම කල්ලියක් හදන්නත් බැහැ. දැන් ඔක්කෝම ඉන්නේ ඉසුර දේවප්‍රියගේ කණ්ඩායම විතරයි.

## 10.

**සුනිල් ජයමිණි - ගරු සභානායකතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/VI(1)/15/31)**

අ. කැස්බෑව නගර සභාවේ වර්තමාන ලේකම්වරිය 2015.09.20 දින වන විට වසර 60 ඉක්ම වූ සේවකයන් 04 දෙනෙකු රාජ්‍ය පරිපලාන චක්‍රෙල්ඛනවලට පරිබාහිරව සේවයේ යොදා ඇති බව ඔබතුමා දන්නෙහිද?

ආ. මෙම සේවකයන් බඳවා ගැනීම එතුමියගේ තනි කැමැත්ත මත සිදු වී ඇති බව ඔබතුමා දන්නේද?

ඇ. මෙම කරුණ සම්බන්ධව ලේකම්වරියට එරෙහිව විනය ක්‍රියා මාර්ගයක් ගන්නේද?

ඈ. නොඑසේ නම් ඒ මන්ද?

ඉ. වසර 60 ඉක්ම වූ සේවකයන් සේවයෙන් ඉවත් කිරීමට ඔබතුමා කටයුතු කරන්නේද?

ඊ. නොඑසේ නම් ඒ මන්ද?

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

අ. ඔව්

ආ. නැත

ඇ. මූලික විමර්ශනයක් පැවැත් වීමෙන් අනතුරුව ඒ පිළිබඳව තීරණය කරනු ලැබේ.

ඈ. අදාළ නොවේ.

ඉ. ඔව්

ඊ. අදාළ නොවේ.

ගරු සභාපතිතුමනි, දැන් මේ පිළිතුරු කෙසේ ඉදිරිපත් කළත් විෂයය භාර ඇමැතිවරයා හැටියට මට පෙනී ගිය පරිදි තණකොළ කපන එක්කෙනා හැර අනික් සියලු දෙනාම අයින් කරන්න මම කටයුතු කරනවා.

**ගරු සුනිල් ජයමිණි - සභා නායකතුමා**
Hon. Sunil Jayamini - Leader of the House

ගරු සභාපතිතුමනි, ලේකම්තුමිය කටයුතු කරලා තිබෙන්නේ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට විරුද්ධව.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර සභාව නිශ්ශබ්ද වන්න. අනවශ්‍ය සාකච්ඡා වැඩියි. බාධා කිරීම් වැඩියි. ඔබතුමා කියපු එක මට ඇහුණේ නැහැ. සභාවට ඇහෙන්නෙත් නැහැ.

**ගරු සුනිල් ජයමිණි - සභා නායකතුමා**
Hon. Sunil Jayamini - Leader of the House

ගරු සභාපතිතුමනි, ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ පිළිතුර පිළිබඳව මම සෑහීමකට පත් වෙනවා. නමුත් මේ කැස්බෑව නගර සභාවේ ලේකම්තුමිය කටයුතු කරන්නේ

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛන සහ අනිකුත් විනයානුකූල චක්‍රලේඛන සියල්ලට විරුද්ධව. ඉතින් ඒ නිසා තමයි මම මේ ප්‍රශ්නය ඇහුවේ. දැනටත් මේ සේවකයන් ඉන්නවා. ඒ නිසා ගරු ප්‍රධාන ඇමැතිතුමනි, තමුන්නාන්සේ මේ සම්බන්ධව කඩිනම් පියවරක් අරගෙන අදාළ නොවන සේවකයන් ඉවත් කරන්න කටයුතු කරන්නය කියලා ඉල්ලා සිටිනවා.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. ඔබතුමාගේ අවධානය යොමු කරනවා,පළාත් සභාවේ වරප්‍රසාද රීති අංක 36(1), 36(3) සහ 36(4) කියන වගන්තිවලට. ගරු සභාපතිතුමනි, මෙම වරප්‍රසාද ප්‍රශ්නය මතු කරන්නේ පළාත් සභාවේ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු විධියට කටයුතු කරද්දී අපට ඇති වෙලා තිබෙන - වැඩ කර ගෙන යාමේ ප්‍රශ්නයක් සම්බන්ධයෙන් ඇති වෙලා තිබෙන තත්ත්වයක් පිළිබඳව ඔබතුමාගෙන් පැහැදිලි කර ගෙන, ඔබතුමා යටතේ පිළිතුරක් අපේක්ෂාවෙන්.

ගරු සභාපතිතුමනි, මේ මාසයේ 01 වැනිදා ආණ්ඩු පක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායක සුමිත් ලාල් මැන්දිස් මැතිතුමා වැඩ භාරගන්න උත්සවයේදීත්, ඒ වාගේම ඊට කලින් පළාත් සභාවේ මාර්ග සංවර්ධන අධිකාරියේ සභාපතිවරයා වැඩ භාර ගන්න උත්සවයේදීත් බස්නාහිර පළාත් සභාවේ විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා, ගරු යූ. ජෝර්ජ් පෙරේරා මැතිතුමා කථාවක් කරමින් කියා තිබෙනවා - අවස්ථා දෙකේදීම. ආණ්ඩු පක්ෂයේ 28 දෙනෙක් ඉන්නේ එතුමා එක්කයි. ඒ 28 දෙනාගේ සහයෝගයෙන් එතුමාට පුළුවන් පළාත් සභාවේ බලය අල්ලන්න කියලා. ගරු සභාපතිතුමනි, අපි ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. ඒ ප්‍රකාශය හරහා ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු සියලු දෙනාගේ වරප්‍රසාද උල්ලංඝණය වෙලා තිබෙනවා. මොකද, කවුද ඒ මන්ත්‍රීවරු කියන කාරණය මේ සභාවට දැනගන්න ඕනෑ. ආණ්ඩු පක්ෂය ඇතුළේ අපේ ගරු ප්‍රධාන ඇමැතිතුමා දැන් කිව්වා, එහෙම කණ්ඩායම් බෙදීම් නැහැ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ආරංචි නේ කියන්නේ.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ආණ්ඩු පක්ෂය එක කණ්ඩායමක් විධියට වැඩ කරන්නේ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

වරප්‍රසාද ප්‍රශ්න ලෙස කේලම් කියන්න බැහැ.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

එහෙම 28 දෙනෙක් ඉන්නවා නම්, එතුමාට දිවුරුම් ප්‍රකාශ ඉදිරිපත් කරලා තිබෙනවා නම් ඒ 28 දෙනා -

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු සභාපතිතුමනි, මේවා වරප්‍රසාද ප්‍රශ්න නොවෙයි. මේ ආරංචි කියන්නේ.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, මේක ආරංචියක් නොවෙයි.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ආරංචි කියන්න බැහැ.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, මේක ආරංචියක් නොවෙයි. ආණ්ඩු පක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා වැඩ භාර ගන්න කොට මම හිටියා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර සභාව නිශ්ශබ්ද වන්න.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, මේක ආරංචියක් නොවෙයි. ආණ්ඩු පක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා වැඩ භාර ගන්න උත්සවයේ මම සිටියා. ඒ නිසා කවුරු හරි දිවුරුම් ප්‍රකාශ

දීලා, 28 දෙනෙක් ගරු මන්ත්‍රීවරු එතුමාට සහතිකයක් දීලා තිබෙනවා නම් මෙහෙම අපි සහයෝගය දෙනවා කියලා. කරුණාකර මේ සභාවට දිවුරුම් ප්‍රකාශ ඉදිරිපත් කරන්න. ඒ 28 දෙනා කවුද කියලා හෙළිදරව් කරන්න. නැත්නම් මේ ඉන්න ගරු මන්ත්‍රීවරු සියලු දෙනාට ප්‍රශ්නයක් මතු වෙලා තිබෙනවා, කවුද ඒ 28 දෙනා කියලා දැනගන්න. ඒ නිසා එහෙම ප්‍රකාශ කරලා මේ මහ ඇමැතිතුමාව භය කරලා, නැත්නම් මහ ඇමැතිතුමාට වෙන අල්ලසක් දීලා, මහ ඇමැතිතුමාගෙන් වැඩ ගන්න උත්සාහ කරනවා නම්, -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

මහ ඇමැති අල්ලස් ගන්න කෙනෙක් නොවෙයි. අපි දන්නවා ඒක.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ඒක වළක්වන්න කටයුතු කිරීම සඳහා, කවුද ඒ 28 දෙනා. එහෙම 28 දෙනෙක් ඉන්නවාද? ඒ 28 දෙනා කවුද කියන කාරණය මේ සභාවට පැහැදිලි කරන්න කියන ඉල්ලීම කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා, කාරණය පැහැදිලියි.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

පොඩ්ඩක් ඉන්න. වෙලාවට පෙන්වන්නම්.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු සභාපතිතුමනි, ආරංචි කියන්න බැහැ.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ගරු සභාපතිතුමනි, මහ ඇමැතිතුමාට අල්ලස් දීලා කියලා කිව්වා. ඒක වැරැදි කථාවක්.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ඕනෑ කෙනෙකුට ලියුමක් දෙන්න අයිතියක් තිබෙනවා.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera - Chief Opposition Whip

ගරු සභාපතිතුමනි, 36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක්. මගේ නම ප්‍රකාශ වුණා නේ? මම ඇත්ත කියන්න ඕනෑ නේ ගරු සභාපතිතුමනි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා කෙටියෙන් කියන්න.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera - Chief Opposition Whip

කෙටියෙන් කියන්නම්. ගරු සභාපතිතුමනි, මම මේ උත්සව දෙකට සහභාගි වුණා. ගිහිල්ලා අම්ජාඩ් මැතිතුමාගේ උත්සවයේදී මම ප්‍රකාශ කළේ - ගරු විපක්ෂ නායකතුමාටත් මම කිව්වා. අපේ කණ්ඩායමේ 28 දෙනෙක් ඉන්නවා. මේක වරදවා තේරුම් ගන්න එපා. හැබැයි, කොඩිකාර ඇමැතිතුමා වාගේ කණ්ඩායමකුත් ඉන්නවා. නමත් කියලා කිව්වේ. කොඩිකාර ඇමැතිතුමා කියලා. ඉතින් ඒක අනික් පැත්තට හරවාගෙන එතුමන්ලාගේ ප්‍රශ්නයක් මෙතැනට ගන්නේ ඇයි කියලා මට තේරෙන්නේ නැහැ. ඇත්තටම ගරු සභාපතිතුමනි, මේක එතුමන්ලාගේ ප්‍රශ්නයක්. අපේ කණ්ඩායමේ 28 ක් ඉන්නවා. අපේ කණ්ඩායමේ 28 යි. ඒකයි. හැබැයි, කොඩිකාර හිටපු ගරු ඇමැතිතුමාගේ නම මම කිව්වා. ඒ රැස්වීමේදීම කොඩිකාර ඇමැතිතුමා මම රාජපක්ෂ ජනාධිපතිතුමාගේ ඇමැතියි කියලා නැඟිටලා කිව්වා. එතුමා නැඟිටලා කිව්වා. නැහැයි කියන්න බැහැ. ඒක නැහැයි කියන්න බැහැ. ඒක මාධ්‍යයේ යන්න ඕනෑ. මාධ්‍යයේ ගියා. ඒකට උත්තරයක් මම දුන්නේ, මගේ කථාවේදී.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. හරි.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු සභාපතිතුමනි,

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

විවාදයකට යන්න දෙන්න බැහැ. හිටපු ගරු ඇමැතිතුමා, කරුණාකර ඔබතුමා වාඩි වෙන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මගේ නම කියලා කථා කළා. මගේ නම සඳහන් කරපු නිසා මම මගේ ප්‍රකාශය කරන්න ඕනෑ.මම එක්සත් ජනතා නිදහස් සන්ධානයේ අපේක්ෂයෙක් හැටියට තමයි තරග කළේ. ඒ තරග වදින වේලාවේ මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා පක්ෂයේ නායකත්වය දැරුවේ. එතකොට එතුමා දැන් මේ වන විට පක්ෂයේ උපදේශක කෙනෙක් හැටියට කටයුතු කරන්නේ, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ. මම මහින්ද රාජපක්ෂගේ උපදේශකත්වය තිබෙන ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ඉන්නවා. ඒකයි තිබෙන ප්‍රශ්නය. එහෙම නැතිව මගේ එහෙම මොකුත් ප්‍රශ්නයක් නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි, හරි. පැහැදිලියි.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

අන්න ඇමැතිවරු.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

දැක්කද? මුට්ටි අල්ලන්නේ නැහැ. පැරදුණත් ඉන්නවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මීළඟට අමාත්‍යාංශ නිවේදන හා අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ සඳහා අවස්ථාව තිබෙන්නේ.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera - Chief Opposition Whip

ගරු සභාපතිතුමනි, මට 36(1) යටතේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා දැන් කිව්වා නේ?

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera - Chief Opposition Whip

තව තියෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අනේ දිගින් දිගටම කියන්න ගියොත් කාලය යනවා නේ.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera - Chief Opposition Whip

ගරු ප්‍රධාන ඇමැතිතුමාට චෝදනා කරන්නේ. ගරු ප්‍රධාන ඇමැතිතුමනි, ගරු සභාපතිතුමනි, එතුමාගේ අවධානය යොමු කරවන්න. ගරු සභාපතිතුමනි, මම දැක්කා ඊයේ පෙරෙයිදා පුවත්පතක -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාගේ වරප්‍රසාද කඩවීමක්ද තිබෙන්නේ?

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera - Chief Opposition Whip

ගරු ප්‍රධාන අමාත්‍යතුමා උත්සව කිහිපයකදී කියලා තිබෙනවා, එතුමා සහභාගි වන උත්සවවලට වෙන මන්ත්‍රීවරු සහභාගි කරවන්න එපා කියලා. මම දන්නේ නැහැ, කොළඹ දිස්ත්‍රික්කයට අදාළ දෙයක්ද? නැත්නම් කොඩිකාර මැතුමාට වුණු දෙයක්ද කියලා. ඒක අපටත් බලපානවා. අපිත් මන්ත්‍රීවරු. අපිත් යහපාලනයත් එක්ක යන්නේ. නිලධාරීන්ට චක්‍රව කියනවා, එතුමා සහභාගි වන රැස්වීම්වලට අපට කියන්න එපාය කියලා. චක්‍රව කියනවා, එක්සත් ජාතික පක්ෂයේ අයට කියන්න එපා. මම දන්නේ නැහැ, මේකේ ඇත්ත නැත්ත. පුවත්පත්වල තිබෙනවා. මෙතුමා දන්නවානේ එහෙම වුණා කියලා. එතුමාගෙන් අහනවා, මේක සියලුම ගරු මන්ත්‍රීවරුන්ට දුන්න උපදෙසක්ද? නැත්නම් නිලධාරීන්ට දුන්න උපදෙසක්ද? නැත්නම් කොඩිකාර හිටපු ඇමැතිතුමාට දුන්න එකක්ද? නැත්නම් කොළඹ දිස්ත්‍රික්කයට පමණක්ද කියන එක තමයි මට ගරු සභාපතිතුමා මාර්ගයෙන් ගරු ප්‍රධාන අමාත්‍යතුමාගෙන් දැන ගන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම දන්නේ නැහැ ඒක. ඒක එතුමාගේ ප්‍රකාශයක් නේ? එතුමා මොනවා කියයිද කියලා මම දන්නේ කොහොමද?

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ගරු සභාපතිතුමාගේ අවසරය ලැබෙනවා නම්, එය පැහැදිලි කරන්න විනාඩියක් යයි. මට ගාමිණී තිලකසිරි ගරු ඇමැතිතුමාත් කිව්වා. මම ඒක කිව්වේ, කාරණාවක් උඩ. අපි මේ මහ ඇමැතිවරු වුණේ ගිය මාසයේ අට වැනිදා නේ? එතකන් අපි අවුරුදු 16 ක් පළාත් සභා මන්ත්‍රීවරු හැටියට සිටියේ. දැන් Sport Meet එකක් උදාහරණයට ගන්න. මම දැකලා තිබෙනවා, අපේ පළාත් සභාවේ ඇමැති එනවා. පළාත් සභා මන්ත්‍රීවරුත් එනවා. නමුත් ප්‍රධාන ආරාධිත අමුත්තා හැටියට ආරාධනා කරලා තිබෙන්නේ කාටද? නගරාධිපති කෙනෙක්ට. හරිද?

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

නැත්නම් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ කෙනෙක්ට.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ඉන්න. ඉන්න. කියන්න. මේ ළඟදී මට මහරගම අපේ ඉස්කෝලයකින් ආරාධනා පත්‍රයක් අවා. අපේ කලාපයේ ඉන්න ගුරුවරයෙක්. එයා තමයි Chief guest. එතකොට පළාත් මන්ත්‍රීවරු ඉන්නේ සහභාගීත්වයට. අපව පැත්තකින් තියන්න කෝ. කලාප අධ්‍යක්ෂක ඉන්න ඕනෑ කොතැනද? (බාධා කිරීම්) පොඩ්ඩක් ඉන්න කෝ. මම ඔක්කොම වෙනුවෙන්නේ කථා කරන්නේ. එතකොට කලාප අධ්‍යක්ෂක ඉන්නේ මුල්ලක. හරිද? මම නම් පළාත් සභා මන්ත්‍රී කෙනෙක් හැටියට මට ගෞරවයක් නොවන අවස්ථාවක මම සහභාගි වෙලා නැහැ. මට ඒක දරාගන්න පුළුවන්කම - දැන් මම මහ ඇමැති වෙලා මොකද කරන්නේ? මම ඒක පැහැදිලි කරලා කිව්වා. නමුත් මම කිව්ව එක නොවෙයි, පුවත්පත්වල පළ වෙලා තිබෙන්නේ. මමඔබතුමන්ලාට, විශේෂයෙන්ම අපේ පළාත් අධ්‍යක්ෂතුමා මගින් - මොකද, මම හිතන්නේ කවුරුත් ඒකට විරුද්ධ වන කාරණාවක් නොවෙයි. අපේ පළාත් පාලන කොමසාරිස් මගින් ඒ අදාළ පළාත් පාලන ආයතනවලත්, අධ්‍යාපන අමාත්‍යාංශයටත්, අනිකුත් ගරු ඇමැතිවරුන්ට මම කියන්න කැමැතියි. තමුන්නාසේලාගේ බලතල තිබෙන අමාත්‍යාංශවල ප්‍රධාන නිලධාරීන්ට මේ කාරණය අවධාරණය කරලා, ඒ සියලුම නිලධාරීන්ට චක්‍රලේඛයක් වශයෙන් දැනුම් දීමක් කරන්න. මම කියලා තිබෙන්නේ, අපව ගේනවා නම් - දැන් chief Minister උත්සවයකට ගෙනල්ලා මේ මන්ත්‍රීවරු හත් අට දෙනෙක් කථා කළාම වැඩක් තිබෙනවාද? අපි අකැමැත්තෙන් හරි පිළිවෙළක් මේ පළාත් සභාවේ හදා ගන්න ඕනෑ. දැන් පසුගිය කාලයේ ප්‍රොටෝකෝල් එකේ ගරු සභාපතිතුමා කොහෙද ඉන්නේ? සභාපතිතුමා ඉන්නේ ඇමැතිවරුන්ට උඩින්. නමුත් උත්සවවලදී ඔබතුමා ඉන්නේ කොහේද? පළාත් සභා මන්ත්‍රී ළඟ. නැද්ද මම කියන්නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒවා තිබෙනවා.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ඒක නිසා මේ හැම එකක්ම පිළිවෙළට මේ සභාවේ හදා ගන්න ඕනෑ. ඒ නිසා මම ස්තුතිවන්ත වෙනවා, එහෙම ගැටලුවක්, කාට හරි හිත් අමාරුවක් ඇති වුණොත් මට කථා කරලා අහන්න. මොකද, මම ඔබතුමන්ලාට කියනවා. අපේ ගරු ඇමැතිතුමාත් ඉන්නවා. අපි පිළිවෙළකට වැඩක් කර ගෙන යමු. බොහොම ස්තුතියි.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු සභාපතිතුමනි,

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අනේ, අපේ හිටපු ගරු ඇමැතිතුමා, මට දිගින් දිගටම දෙන්න බැහැ. මට න්‍යාය පත්‍රයට යන්න බැහැ. ඔබතුමා වාඩි වෙන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මගේ වරප්‍රසාද ප්‍රශ්නයක්.

[සභාවේ සෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට අවස්ථාව දෙන්නම්. කෙටියෙන් කියන්න කෝ.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මට 36(1), 36(2), 36(3) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. අපේ ගරු මහ ඇමැති ඉසුර දේවප්‍රිය මැතිතුමා ගිය සතියේ තිබුණු ස්වර්ණවාහිනී වැඩ සටහනකදී, දවස වැඩ සටහන යටතේ මෙතුමා සහභාගි වෙලා ප්‍රකාශ කළා. කොළඹ දිස්ත්‍රික්කයේ මම අපේක්ෂයෙක් හැටියට තරග කරලා පසුගිය මැතිවරණයෙන් ගත්ත මනාප සංඛ්‍යාවට වඩා අඩුවෙන් එහිදී ප්‍රකාශ කළා. ඉන් මට ඡන්දය දීපු මිනිස්සුන්ට මට -

[සභාවේ ඝෝෂා]

පොඩ්ඩක් ඉන්න කෝ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අනේ හිටපු ගරු ඇමැතිතුමා, අපේ වෙන රැස්වීම් තිබෙනවා නේ. වරප්‍රසාද ප්‍රශ්නයක් නොවෙයි.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා - විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා**
Hon. U. George Perera - Chief Opposition Whip

මේවා කණ්ඩායමේදී කථා කරන්න ඕනෑ ඒවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

වරප්‍රසාද ප්‍රශ්න කියලා ඔය වාගේ ප්‍රශ්න මෙතැනට ගේන්න එපා. කණ්ඩායම් රැස්වීම ඊයේ තිබුණා. ඔබතුමාට කථා කරන්න තිබුණා නේ.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මම -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මට ඕවාට අවසර දෙන්න බැහැ.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මනාප 47121 ක් අරගෙන තිබෙනවා. ඒ මාධ්‍ය ප්‍රකාශයේදී එතුමා කිව්වා මම ඡන්ද 42000 ක් තමයි අරගෙන තිබෙන්නේ කියලා. එතකොට මට ඡන්දය දීපු කොළඹ දිස්ත්‍රික්කයේ ජනතාවටත්, මාව පත් කරපු අයටත් ඒක අසාධාරණයක් වෙලා තිබෙනවා. පළාත් සභා මන්ත්‍රීවරයෙක් හැටියට, හිටපු ඇමැතිවරයෙක් හැටියට ඒ අසාධාරණය ඔබතුමා මගින් නිවැරැදි කරන්න ඕනෑ, ඒ මාධ්‍ය ආයතනය හරහා. මගේ වරප්‍රසාදයක් කඩ කිරීම නිසා, මම ගරු මහ ඇමැතිතුමාටත් මේ වේලාවේ කියනවා. අපේ හිත දිනාගෙන වැඩ කරන්න. මාධ්‍යවලට ගිහිල්ලා මේ ප්‍රකාශ කරන කොට අපි මේ සභාවේ මන්ත්‍රීවරු. හරි. අපෙත් හිත් දිනාගෙන වැඩ කටයුතු කරන්නය කියලා මම ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, පැහැදිලියි. ඔබතුමා මේ වරප්‍රසාද ප්‍රශ්න කියලා, ඕවා මෙතැනට ගෙනෙන්න ඕනෑ ප්‍රශ්න නොවෙයි. ඊයේ අපේ කණ්ඩායම් රැස්වීමේදී ඔබතුමාට මේ ගැන කථා කරන්න තිබුණා. ඊයේ සවස. අනික් එක විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලා ඔබතුමාව වූන් කරනවා. ඕවාට අහු වෙන්න එපා.

# පෞද්ගලික පැහැදිලි කිරීම්
## PERSONAL EXPLANATIONS

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ගරු සභාපතිතුමනි, අළුබෝමුල්ල එස්. මහින්ද මහ විද්‍යාලයේ තාක්ෂණාගාරය 2014.05.22 වැනිදා විවෘත කරනු ලැබුවා. ඒ විවෘත කරනු ලැබුවායින් පස්සේ - මම කියන්න යන්නේ, අපි පාසල් පද්ධතිය තුළ ඉදි කරන ගොඩනැගිලි සම්බන්ධව මෙයිට වඩා දැඩි අවධානයක් යොමු කරන්න ඕනෑ. 2014.05.22 වැනි දින විවෘත කරපු ගොඩනැගිල්ල අද වන විට ගරු සභාපතිතුමනි, සිවිලින් කඩා වැටිලා. පැහැදිලිවම ළමයින්ව ඒ ස්ථානයට යවන්න බැරි අනාරක්ෂිත තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. අද උදේ මම එනකොටත් ගියා. මම එනකොට ගියාම ඇතුළේ ළමයින් ඉන්නවා. මම ඒත් ඒ ගුරුතුමියට කිව්වා, අර සිවිලිම කඩා වැටුණු පැත්තට දරුවන්ව යවන්න එපාය කියලා. මම මෙහෙම ගොඩනැගිලි ගණනාවක් දැක්කා.

ඒ නිසා ගරු සභාපතිතුමා හරහා අපේ ගරු අධ්‍යාපන ඇමැතිතුමාට මම කියන්න කැමැතියි. මෙන්න මේ වාගේ ගොඩනැගිලි සම්බන්ධව,මේ කොන්ත්‍රාත්කරුවන්ට නැවත කොන්ත්‍රාත් කරන්න බැරි වන විධියට ඒ ලේඛනයට ඇතුළත් කරන්න කටයුතු කරන්න. පළමුවැනි පාර මම එතැනට ගියාම ආරංචි වුණේ විවෘත කරන්න ඉස්සෙල්ලා කොන්ත්‍රාත්කරුවාට පෙන්නලා තිබෙනවා. පෙන්නුවාම, - දැන් ආපසු කඩා වැටිලා හින්දා මම බැලුවේ. බැලුවාම වහලේ පුටු කකුළක් බැඳලා ලණුවකින් සිවිලිම එල්ලලා තිබිලා තිබෙන්නේ. ඒ ලණුව කඩා වැටීමත් එක්ක අද සිවිලිම සම්පූර්ණයෙන් පාත් වෙලා. ඒ තත්ත්වයට පත් වෙලා. ඉතින් ඒ නිසා ගරු සභාපතිතුමනි, මම ඉල්ලන එකම දේ තමයි. අද පාසල් පද්ධතියේ ගොඩනැගිලි ගොඩක් බැලුවාම වහින කොට කොන්ක්‍රීට් යටින් වතුර ගලනවා. ඉතින් මේ තත්ත්වය ඉතාමත් භයානක තත්ත්වයක්. ඒ අළුබෝමුල්ල එස්. මහින්ද විද්‍යාලයේම තව ගොඩනැගිල්ලක් තිබෙනවා. ඒ ගොඩනැගිල්ලේ කොන්ක්‍රීට් එකෙන් වතුර බේරෙනවා. ඉතින් මේ නිසා මම ඉල්ලා සිටින්නේ, විශේෂයෙන්ම මේ 2014.05.22 වැනිදා මේ විවෘත කරපු ගොඩනැගිල්ල පිළිබඳව විශේෂ පරීක්ෂණයක් කරලා, ඒ අදාළ සියලු දෙනාට නීති මගින් දඬුවම් දෙන්න කටයුතු කරන්න. මේ සියලු දේ කරන්නේ ළමයින් වෙනුවෙන්. ළමයින් දහස් ගණනක් සිටින පාසලක්. ඒ සඳහා කටයුතු කරන්නය කියන එක මම ගරු සභාපතිතුමා හරහා ගරු අධ්‍යාපන ඇමැතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ගරු සභාපතිතුමනි, -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පොඩ්ඩක් ඉන්න. තත්පරයක් දෙන්න.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

36(1).

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පොඩ්ඩක් ඉන්න. මේක ඉවර කරන තුරු. 36(1) පස්සේ දෙන්නම්. ගරු ඇමැතිතුමා, ගරු මන්ත්‍රීතුමා බරපතළ ප්‍රකාශයක් ඉදිරිපත් කළේ. අලුත් ගොඩනැගිල්ලක්. 2014.05.22 වන දින විවෘත කරපු ගොඩනැගිල්ලක්. සිවිලිම කඩා වැටිලා. ඔබතුමාගේ අවධානය යොමු කරන්න. ඒ වාගේම ලේකම්තුමාගේත් අවධානය යොමු කරනවා.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමාගේ අවසරය මත ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමාගේ ඉදිරිපත් කිරීම මම භාර ගන්නවා. හැකි ඉක්මණින් ඒ සම්බන්ධව කටයුතු කරනවා.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ගරු සභාපතිතුමනි, ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමා කිව්ව උත්සවයේ මම හිටපු ගරු ප්‍රධාන ඇමැතිතුමාත් එක්ක ආරාධිතයෙක් විධියට සම්බන්ධ වුණා සහ මම ඒ උත්සවය අගය කරලා ඒ කාරණය කථා කළා. මම මේ ස්ථානයට ගියා. දැන් මට ඒ ඉස්කෝලේට යන්න බැහැ. මගේ ගම. මගේ ප්‍රදේශය. මට මහජන නියෝජිතයෙක් විධියට ඉන්න බැරි තැනට පත් වෙලා තිබෙනවා. අඩි 20 ක් කඩන් වැටිලා තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. දැන් එතුමා කිව්වා නේ. ආයේ ඔබතුමා කියන්න දෙයක් නැහැ.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

නැහැ, ඒක නොවෙයි ප්‍රශ්නය.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාගේ වරප්‍රසාද ප්‍රශ්නය මට කියන්න කෝ. ඔබතුමා දැන් 36(1) නේ කියන්නේ. එතුමා දැන් ඒ ප්‍රශ්නය සම්බන්ධව පැහැදිලි කළා.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

එතුමා කියන කාරණය වැරැදියි. ඒකයි කියන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා එහෙමනම් වෙනම ප්‍රකාශයක් කරන්න.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ගරු සභාපතිතුමනි, මෙතුමා කියන කාරණය වැරැදියි. 2014.05.22 වැනි දින නොවෙයි විවෘත කළේ. මේ අවුරුද්දේ පස් වැනි මාසයේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අනවශ්‍ය ප්‍රකාශ කරන්න දෙන්න බැහැ.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ගරු සභාපතිතුමනි, මෙතුමා සම්පූර්ණ බොරුවක් කියන්නේ. මම අද උදෙත් පාසලට ගිහිල්ලා ආවේ.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

තවම මාස හතරයි විවෘත කරලා.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

මෙතුමාට කථා කරන්න කොහෙන්ද අයිතියක්.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

මම මහ ඇමැතිතුමාත් එක්ක ගිහිල්ලා විවෘත කරලා ආවේ. අවුරුද්දක් නැහැ. තවම මාස ගණනයි.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ඔබතුමාට කථා කරන්න තිබෙන අයිතිය මොකක්ද? මෙතුමා වැරැදියි කියන්නේ කොහොමද? අද උදෙත් මම ගිහින් ආවේ. මෙතුමා දේශපාලනය ඇදලා ගන්න හදන්නේ.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

හිටපු ගරු ප්‍රධාන ඇමැතිතුමාට සුදු හුණු ගාණ එකක්. අවුරුද්දක් නැහැ. මාස ගණනයි. මාස හතරෙන් කඩන් වැටිලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දැන් පරීක්ෂණයක් පවත්වනවා නේ? කරුණාකර ඔබතුමා වාඩි වෙන්න. ප්‍රකාශ කරන්න දෙන්න බැහැ.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

මෙතුමා දේශපාලනය ඇදලා ගන්න හදන්නේ. මේක දේශපාලනයක් නොවෙයි. මම අද උදෙත් ගිහිල්ලා ආවේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර දෙන්නාම වාඩි වෙන්න. මේ පෞද්ගලික පැහැදිලි කිරීම් යටතේ 36(1) කියා වෙන වෙන ප්‍රකාශ කරන්න දෙන්න මට බැහැ. මම ඉස්සරහාට ඒවා හැන්සාඩ් එකෙන් අයින් කරනවා.

බස්නාහිර පළාත් සභාවේ පුරප්පාඩු සඳහා තනතුරු පත් කිරීමේදී ගම්පහ දිස්ත්‍රික්කයට වූ අසාධාරණය සහ ආයතන ප්‍රධානීන් පත් කිරීමේදී නුසුදුසු අය පත් කිරීම පිළිබඳව මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමාට විනාඩි 05 ක කාලයක් තිබෙනවා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි, ගිය වර අගෝස්තු 17 වැනිදා පැවැත් වුණු පාර්ලිමේන්තු මැතිවරණයේදී ගම්පහ දිස්ත්‍රික්කයේ එක්සත් ජනතා නිදහස් සන්ධානයේ හිටපු ප්‍රධාන අමාත්‍යතුමාත්, ඒ වාගේම හිටපු අමාත්‍ය නිමල් ලාන්සා මැතිතුමාත්, ඒ වාගේම හිටපු ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක සිසිර ජයකොඩි මැතිතුමාත් පාර්ලිමේන්තුවට පත් වුණා. ඒ නිසා ගම්පහ දිස්ත්‍රික්කයේ තමයි මුළු පළාතෙන්ම පළාත් සභාවේ තනතුරු තුනම අහිමි වුණේ. ගම්පහ දිස්ත්‍රික්කයටයි හිමි වෙලා තිබුණේ. නමුත් අහිමි වුණා. ඒ නිසා ගරු සභාපතිතුමනි, ප්‍රධාන අමාත්‍යවරයා හැටියට ගත්තොත් මේ බස්නාහිර පළාත් සභාවේ කොළඹ දිස්ත්‍රික්කයේ වසර 11 ක් ප්‍රධාන අමාත්‍ය ධූරය දරලා තිබෙනවා. ඒ වාගේම කළුතර දිස්ත්‍රික්කයේ අවුරුදු 09 ක් ප්‍රධාන අමාත්‍ය ධූරය දරලා තිබෙනවා. ගම්පහ දිස්ත්‍රික්කයේ ප්‍රධාන අමාත්‍ය ධූරය දරලා තිබෙන්නේ අවුරුදු 07 යි. මේ අවුරුදු 27 ටම. ඒ වාගේම ප්‍රධාන අමාත්‍යවරයා හැටියට පුරප්පාඩු ලැබුණායින් පස්සේ පක්ෂයේ නායකයා

හැටියටත්, ගරු මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා අපේ පක්ෂයේ සියලු පක්ෂ කැඳවලා, සන්ධානයේ පක්ෂ, ඒ වාගේම ඒකෙන් අදහස් අරගෙන ඉසුර දේවප්‍රිය අපේ ගරු මන්ත්‍රීතුමාට ප්‍රධාන අමාත්‍ය ධූරය ලබා දුන්නා. ඒ වාගේම ප්‍රධාන අමාත්‍ය ධූරය ලබා දීමේදී අමාත්‍ය ධූර හැටියට කොළඹ දිස්ත්‍රික්කයට මේ වන විට අමාත්‍ය ධූර තුනක් ලබා දීලා තිබෙනවා. අපි බැලුවොත් එහෙම ගම්පහ දිස්ත්‍රික්කයේ අපට අමාත්‍ය ධූර දෙකක් හිමි විය යුතුයි. ඒකෙන් එකයි අපට හිමි වුණේ. ඒ වාගේම ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා හැටියට හිටියේත් අපේ ගම්පහ දිස්ත්‍රික්කයේ. ඒකත් කළුතර දිස්ත්‍රික්කයට මෙදා පාර නැවත හිමි වුණා. විශාල අසාධාරණයක් ගම්පහ දිස්ත්‍රික්කයට වුණේ.

මොකද, අපි මුල ඉඳලා ගත්තොත් පළමුවැනි පළාත් සභාවේ කොළඹ දිස්ත්‍රික්කයේ මහ ඇමැති හැටියට සුසිල් මුණසිංහ මහත්මයා ඉන්න කොට කොළඹ දිස්ත්‍රික්කයට එක අමාත්‍යවරයායි. එක අමාත්‍ය ධූරයක් දුන්නා. ගම්පහ දිස්ත්‍රික්කයට දෙකක් දුන්නා. කළුතර දිස්ත්‍රික්කයට එකක් ලබා දීලා තිබෙනවා. ඒ වාගේම දෙවැනි පළාත් සභාවේ චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරණතුංග මැතිනිය මේ පළාත් සභාවේ මහ ඇමැති වනකොට අනික් දිස්ත්‍රික්ක දෙකටම ඇමැති ධූර දෙකක් ලබා දීලා තිබෙනවා. ඒ වාගේම එතුමිය පාර්ලිමේන්තුව තරග කරලා, අගමැති හැටියට පත් වෙන කොට ප්‍රසන්න රණතුංග මැතිතුමාට දීලා තිබෙනවා. ඒත් එක අමාත්‍ය ධූර යයි ලැබිලා තිබෙන්නේ. තුන්වැනි පළාත් සභාවේදී සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමා කොළඹ දිස්ත්‍රික්කයෙන් මහ ඇමැති වෙලා ඉන්න කොට කොළඹ දිස්ත්‍රික්කයට අමාත්‍ය ධූර දෙකකුත්, ගම්පහ දිස්ත්‍රික්කයටත්, කළුතර දිස්ත්‍රික්කයට එකක්වත් ලැබිලා නැහැ. ඒ වාගේම හතරවැනි පළාත් සභාවේදී රෙජිනෝල්ඩ් කුරේ ගරු මහ ඇමැතිතුමා කළුතර දිස්ත්‍රික්කයට ඉන්නකොට කොළඹ දිස්ත්‍රික්කයට දෙකකුත්, ගම්පහ දිස්ත්‍රික්කයට දෙකකුත් ලබා දීලා තිබෙනවා. පස්වැනි පළාත් සභාවේදී ප්‍රසන්න රණතුංග ප්‍රධාන ඇමැතිතුමා ඉන්න කොට එක අමාත්‍ය ධූරයකුත්, කොළඹට දෙකකුත්, කළුතර දිස්ත්‍රික්කයට එකකුත් ලබා දීලා තිබෙනවා.

අපි 2014 පළාත් සභා මැතිවරණය ගත්තොත් ගම්පහ දිස්ත්‍රික්කයේ වැඩිම මන්ත්‍රී සංඛ්‍යාවක් පත් වුණේ එක්සත් ජනතා නිදහස් සන්ධානයෙන්. 24 දෙනෙක්. ඒ වාගේම වැඩි ඡන්ද ගත්තොත් තුන් ලක්ෂ තිස් එක් දහස් හාරසිය හැට අටකින් තමයි ජයග්‍රහණය කරලා තිබෙන්නේ. කොළඹ දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරු 19 යි. වැඩි ඡන්ද තිබෙන්නේ, එක් ලක්ෂ පනස් හත් දහස් පන්සිය හතළිස් පහයි. ඒ වාගේම කළුතර දිස්ත්‍රික්කය ගත්තොත් මන්ත්‍රීවරු 13 යි. ඒ වාගේම වැඩි ඡන්ද එක් ලක්ෂ අනූ තුන් දාහයි. ගම්පහ දිස්ත්‍රික්කයට සහ මන්ත්‍රීවරු හැටියට අපට විශාල අසාධාරණයක් වුණාය කියන එක අපි ගරු සභාපතිතුමා මාර්ගයෙන් මතක් කරන්න ඕනෑ. මොකද, සභාපතිතුමා හැටියට මේ බස්නාහිර පළාත් සභාවේ ගම්පහ දිස්ත්‍රික්කයේ ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරයෙක්. නියෝජ්‍ය සභාපතිවරයෙක්, සභාපතිවරයෙක් හැටියට ඉන්න එක්සත් ජනතා නිදහස් සන්ධානයේ ඉන්න 56 දෙනාගෙන් 55 දෙනෙක් අත්සන් කරලා ඔබතුමා මහ ඇමැති ධූරය ඉල්ලුවා. නමුත් ඒකත් ලැබුණේ නැහැ. ඒ වාගේම අපට යම්කිසි අසාධාරණයක් සිදු වුණා.

ඒ වාගේම තමයි අමාත්‍ය ධූර පත් වුණාට පස්සේ එක්සත් ජාතික පක්ෂයත් එක්ක තරග කරලා, පාර්ලිමේන්තුවේ අද ජාතික ආණ්ඩුවක් තිබෙන වේලාවේ හරියට එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩුවක් පිහිටෙව්වා වාගේ. අද ආයතන ප්‍රධානීන් පත් කිරීම දවසින් දවස තමුන්ට ඕනෑ විධියට පත් කරමින් යන්න පටන් ගත්තා. ගරු ප්‍රධාන ඇමැතිතුමනි, උදාහරණ දෙන්න පුළුවන්. අපේ කෘෂිකර්ම අමාත්‍ය ගාමිණී තිලකසිරි ගරු ඇමැතිතුමා. එතුමාට කර්මාන්ත අමාත්‍යාංශ විෂයය තිබුණේ. එතුමාට අලුත් අමාත්‍ය ධූර ලැබෙන කොට කර්මාන්ත විෂයය නැතිව ගියා. හැබැයි, එතුමාගේ සහෝදරයා හෝමාගම ප්‍රාදේශීය සභාවේ සභාපති. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ. ඒ වාගේම ජනවාරි 08 වැනිදාට පෙර පොදු විපක්ෂයේ අපේක්ෂකයාට මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාට වැඩ කරපු කෙනෙක්. මේ දාහත් වැනිදායින් පස්සේ, අලුත් අමාත්‍යවරයා පත් වුණායින් පස්සේ එක කැබිනට් එකේ ඉඳගෙන ඉන්න සහෝදර අමාත්‍යවරයාගේ සහෝදරයාව, තමුන් පැනකින් අත්සන් කරලා ඒ තනතුර අහක් කරලා තවත් කෙනෙක් පත් කරනවා. මේක සදාචාරයද කියලා අහන්නේ? මේකද යහපාලනය? මේකද සම්මුතිවාදය කියන්නේ? ඊට පස්සේ තවත් සභාපතිවරයෙක් - ගිය වර සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා මේ සභාවේ වග කියන මන්ත්‍රීවරයෙක් හැටියට නම් දෙකක් ප්‍රකාශ කෙරුවා. ඒ දෙන්නාව පත් කරන්න එපා. ඒ දෙන්නාටම චෝදනා තිබෙනවා කියලා. මාර්ග සංවර්ධන අධිකාරියේ සභාපතිවරයා හැටියට එතුමා එපැයි කියන කොටම මේ සභාව සම්පූර්ණ නොමඟ යවලා -

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

මේවා සභාවේ කථා කරන්න ඕනෑ ඒවද?

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඇයි?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා වාඩි වෙන්න. මන්ත්‍රීවරයෙකුට පෞද්ගලික පැහැදිලි කිරීම් කරන්න පුළුවන්.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

මේවා සභාවට අදාළ නැහැ. වැදගත් යෝජනා, මාස ගණන් පරක්කු වුණු යෝජනා තිබෙනවා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

පෞද්ගලික පැහැදිලි කිරීම් කරන්න ඔබතුමාගෙන් අහන්න ඕනෑද? ඔබතුමාට අහගෙන ඉන්න බැරි නම් කට වහගෙන ඉන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා කථා කරන්න.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

කෑ නොගහා අහගෙන ඉන්න.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ඔබතුමන්ලා අහගෙන ඉන්න පුරුදු වෙන්න. ඔබතුමන්ලාට හැමදාම වුණේ ඕකයි. අහගෙන ඉන්න බැරිකම.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි, මාර්ග සංවර්ධන අධිකාරියේ සභාපතිතුමාව පත් කරන්න බැහැයි කියලා එතුමා පැහැදිලිව කිව්වා. එතකොට මේ සභාවේ වගකීමෙන් කියපු, පැහැදිලිව සභාගත කරලා, ඒ වාගේම ඉදිරිපත් කරපු ඒ ලිපි ලේඛන අහක දාලා මෙතුමා ඒ සභාපතිතුමාව පත් කෙරුවා. ඊට පස්සේ ගම්පහ බැංකු සංගමයේ සභාපතිතුමා. බැංකු සංගමයේ සභාපතිවරයෙක් හැටියට බැංකුව ගොඩනගලා - අපේ ගම්පහ දිස්ත්‍රික්කයේ සමූපකාර සමිති 17 ක් තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

දාහතෙන්, දාසයක් අත්සන් කරලා එතුමාව ඒකමතිකව තීන්දු කරලා ගම්පහ දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරු ඉල්ලපුවාම ඒ සභාපතිව අයින් කරලා වෙන සභාපති කෙනෙක් පත් කෙරුවා. අඩුම ගණනේ ඒ සභාපතිව පත් කරන කොට දැනුම් දෙන්න ඕනෑ. නිරීක්ෂණ චාරිකාවක් යනවා කියලා බැංකු සංගමයට, එතැනට ගිහින් උත්සවයක් පවත්වලා ඒ සභාපතිව අයින් කරලා ලිපිය දීලා වෙනත් කෙනෙක් පත් කෙරුවා.

ඊළඟට ඊයේ ප්‍රවාහන අධිකාරියේ සභාපතිතුමාව පත් කෙරුවා. ඒ ප්‍රවාහන අධිකාරියේ වැඩ කරන නිලධාරියෙක්. සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා කිව්වා, එතුමාට චෝදනා තිබෙනවා කියලා. මේ සභාවේ සභාගත කෙරුවා. මීට ඉස්සෙල්ලා කථා කෙරුවා. නමුත් ඒ කිසි දෙයක් මායිම් කරන්නේ නැතිව තමුන්ට ඕනෑ විධියට සියලු සභාපතිවරු පත් කෙරුවා. ගරු සභාපතිතුමනි, මෙන්න මේකයි තත්ත්වය. අපට කියන්න තිබෙන්නේ නුසුදුසු පුද්ගලයන් පත් කරන එක.

ගරු ආණ්ඩුකාරතුමා ලිපියකින් ගරු ප්‍රධාන ඇමැතිතුමාට ප්‍රධාන ලේකම්තුමියට සහ ජනාධිපතිතුමාගේ ලේකම්තුමාට ලිපියක් යවලා තිබෙනවා, යම්කිසි ආයතනයක ප්‍රධානියෙක් පත් කරන කොට පැහැදිලිවම කමිටුවක් පත් කරලා ඒ කමිටුවට සුදුසුකම් බලලා පත් කරන්නය කියලා. අද ඒ කිසි දෙයක් වෙන්නේ නැහැ. මහින්ද රාජපක්ෂට වැඩ කෙරුවා කියලා බලන්නෙත් නැහැ. මෛත්‍රීපාලට වැඩ කෙරුවාද කියලා බලන්නෙත් නැහැ. පළි ගැනීමක් හැටියට සියලු ආයතන ප්‍රධානීන් මාරු කිරීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කෙරුවා.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

කවුද කරන්නේ?

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

අන්න ඒ නිසා තමයි අපි කියන්නේ, මේ අසාධාරණය වෙන්න ඉඩ තියන්න එපා. මේකේ පරීක්ෂණ පවත්වන්න තිබෙනවා කියලා සභාවේ කථා කරන කොට, සභාවේ මන්ත්‍රීවරු හැල්ලුවට පත් කරමින් මෙය ක්‍රියාත්මක කෙරුවයි කියන එක ඔබතුමාට පැහැදිලිව කියනවා. බොහොම ස්තූතියි.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර සභාව නිශ්ශබ්ද වන්න. මම අපේ සරත් පතිරණ ගරු මන්ත්‍රිතුමාගේ අවධානය යොමු කරනවා. මන්ත්‍රීවරයෙකුට අයිතියක් තිබෙනවා, පෞද්ගලික පැහැදිලි කිරීමක් කරන්න. ඒක සභාවට අදාළ වෙන්නත් පුළුවන්. නොවෙන්නත් පුළුවන්. නමුත් ඒ අයිතිය එතුමාට තිබෙනවා. ඒකයි මම එතුමාට අවස්ථාව ලබා දුන්නේ. එතුමා පැහැදිලිව කියලා තිබෙනවා. එතුමාගේ ඉල්ලීම් කොළේ ලියලා තිබෙනවා, මෙන්න මේ කාරණය කියලා. පැහැදිලිව කියලා තිබෙනවා. එතුමා කථා කළේ ඒ යටතේ. කොහොම වුණත් බරපතළ ප්‍රකාශයක් එතුමා මේ සභාවට කළේ. අදාළ විෂයය භාර ඇමැතිතුමාටත් ප්‍රශ්නයක්. මම කනගාටු වෙනවා, අමාත්‍යවරයෙක් ලෙස පත් වෙලා මාසයක්වත් තව ගියේ නැහැ.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා - විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා**
Hon. U. George Perera - Chief Opposition Whip

කවුද කියලා අපිත් දැනගන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

විශේෂයෙන්ම දැන ගන්න ඕනෑ. විශේෂ ප්‍රකාශ කිරීමේදී -

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා - විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා**
Hon. U. George Perera - Chief Opposition Whip

ගරු සභාපතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා, එතුමා. ඒක නේ වෙන්න ඕනෑ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

අපි සභාවේ කියනවා, මේක ජනාධිපතිතුමාට යොමු කරන්න කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

වර්තමාන කාලය තුළ රටේ අත්‍යවශ්‍ය භාණ්ඩ මිල ඉහළ යාම හා මහජන ආරක්ෂාව හීන වීම පිළිබඳව ජනක වැලිවත්ත ගරු මන්ත්‍රීතුමාට විනාඩි 04 ක කාලයක් තිබෙනවා.

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

ගරු සභාපතිතුමනි, මම මෙම කරුණු පැහැදිලි කිරීම ගෙන එන්නේ, වර්තමානයේ රට තුළ ඇති වෙලා තිබෙන තත්ත්වය පිළිබඳව කරුණු පැහැදිලි කිරීම සඳහා. පැහැදිලිවම වත්මන් රජය බලයට පත් වෙන කොට ජනතාවට කිව්වේ, ජනතාවට උපරිම වශයෙන් සහන ලබා දෙනවා. රටේ ආරක්ෂාව ඇති කරනවා. යහපාලනයක් ඇති කරනවා කියන පොරොන්දු දීලා තමයි මේ රජය බලයට පත් වුණේ. අතවශ්‍ය භාණ්ඩවලින් අය කරන බදු කපා හැරලා ජනතාවට උපරිම සහන ප්‍රමාණයක් ලබා දෙනවා කියලා කිව්වා. නමුත් අද මේ වන විට ජනතාව ඉතා විශාල ප්‍රශ්න ප්‍රමාණයකට මැදිහත් වෙලා තිබෙනවා. ජනතාවට එදි නෙදා අවශ්‍ය වන භාණ්ඩවල මිල ගණන් සීඝ්‍රයෙන් ඉහළ යමින් පවතිනවා. ඩොලර් එකේ මුදල පාවෙන්න හැරලා, රුපියලේ අගය පහත වැටීමත් එක්ක මේ රටේ භාණ්ඩවල මිල විශාල වශයෙන් ඉහළ යාමට පටන් ගෙන තිබෙනවා. ඒ නිසා බස්නාහිර පළාතේ මේ රටේ ජීවත් වන ජනතාව විශාල ගැටලු රාශියකට මුහුණ දීලා තිබෙනවා.

අද මේ ආණ්ඩුව පත් වුණාට පස්සේ පරිප්පුවලට තිබුණු බද්ද වැඩි කළා. ඒ වාගේම සීනිවලට තිබෙන ආනයනික බද්ද වැඩි කරලා තිබෙනවා. ඒ වාගේම පසුගිය දවස්වල කිව්වා, හෘද රෝගවලට හොඳ නැහැයි කියලා ලුණුවලට බදු එකතු කරනවා කිව්වා, ලුණු භාවිතය අඩු කරන්න. ඒ වාගේම ආනයනය කරන තෙල්වලට බදු අය කරනවා කිව්වා. මේ සියල්ල නිසා සිද්ධ වෙන්නේ ජනතාවගේ එදිනෙදා භාණ්ඩවල මිල ගණන් ඉහළ යාම. ඒ නිසා මේ තත්ත්වය තුළ රටේ සියලු භාණ්ඩවල මිල ගණන් ඉහළ ගිහිල්ලා තිබෙනවා. අපි දැක්කා. හැබැයි, මේ ආණ්ඩුව එක

[ගරු ජනක වැලිවත්ත]

දෙයක මිල අඩු කරලා තිබෙනවා. රබර් මිලදී ගන්න මිල අඩු වෙලා තිබෙනවා. තේ මිලදී ගන්න මිල අඩු වෙලා තිබෙනවා. වී මිලදී ගන්න මිල අඩු වෙලා තිබෙනවා. මේ වාගේ දේවල් වලින් ජනතාව දැඩි අපහසුතාවයකට පත් වෙලා තිබෙනවා. (බාධා කිරීම්) ඒ වාගේම ජනතාවට අතවශ්‍යා නොවන භාණ්ඩ කිහිපයක මිල අඩු කළත් ඒවායේ මිලත් අද මේ වන විට ඉහළ ගිහිල්ලා, ජනතාව දැඩි අසීරුතාවයකට පත් වෙලා තිබෙනවා. ඒ නිසා අපි යෝජනා කරන්නේ, මේ භාණ්ඩවල බදු අය කිරීම අඩු කරලා භාණ්ඩවල මිල ස්ථාවර තත්ත්වයකට ගෙනෙන්න රජයට කටයුතු කරන්නය කියන යෝජනාව ගෙනෙන්නේ.

ඒ වාගේම මේ ආණ්ඩුව බලයට ඇවිල්ලා කිව්වා, මධ්‍යසාරවලින්, සිගරට්වලින් බදු අරගෙන මේ රජය ගෙනි යන්න බලාපොරොත්තුවක් තියා ගන්නේ නැහැයි කියලා. නමුත් අයවැයට තව මාස කිහිපයක් තිබෙද්දී අරක්කුවල, සිගරට්වල මිල වැඩි කරලා තිබෙනවා. මේක කියන අයට කියන්න පුළුවන්, වැඩි වුණු එක හොඳයි. භාවිතා කරන ප්‍රමාණය අඩු වෙනවා කියලා. නමුත් කවදාවත් සිගරට්, අරක්කුවල මිල වැඩි කළයි කියලා ඒක දීර්ඝ කාලීන වශයෙන් පාවිච්චිය අඩු වෙන දෙයක් නොවෙයි. ඒ නිසා මේ රටේ ජනතාව අද ලොකු ගැටලුවකට ලක් වෙලා තිබෙන්නේ. මේ රටේ මූල්‍යා ක්‍රමය අද සම්පූර්ණයෙන් කඩා වැටිලා. මේ තත්ත්වය ජනතාව ඉදිරියේ හෙළි කළ යුතු අවස්ථාවක මේ රට පත් වෙලා තිබෙන්නේ. ඒ නිසා අද මේ සියල්ල වහලා, අද වෙන දෙයක් ජනතාවට පෙන්වන්නේ.

ඒ වාගේම මේ වන කොට මේ රටේ පාතාලය හිස එසවීම පටන් ගෙන තිබෙනවා. පසුගිය කාලයේදී අපි දැක්කා, පාර්ලිමේන්තු ඡන්දය වෙලාවේදී කොළඹදී පාතාල කණ්ඩායම් දෙකක් වෙඩි තියා ගෙන මරා ගන්නවා. ඊයේ පෙරෙයිදා කඩුවෙල උසාවියට ඇවිල්ලා පොලීසියත් එක්ක රැගෙන එන හිරකාරයන්ට වෙඩි තියන්න පුළුවන් තත්ත්වයට වෙන කල් මේ රටේ ආරක්ෂාව බිඳ වැටිලා. ඉදිරිපිටට ඇවිල්ලා වෙඩි තියලා මිනිසුන් ඝාතනය කරන තත්ත්වයට පත් වෙලා. යාල කැලේ ඇතුළේදී වෙඩි තියා ගත්තා. මේ වාගේ තත්ත්වයක් අද මේ රට තුළ ඇති වී තිබෙනවා. කපා කොටා මරා දැමීම් අනන්ත අප්‍රමාණව මේ රට තුළ සිද්ධ වෙනවා. අර සේයා සදෙව්මි දැරියගේ ඝාතකයන් අද වන තෙක් අත්අඩංගුවට ගන්න පුළුවන් තත්ත්වයට පොලීසිය, CID එක පත් වෙලා නැහැ. ඉතා අසාර්ථක තත්ත්වයක් බවට අද මේ රට පත් වෙලා තිබෙනවා. ඒ නිසා ගරු සභාපතිතුමනි, අපි ඔබතුමාට යෝජනා කරනවා. කොටකෙතන ඝාතනය සොයන්න ඕනෑ. කොටකෙතන ඝාතන සිද්ධ වෙනවා. ඊයේ පෙරෙයිදා තවත් කාන්තාවක් උස්සගෙන ගිහිල්ලා මරලා දැම්මා. මේ සියල්ල මේ රට තුළ සිද්ධ වෙමින් පවතිනවා. ඒ එක්කම අපි දැක්කා ඊයේ ප්‍රකාශයක් කරනවා. රටට ආනයනය කරන වාහන ආනයනය කිරීම සීමා කරන්නය කියලා. ඒ නිසා මේ රටේ ජනතාවගේ බලාපොරොත්තු සියල්ල එකින් එක කඩා වැටෙන තත්ත්වයට පත් වෙලා තිබෙනවා. ගරු සභාපතිතුමනි, මේ පිළිබඳව කිසි දෙයක් නැහුණා වාගේ නොඉඳ මේ පිළිබඳව සොයලා බලලා අපේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට වාගේම එක්සත් ජාතික පක්ෂ රජයටත් වගකීමක් තිබෙනවා, මේ පිළිබඳව සොයා බලා කටයුතු කරන්න. මෙය රටේ ජනතාවගේ අවශ්‍යාතාවයක් බව කියමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පෞද්ගලික පැහැදිලි කිරීම් තව රාශියක් ඉදිරිපත් කරන්න තිබෙනවා. නමුත් දැන් වේලාව පෙ.ව. 10.35 යි. එබැවින් උදෑසන තේ විවේකය සඳහා මෙම සභාව තාවකාලිකව අත්හිටුවනවා.

***ඊට අනුකූලව පළාත් සභාව තාවකාලිකව අත්සිටුවන ලදින් පූ.භා. 11.35 ට ගරු නියෝජ්‍ය සභාපතිතුමාගේ [යසපාල කෝරළගේ මහතා ] ප්‍රධානත්වයෙන් යළිත් රැස් විය.***

*Accordingly the Sitting, Suspended and. it resumed at 11.35 a.m with Hon Deputy Chairman [Mr. Yasapala Koralage] in the Chair.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

පෞද්ගලික පැහැදිලි කිරීම් යටතේ රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමියට අවස්ථාව.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පාර්ලිමේන්තු ඡන්දය අවසන් වීමෙන් පසුව පළමුවෙන් සභාව අමතන මේ මොහොතේදී, යහපාලන ආණ්ඩුවක් වෙනුවෙන් ඡන්දය

ප්‍රකාශ කළ සියලුම ජනතාවට ස්තූතිය ප්‍රකාශ කරනවා. එසේම කටාන ආසනයෙන් වැඩිම මනාප ලබා දෙමින් සහ ඒ වාගේම අපි බලාපොරොත්තු වුණු ජයග්‍රහණය ලබා ගැනීමට සහාය දුන් සියලු දෙනාටම ස්තූති කරනවා. ඒ වාගේම ජාතික ආණ්ඩු සංකල්පය සහ පක්ෂ දේශපාලනය ගැන විශේෂ ප්‍රකාශයක් කරන්නට මා අදහස් කරන්නේ, මේ එක්සත් ජාතික පක්ෂ ජනතාව වසර ගණනාවක් විවිධ හැල හැප්පීම්, අරියාදු මැද, විශේෂයෙන්ම ඔවුන්ට ජාතික පාසල් අහිමි වෙලා, රැකියා අහිමි වෙලා, ඒ වාගේම ඔවුන්ගේ අවශ්‍යතාවය ඉටු කර ගන්න ආණ්ඩුවේ සහයෝගයක් නැතිව බොහොම කාලයක් ප්‍රශ්නවලට මුහුණ දෙමින් ඉඳලා, ඔවුහු තම තමන්ගේ මුදල් වියදම් කරලා, යහ පාලන ආණ්ඩුවක් සඳහා දායකත්වය ලබා දුන්නා. අද එක්සත් ජාතික පක්ෂයට දායකත්වය ලබා දුන්න ජනතාව මේ වන කොට බොහොම කලකිරීමට සහ ඒ වාගේම හිත් වේදනාවකට පත් වෙලා ඉන්නවා. එයට හේතුව තමයි, එතුමන්ලා සහාය දීලා පත් කර ගත්ත ආණ්ඩුවේ ඇත්ත වශයෙන්ම අද ඉන්නේ එක්සත් ජාතික පක්ෂ ඇමතිවරු නොවෙයි. විවිධ ආකාරයට පත් කර ගත්ත ඇමතිවරු විශාල සංඛ්‍යාවක් ඉන්නවා. ඒ වාගේම මෙම තත්ත්වයේ ජනතාව අප ඉදිරියට ඇවිල්ලා අද ප්‍රශ්න කරනවා, එක්සත් ජාතික පක්ෂයට ඡන්දය දුන්නොත් පත් වෙන්නේ මොන ඇමතිද? ඒ වාගේම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට ඡන්දය දුන්නොත් පත් වෙන්නේ මොන ඇමතිද කියන එක අද ජනතාවට ප්‍රශ්නයක් වෙලා තිබෙනවා.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

දෙගොල්ලෝම පිං ඇමතිලා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

විශේෂයෙන්ම අපි මත්ද්‍රව්‍ය ව්‍යාපාරයට, එතනෝල් ව්‍යාපාරයට, ඒ වාගේම ජනතා විරෝධී වැඩ කටයුතුවලට විරුද්ධව තමයි යහපාලන සංකල්පය ඔස්සේ මේ ඡන්දයේදී කටයුතු කළේ. අද අපි අතිශයින් කනගාටුවට පත් වෙනවා. ජනතාව ප්‍රතික්ෂේප කරපු, මනාප ඡන්ද 8,000 ක් 10,000 ක් ලබා ගත් අය ඇමතිවරු බවට පත් වෙලා ඉන්නවා. ඒ වාගේම විවිධ වංචා, දූෂණ සම්බන්ධයෙන් පරීක්ෂණ කරන්නය කියලා ජනතාව ඉල්ලා හිටපු, චෝදනා කරපු අයත් මේ සඳහා පත් වෙලා ඉන්නවා. අද එක්සත් ජාතික පක්ෂයේ බොහෝ අය තමන්ගේ වෙහෙස මහන්සියෙන් උපයා ගත් මුදලින් දේශපාලනය කරලා අද ඉතාම කනගාටුවෙන් ඉන්නවා. ඒ අය බලාපොරොත්තු වුණු යහපාලනය ස්ථාපිත කර ගන්න නොහැකි වීම නිසා. ඉතින් අද ඇත්තටම එක්සත් ජාතික පාක්ෂිකයා හරියට අර ගෙදරට ආපු නෑදෑයින්ට, ගෙදර ඉන්න අයට රසට උයලා පිහලා කන්න බොන්න දීලා අම්මා බඩගින්නේ ඉන්නවා වාගේ තත්ත්වයක් අද එක්සත් ජාතික පක්ෂයට වෙලා තිබෙන්නේ. අම්මා එක දවසක් බඩගින්නේ ඉඳලා, අනෙක් අයට කෑම බීම දුන්නාට කමක් නැහැ. හැබැයි, මේ අම්මා හැමදාම බඩගින්නේ ඉන්නවා නම් අපි අතිගරු ජනාධිපතිතුමාගේ අවධානයට යොමු කරනවා. මේ බඩගින්නේ ඉන්න අම්මාව හැමදාම බඩගින්නේ තියන්න එපා. මොකද, හැමදාම අනික් අය වෙනුවෙන් කැප කිරීමක් කරලා, අද පාක්ෂිකයෝ අසරණ තත්ත්වයට පත් වෙලා ඉන්නවා. ඒ වාගේම අද විශේෂයෙන්ම මම කියන්න ඕනෑ. ඒ රාජ්‍ය නායකයා විදේශගතව ඉඳලා, ලංකාවට ගොඩ බසින අවස්ථාවේදී ලක්ෂ 90 ක් වියදම් කරලා උත්සවයක් පවත්වලා ඒ අපට දැන ගන්න ලැබෙන තොරතුරු විධියට -

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

බොරු.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

මේ කටවුට්, බැනර්, පෝස්ටර් එපාය කියලා අපි කිව්වේ. මේ සඳහා මුදල් -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඒ යහපාලනය. ඔයගොල්ලෝ නේ ඡන්දය දීලා පත් කර ගත්තේ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

දැන් මෙහිදී අපි කනගාටුවට පත් වෙනවා, අද සමුපකාරයේ ණය මුදල ගෙවා ගන්න බැරිව, රු. 25,000 ගෙවා ගන්න බැරිව උසාවියට ගෙනියන ජනතාවක් ඉන්නේ. මේ වාගේ නාස්ති කරන්නේ නැතිව මෙවැනි දුක්ඛිත තත්ත්වයක ඉන්න ජනතාවගේ පොලී මුදල් කපා හැරියා නම් ඊට වඩා වටිනවා. මම නීති ක්ෂේත්‍රයේ ඉන්න නිසා දන්නවා. රු. 15,000/ - ට රු. 20,000/- ට නඩු

[ගරු රෝස් ප්‍රනාන්දු]

දාලා උසාවි ගිහිල්ලා අසරණ තත්ත්වයට මිනිස්සු පත් වෙනවා. එහෙම තත්ත්වයක් තිබෙද්දී, මේ රාජ්‍ය අරමුදල්, කටවුට්, බැනර්, පෝස්ටර් අනවශ්‍ය වියදම් සඳහා යොමු කිරීම අපි හෙළා දකිනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඕගොල්ලන්ගේ ජනාධිපතිතුමාට ගිහිල්ලා කියන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කරුණාකරලා බාධා කිරීම් කරන්න එපා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

සියලු දෙනාම අහගෙන ඉන්න. විශේෂ ප්‍රකාශවලට බාධා කරන්න එපා. අහගෙන ඉන්න. ඒ වාගේම විශේෂයෙන්ම මම කියන්න ඕනෑ, මහින්ද රාජපක්ෂ මැතිතුමා -

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු නියෝජ්‍ය සභාපතිමනි, සභාවේ ගණ පූරණය පිළිබඳව අවධානය යොමු කරනවා.

***පළාත් සභාව ගණන් කොට ගණපූරණය නොමැති බව පෙනීගියෙන් කැඳවීම් සීනුව නාද කිරීමට නියෝග කරන ලදී. පසුව ගණපූරණය ඇති විය.***

*Provincial council counted, and a Quorum not being present, the Division bells were ordered to be rung, Later, a Quorum being present.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු ඔබතුමියට අවස්ථාව.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ අවස්ථාවේදී මම කියන්න ඕනෑ, මහින්ද රාජපක්ෂ මැතිතුමාත් හොඳ රාජ්‍ය නායකයෙක් හැටියට ආරම්භයක් ගත්තා. එතුමාවත් විනාශ කරපු කල්ලියක් හිටියා. විශාල වශයෙන්. දැන් ඒ කල්ලිය මේ අලුත් රාජ්‍ය නායකාගේ පස්සෙන් ගිහිල්ලා දැන් එතුමාව -

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ඒක හරි. ඒ කට්ටිය මෛත්‍රීපාල ගාව.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

අද සැබවින්ම පිරිසිදු ශ්‍රී ලංකා නිදහස් පාක්ෂිකයෝත්, පිරිසිදු එක්සත් ජාතික පාක්ෂිකයෝත් කනගාටු වෙනවා. ඇත්ත වශයෙන්ම ඒගොල්ලන්ගේ හිත්වල බොහොම තදබල කලකිරීමක් තිබෙනවා. අපි විශේෂයෙන් කියන්න ඕනෑ. අද අපි කනගාටුවට පත් වෙනවා, මෙතැනදී මේ අනවශ්‍ය වියදම් කළාම ජනතාව කල්පනා කරන්නේ මේ පත් වුණු රාජ්‍ය නායකයා පත් කළේ එක්සත් ජාතික පක්ෂය. මේ එක්සත් ජාතික පක්ෂය විසින් තමයි මේ නාස්තිකාර වියදම් කරන්නේ කියලා. මේ අපි එක්සත් ජාතික පක්ෂයේ වුණාට, අපි ඇත්ත වශයෙන්ම කියන්න ඕනෑ මේ පත් වුණු, අර එහා පැත්තෙත් එල්ලිලා ඉඳලා මෙහා පැත්තෙත් එල්ලුනු සමහර ඇමතිවරු මේ නාස්තිකාර වියදම් කරන කොට ඒවාවල දෝෂාරෝපණ අපට ගන්න බැහැ. ඒවාට අපි අදාළ නැහැ. ඒ නිසා අපට පුංචි හිරිකිතයක් තිබෙනවා, මෙවැනි දේවල් සිද්ධ වෙන කොට.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ඕක මෙහේ කියලා හරියන්නේ නැහැ. ජනාධිපතිතුමාට ගිහිල්ලා කියන්න. ඔයගොල්ලන් නේ පත් කර ගත්තේ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

මම අතිගරු ජනාධිපතිතුමාගේ අවධානයට යොමු කරනවා. අර බඩගින්නේ ඉඳගෙන කටයුතු කරන ජනතාවට, සමස්ත ශ්‍රී ලාංකීය ජාතියට යහපතක් උදා කරන්න. මේ යහපාලන ආණ්ඩුව පිහිටවූ ජනතාව බඩගින්නේ තියන්නේ නැතිව, මෙවැනි නාස්තිකාර වැඩ කරන්නේ නැතිව මේ කුමන්ත්‍රණ කාරීන්ගෙන් ජනතාව බේරා ගන්නය කියන ඉල්ලීම මම විශේෂයෙන්ම කරනවා.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කාර්ය පටිපාටි රීති 34 යටතේ මේ ප්‍රකාශය කිරීම සඳහා අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. නමුත් ඉතින් මේ ප්‍රකාශයත් කරලා වැඩක් නැහැ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ කැබිනට් මණ්ඩලයේ කවුරුවත් නැහැ. අපි නිකම් වාතලයට කියන එකක් මේ තිබෙන්නේ. ඉතින් ඒ කොහොම වෙතත් -

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ කියන කථාව ඇත්ත.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඇත්ත.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඒ ගැන වගකිව යුතු එක ඇමතිවරයෙක්වත් ඉන්න ඕනෑ. මේ සභාවට තිබෙන්නේ සාමූහික වගකීමක්. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා විනාඩියක් ඉන්න. ඔබතුමාගේ කථාවට කාලය ලබා දෙනවා. මම මේ අවස්ථාවේදී ඇමතිවරුන්ට සභාවට එන ලෙස දන්වනවා.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කාර්ය පටිපාටි රීතිවල මේ සම්බන්ධව සඳහනක් නැහැ. ඇමතිවරුන් ඉන්නම ඕනෑය කියලා මේකේ සඳහනක් නැහැ. නමුත් මේ සභාවේ ඇමතිවරයෙක් ඉන්න ඕනෑ. දැන් අපි -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

අදාළ ඇමතිතුමා පැමිණියා. ඔබතුමා කථා කරන්න.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, හෝමාගම ප්‍රාදේශීය සභාවේ පාලනයට යටත් ඉරිදා සහ බදාදා දිනවල පැවැත්වෙන සති පොළ නවීකරණය කිරීම සඳහා නාගරික සංවර්ධන අධිකාරිය සහ ප්‍රාදේශීය සභාව ඒකාබද්ධව ගත් තීරණයක් මත පොළෙහි කටයුතු තාවකාලිකව වෙනත් ස්ථානයකට යොමු කරන ලදී. අවම පහසුකම් හා ඉඩකඩ යටතේ වෙළඳුන් ද, පාරිභෝගිකයන් ද නොයෙකුත් ගැටළුවටල මුහුණ දෙමින් තවමත් පොළ පවත්වාගෙන යන්නේ තාවකාලික ස්ථානයක ය. නමුත් මේ වන විට පොළ ඉදිකිරීමේ කටයුතු අවසන් කොට මාස හයකට වඩා කාලයක් ගත වී ඇත. එහෙත් වගකිවයුත්තන් විසින් නවීකරණය කරන ලද භූමියේ පොළ පවත්වාගෙන යාමට අවශ්‍ය කටයුතු මෙතෙක් ආරම්භ කොට නැත. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මහජනතාවගේ අවශ්‍යතාවය මත නව පහසුකම් මහජනතාවගේම මුදල්වලින් ලබා දීම සඳහා අවශ්‍ය ඉදි කිරීම් ද අවසන් කළද, නිසි පරිදි මහජන අවශ්‍යතාවය සඳහා ලබා නොදීමට බලධාරීන් මෙසේ ප්‍රමාද කිරීම අප රටේ වගකිවයුතු ආයතනවල සාමාන්‍ය දෙයක් බවට පත් වී ඇත. හෝමාගම නගරයේම මෙයට අනෙක් උදාහරණය වන්නේ, අප පළාත් සභාව යටතේ ඉදි කරන ලද නව බස් නැවතුම්පොලයි. ජනතා මුදල් කෝටි ගණනින් වැය කොට, ඉදි කිරීම් කර එම ස්ථාන අයාලේ යාමට සලස්වා ඇත. අවසානයේදී රාත්‍රී කාලයේදී එම ප්‍රදේශය අවට සිටින ගවයින්ගේ, මී හරකුන්ගේ රාත්‍රී නවාතැන් පොලවල් බවට මේ ස්ථාන දැන් පත් වී ඇත. (බාධා කිරීම්) හෝමාගම බස් නැවතුම්පොලත්, සතිපොළ භූමියත් අද පත්ව ඇත්තේ මේ ඉරණමට ය. හරකුන් කථා කරනවා හරක්, ගැන කථා කරන කොට.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ප්‍රාදේශීය සභාවේ කටයුතු මේ වන විට සිදු වන්නේ, කොමසාරිස් පාලනය යටතේය. ඔවුන් දැන් වෙළඳුන්ට යෝජනා කරන්නේ පොලේ වෙළඳාම් කිරීම සඳහා ස්ථාන ලබා දීමට එක් අයෙකුගෙන් ආරම්භයේදී රු. 12,500/- ක බදු ගාස්තුවක් ලබා දෙන

[ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි]

ලෙසය. මේ වෙළඳුන් යනු පාරම්පරිකව මෙහි වෙළඳාම් කරන ලද සමහර විට වත්තේ, පිටියේ වැවෙන පළතුරු, එළවලු ගෙනැවිත් විකුණා ගන්නා වෙළෙන්දෝය. සමහර විට දෛනික තොග පවා රු. 12,500/- ට අඩු කුඩා වෙළෙන්දෝය. එසේම මෙම පොළ යනු තමන් විසින්ම හදා ගත් පොළක කාලයක් තිස්සේ තමන්ටත් මුදලක් උපයා ගන්නා අතර, ප්‍රදේශයේ පාරිභෝගිකයන්ට විශාල සේවයක් කරන හොඳ මානව සම්බන්ධයක් සහිත ගම්වල ජීවත් වන මිනිස්සුන්ගේ ආහාර සංස්කෘතියේ, පාරිභෝජන සංස්කෘතියේ අංගයකි. එහෙයින් ප්‍රමාද නොකොට ඉදි කිරීම් අවසන්ව ඇති පොළ භූමිය මහජන අවශ්‍යතාවය වෙනුවෙන් යෙදවීමට අවශ්‍ය පියවර වහා ගත යුතුය. පළාත් පාලන විෂය භාර නව මහ ඇමතිතුමාගේ විශේෂ අවධානය යොමු කොට තම අධීක්ෂණ බලය නිසි ලෙස යොදවා මහජන සුභ සිද්ධිය සඳහා අවශ්‍ය පියවර ගන්නා ලෙස කාරුණිකව ඉල්ලා සිටිමු. එසේම නව බස් නැවතුම් පල ඉදි කිරීමේදී ද මහජන මුදල් අක්‍රමිකතාවයකට ලක් වූ බවට තොරතුරු ඇත. ඒ පිළිබඳව නිසි පරීක්ෂණ සිදු කොට වගකිවයුත්තන් සොයා අවශ්‍ය පියවර ගැනීම පළාත් සභාවේ වගකීමකි. මේ පිළිබඳව නව විෂය භාර අමාත්‍යවරයාගේ නිසි අවධානය යොමු කරවන ලෙස ද ඉල්ලා සිටිමු. බොහොම ස්තූතියි.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පසුගිය සභා වාරයේදී මම මතු කළා, එක් කාරණයක්. විශේෂයෙන්ම මේ පළාතේ ජනතාවට බලපාන ප්‍රශ්න පිළිබඳව. පළාතේ ජනතාවට ඒ ඒ අමාත්‍යාංශවලින් කෙරෙන කටයුතු පිළිබඳව යම් ප්‍රශ්නයක් මතු කළාම, ඒ පිළිබඳව සලකා බලා සාධාරණ ලෙස කටයුතු කිරීමේ යුතුකමක් වගකීමක් මන්ත්‍රීවරුන්ට, ඇමතිවරුන්ට අපේ ප්‍රධාන අමාත්‍යවරයාට තිබෙනවා. අපි මේ පළාත් සභාවේ යහපාලනය ගැන කථා කරනවා. සම්මුතිවාදය ගැන කථා කරනවා. හැබැයි, පළාතේ ජනතාවට බලපාන ප්‍රශ්න පිළිබඳව සම්මුතිවාදී ලෙස කටයුතු කරන්න බැහැයි කියන එක තමයි මේකෙන් ගම්‍ය වෙන්නේ, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. යම් යම් නිලධාරීන් පත් කිරීම පිළිබඳව පසුගිය සභාවේදී මම කථා කරලා මේ සභාව දැනුවත් කළා. නමුත් ඉතාමත් කනගාටුවට කාරණය. මේ පළාත් සභාවේ මුඛ්‍ය අරමුණ ඉටු වන ආකාරයෙන් සකස් කරලා තිබෙන ප්‍රඥප්තිවලට පවා එරෙහිව යමින් යම් යම් පත් කිරීම් සිදු කරලා තිබෙනවාය කියලා දැන් පැහැදිලි වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, 1992 අංක 02 දරන මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා ප්‍රඥප්තිය. ඒකේ මෙන්න මෙහෙම සඳහන් වෙනවා.

*"යම් තැනැත්තෙකු අධිකාරියේ සාමාජිකයෙකු ලෙස පත් කිරීමට ප්‍රථම ඒ තැනැත්තා විසින් පළාත් අධිකාරියේ සාමාජිකයකු වශයෙන් ඔහුගේ කර්තව්‍ය ඉටු කරනු ලැබීම කෙරෙහි හානිකර අන්දමින් බලපෑ හැකි මූල්‍ය හෝ වෙනත් සම්බන්ධතා ඔහු සතුව නොමැති බවට පළාත් අමාත්‍යවරයා සෑහීමකට පත් විය යුතුය."*

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම එදා මතු කළා, එම්.එම්.එම්. අම්ජාඩ් කියන පුද්ගලයා ගැන. ඔහු කලින් ඉංජිනේරුවරයෙක් ලෙස කටයුතු කළ කෙනෙක්. ඔහු ඉංජිනේරුවෙකු ලෙස කටයුතු කරපු කාලයේ හොර අත්සන යොදලා, මුදල් ලබා ගැනීමේ වංචාවකට සම්බන්ධ වුණා. ඔහු සතුව ව්‍යාපාරයක් තිබෙනවා. සදර්න් කන්ස්ට්‍රක්ෂන්. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ සදර්න් කන්ස්ට්‍රක්ෂන් එකට තවම මුදල් ගෙවන්න තිබෙනවා. මේ සමාගමේ කටයුතු පිළිබඳව ප්‍රශ්න තිබෙනවා. කලක් මේක අසාදු ලේඛන ගත කරලා තිබුණා. මොහුගේ කටයුතු. එහෙම තිබෙද්දී, මේ පුද්ගලයා සභාපතිවරයා බවට පත් කරනවා. මේ පළාත් සභාවේදී මතු කරපු කාරණය. මේ අමාත්‍යවරයා ඉතාම නිර්ලජ්ජිත විධියට - අපි කනගාටුවට පත් වෙනවා. සම්මුතිවාදය මොකක්ද? මේක අහක දාලා මේ පුද්ගලයාව පත් කරනවා. මේ පුද්ගලයා පිළිබඳව මීට වඩා වාර්තා මා ළඟ තිබෙනවා. මම මේවා සභාගත කරන්න සූදානම්.

මට මතකයි, පසුගිය දවසක ජනාධිපතිවරයා කියනවා. මොකක්ද ජනාධිපතිවරයා කියන්නේ? මින් මතුවට රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවලට සභාපතිවරු, අධ්‍යක්ෂවරු පත් කිරීම අගමැතිවරයාගේ සහ මාගේ

උපදෙස් මත පොදු කමිටුවක නිර්දේශ යටතේ සිදු කරන බව ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා ප්‍රකාශ කරලා තිබුණා. මේ පළාත් සභාව තුළටත් ඒක ගේන්න ඕනෑය කියලා, මම දන්න හැටියට ආණ්ඩුකාරවරයා දැනුම් දීමක් කරලා තිබෙනවා. නමුත් මේ සියල්ල වතුරේ යැව්වා. ඒ නිසා මේ සම්මුතිවාදයෙන් වැඩක් නැහැ. මේ ඇමතිවරු මතක තියාගන්න ඕනෑ, මෛත්‍රිපාල සිරිසේන මහත්තයාව බලයට ගේන්න අපිත් දිවි පරදුවට තියලා කටයුතු කළාය කියන එක. ඒ නිසා ඒ සම්බන්ධයෙන් කටයුතු කළ යුතුයි.

මම අවධානයට ලක් කරන ඊළඟ කාරණය. මම එදා මතු කළා, මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියට අයිවන් සනත් කියන පුද්ගලයා පත් කිරීම පිළිබඳව. මේ එතුමාගේ Personel file එකේ තිබෙන තොරතුරු. එතුමාගේ උප්පැන්න සහතිකයේ තිබෙන උපන් දිනය නොවෙයි එතුමාගේ මේ තනතුරක් සඳහා ඉල්ලා යවපු මේ අයදුම්පත්‍රයේ තිබෙන්නේ. මෙතුමා O/L වලට කලින් A/L කරලා. O/L ප්‍රතිඵල සහතිකය නැහැ. මම මේ නිග්‍රහ කරන්න කියනවා නොවෙයි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, එතුමා බොරැල්ල කලාප කළමනාකාරවරයාව ඉන්දැද්දී කඩ කාමර වගයක් එයාගේ හිතවත් කාන්තාවකට ටෙන්ඩර් පටිපාටියෙන් පිට දීලා, ඒ පිළිබඳ පරීක්ෂණයක් කළා. මෙතුමා වග කියන්න ඕනෑ. උපාලි කොඩිකාර ඇමතිතුමා. එතුමා මේ පරීක්ෂණයේ ප්‍රතිඵල එළියට දුන්නේ නැහැ. ඒ නිසා අයිවන් සනත් කියන පුද්ගලයාට විරුද්ධව තිබෙන චෝදනා ගණනාවක් එදා පළාත් සභාවේදී මම කිව්වා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, හැබැයි ඒ එකක්වත් සැලකිල්ලට අරන් නැහැ.

ඒ විතරක් නොවෙයි. මේ අයිවන් සනත් කියන මිනිහා ගිහිල්ලා කයිවාරු ගහනවා, මට දැන් සභාපතිකම හම්බ වෙනවා. මම කිදෙල්පිටියගේ කට වහලා තියෙන්නේ කියලා. මේ පළාත් සභාවේදී මන්ත්‍රීවරයෙක් යම් ප්‍රකාශයක් කළාම, මේ ඇමතිවරුන්ගේ ආශීර්වාදයෙන් එළියේ ගිහිල්ලා අපව විවේචනය කරනවා. ඒ නිසා මේ මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාද කඩ කරන්න දෙන්න එපා. මේ පළාත් සභාවේ අපි කථා කරන්නේ, මේ පළාතේ ජනතාවගේ සුභ සිද්ධිය උදෙසා. එහෙම නම් මේ ඇමතිවරුන්ට, මන්ත්‍රීවරුන්ට ඒ ගැන වගකීමක් නැත්නම් ඇයි අපි මෙතැන ඉඳගෙන ඉන්නේ. මේ හිතවත්කම්වලට ඇමතිවරු පත් කළාට අපට කමක් නැහැ. හැබැයි, ඇමතිවරයා නිවැරදි ලෙස කටයුතු කරන්න ඕනෑ. මම එදා ආණ්ඩුකාරතුමා මතු කරපු කාරණය, මහ ඇමතිතුමා එදා වැඩ භාර ගන්න වෙලාවේ මතු කරපු කාරණය, මම එදා මතක් කළා මේ සභාවට. ඒ නිසා දැන් මේ කරුණු ඇහෙන්නේ නැහැ වාගේ ඉන්න පුළුවන්.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අවසාන වශයෙන් මම ඊයේ ගරු ආණ්ඩුකාරතුමාට මේ බව ලිපියකින් දැනුම් දුන්නා. ඒ නිසා ආණ්ඩුකාරතුමා ගන්නා පියවර ගැන මම බලාගෙන ඉන්නවා. මම පැහැදිලිව කියනවා, මේ අමාත්‍යවරු මේ විධියට කටයුතු කළොත් මේ අමාත්‍යවරයාට මේකට විශාල මිලක් ගෙවන්න සිද්ධ වෙනවා කියලා. ඒ මිල ගෙවන තැනට අපි පත් කරනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ නිසා මේ සම්බන්ධයෙන් පියවරක් නොගත්තොත් මීට වඩා දැඩි පියවරකට යන බව මතක් කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සුසිල් කිදෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා මම හිටපු ඇමතිවරයා හැටියට මගේ නම ප්‍රකාශ කරලා කිව්වා.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

නම කිව්වේ නැහැ.

[සභාවේ ඝෝෂා]

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඇමතිතුමා, ඔබතුමා වාඩි වෙන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මම ඇමතිවරයා විධියට ඉන්න කාලයේ මෙතුමා කියපු විධියට පරීක්ෂණයක් තිබුණු එක ඇත්ත. පරීක්ෂණ වාර්තාව අවසන් වෙලා තිබුණේ නැති නිසා මට ඒකට දඬුවමක් කරන්න බැරි වුණා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

හරි. බොහොම ස්තුතියි. මීළඟට කිත්සිරි -

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔබතුමාට මේ සභාවේ මන්ත්‍රීවරු control කර ගන්න බැරි නම් මේගොල්ලෝ දොට්ට දාන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මීළඟට කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔබතුමාගේ මාර්ගයෙන් මම මේ ගරු සභාවටම අද ඉතාමත්ම වැදගත් ලේඛනයක් සභාගත කරන්න බලාපොරොත්තු වෙනවා. මොකද, පළාත් සභාවේ ආණ්ඩුකාරතුමා විසින් සියලුම අමාත්‍යවරයන්ගේ විෂයයන් ගැසට් කරලා තිබෙනවා. ඒ ගැසට් පත්‍රය මම මේ සභාවට සියලුම මන්ත්‍රීවරුන්ගේ දැන ගැනීම සඳහා යොමු කරන්න කැමැතියි.[1] මම ඔබතුමාගේ මාර්ගයෙන් මගේ ඉල්ලීම භාර දුන්නේ, බස්නාහිර පළාත් සභා බල ප්‍රදේශයේ පළාත් පාලන ආයතනවල තිබෙන අර්බුදකාරී තත්ත්වයක් ගොඩ නැගිලා තිබෙනවා.

මේ පළාතේ ග්‍රාමීය ප්‍රාදේශීය සභාවල නාගරික සංවර්ධන වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න RDA එකෙන් ව්‍යාපෘති කිහිපයක් පසුගිය දවස්වල ක්‍රියාත්මක වුණා. විශේෂයෙන්ම මම මතක් කරලා දෙන්න ඕනෑ, මා නියෝජනය කරන බුලත්සිංහල ආසනය අපේ ලලිත් වර්ණකුමාර ගරු මන්ත්‍රීතුමා දන්නවා. එතුමන්ලාත් අපිත් එකතු වෙලා ඉතාමත් අලංකාර ලෙස බුලත්සිංහල නගරය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ප්‍රධානම නගරය තුළ විදුලි ආලෝකය දල්වන්න සැලසුම් කරලා, ඒ වාගේම මාර්ග පුළුල් කරලා, පදික වේදිකාවල් ඇති කරලා, පසුගිය කාලයේ දැවැන්ත සංවර්ධනයක් ඇති කරලා දුන්නා. නමුත් වර්තමානයේදී ඒ වෙළඳ ව්‍යාපාරික ප්‍රජාවත්, ඒ ප්‍රදේශයේ ජනතාවත් අපෙන් ඉල්ලීමක් කළා, මේ නවීකරණය කරලා තිබෙන නගරයට අවශ්‍ය විදුලි පහන් ටික දල්වා ගැනීම සඳහා ප්‍රාදේශීය සභාවත් එක්ක RDA එක ගිවිසුම් ගත වෙන්න ඕනෑලු. RDA එකේ මූල්‍ය ප්‍රතිපාදන යොදවලා ප්‍රාදේශීය සභාවට භාර දෙන්න කැමැත්ත ඉල්ලුම් කරලා ලිපියක් යැව්වත්, ඒ ප්‍රාදේශීය සභාවේ දැන් මහජන නියෝජිතයින් නැති නිසා ඒ ඉන්න ලේකම්තුමිය භය වෙලා ඉන්නවා, ඒ විදුලි බිල ගෙවීමේ වගකීම එතුමියට භාර ගන්න සිද්ධ වෙයිද කියලා.

එහෙම නම් මෙන්න මේ ප්‍රශ්නය උඩ - ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ අවධානයට යොමු කරන්න කැමැතියි. බුලත්සිංහල ප්‍රාදේශීය සභාවේ ලේකම්වරියට ඔබතුමා දැනුම් දීමක් කළොත් මේ විදුලි බිල ගෙවීමේ ප්‍රශ්නයක් ඇති වෙන්නේ නැහැ. මොකද, ඒ නගරයේ වීදි ලාම්පු 25 ක් කලින් සවි කරලා තිබුණා. අලුතෙන් සවි කරලා තිබෙන්නේත් වීදි ලාම්පු 25 යි. එහෙම නම් අන්න ඒ පරණ විදුලි ලාම්පු ටික ඉවත් කරලා, අලුත් ඒවාට සම්බන්ධීකරණය ලබා දීම සඳහා කටයුතු කරන්න. ඔබතුමාගේ මාර්ගයෙන් මම ඉල්ලීමක් කරන්න කැමැතියි. බුලත්සිංහල ප්‍රාදේශීය සභාවේ ලේකම්වරියට දැනුම් දීලා ඉතාමත් ඉක්මණින් මෙවැනි දැවැන්ත අලංකාර වැඩ පිළිවෙළක් කරපු බුලත්සිංහල ප්‍රාදේශීය සභාවේ ප්‍රධානම නගරය විධිමත් කරන්න කටයුතු ක්‍රියාත්මක කරන්නය කියන එක ඔබතුමාගේ මාර්ගයෙන් ගරු ප්‍රධාන අමාත්‍යතුමාට යොමු කරන්න කැමැතියි. බොහොම ස්තුතියි.

[1] කථාව අවසානයේ පළ කර ඇත.

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම පෞද්ගලික පැහැදිලි කිරීම් තුළ සටහන් කළේ අපේ කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමා කිව්වා හා සමානව බුලත්සිංහල නගරය මීට පෙර ඉතා දුෂ්කර නගරයක්. ඒ වාගේම දුෂ්කර ප්‍රදේශයක් හැටියට තිබිලා පසුගිය වකවානුවල ඒක ඉතාමත් සීඝ්‍රයෙන් දියුණු තත්ත්වයට ගෙනැල්ලා, ඒ ප්‍රදේශයේ ඉන්න ජනතාවට අත්‍යාවශ්‍ය කාරණාවක් හැටියට බස් ඩිපෝ එකක් - අපේ හිටපු අමාත්‍ය, ඒ වාගේම සංවිධායක නිර්මල කොතලාවල මැතිතුමා සමඟ බස් ඩිපෝ එකක් හැටියට අපි ජනවාරි මාසයේ මුල් සතියේ වැඩ නිම කරලා ඒ ගමනා ගමන මණ්ඩලයට භාර දෙන්න අපි කටයුතු කළා. එතැනදී ඇත්තටම බස් රථ 20 ක් මේ ඩිපෝ එකට හිමි වෙලා, ඒ බස් රථ 20 ගෙනැල්ලා ජනවාරි මාසේ මුල නවත්වලා තිබුණා. සියලු කාර්ය මණ්ඩලය එතැනට යොමු කරලා තිබුණා. නමුත් අපට ජනවාරි 08 වැනිදායින් පස්සේ ඒ කිසි බස් රථයක් දකින්න නැහැ. ඒ බිම, ලක්ෂ ගණනක් වියදම් කරපු බිම සම්පූර්ණයෙන්ම - දැන් අපේ කිහිප දෙනෙක් කථා කළා වාගේ, අර පොළ ගැන වාගේ ඒක නිකම්ම වල් වැදිලා යන තත්ත්වයට මේ වන කොට පත් වෙලා තිබෙනවා. ඇත්තටම ජනතාවට අවශ්‍ය දෙයක් තමයි අපි කරලා තිබෙන්නේ.

අපේ නිර්මල කොතලාවල හිටපු ඇමතිතුමා සමඟ මහජන නියෝජිතයෝ සියලු දෙනාම පසුගිය රජයේ අපේ මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමා යටතේ ලොකු සේවාවක් කළේ බුලත්සිංහල ජනතාවට. මොකද, බුලත්සිංහල ජනතාව හැමදාමත් බස් රථවලින් ලොකු පීඩාවකට පත් වෙනවා. අගලවත්තේ, මතුගම ඉඳලා එන කෙනෙක් සවස 7.00 න් ඉස්සෙල්ලා බුලත්සිංහලට එන්න බැරි වුණොත් රෑ 9.30, 10.00 වන තෙක් ඉන්න ඕනෑ. අගලවත්ත නගරයට වෙලා. එහෙම නැත්නම් මතුගම නගරයට වෙලා. හොරණ ඉඳන් යන කෙනෙකුට බුලත්සිංහලට යන්න රෑ 7.00 න් පස්සේ බස් එකක් නැහැ. එක්කෝ ත්‍රීවීල්වල යන්න ඕනෑ. නැත්නම් එන එන වාහනයට අත දාලා යන්න ඕනෑ. ඒවාට විසඳුමක් හැටියට, ජනතා අවශ්‍යතාවයක් හැටියට මේ දේ කළාම මේ සියල්ල සම්පූර්ණ වෙලත් ජනවාරි 08 වැනිදායින් පස්සේ අද වන තෙක් ඒ මහජනතාවගේ මුදල්වලින් ගොඩ නගපු ඒ කාර්යය ජනතා සේවයට දෙන්න බැරි තත්ත්වයක් උදා වෙලා තිබෙනවා. අන්න ඒකයි මම මතක් කළේ. මොකද, ජනතාවට අවශ්‍ය සියලු දේවල් අපි කරලා තිබෙනවා. ඒ නිසා අද එයට අවශ්‍ය අපේ ගමනා ගමන මණ්ඩලයෙන් නැතිව, අපේ ඒ ඩිපෝ එකට අවශ්‍ය සියලුම - අපි කියමු අටේ යතුර කියලා. අටේ යතුරේ ඉඳලා සියලුම ආම්පන්න ටික, ඒ සියලුම කාර්ය මණ්ඩලයට නිදා ගන්න ඇඳවල් ටික, ඒ සියලුම දේවල් ටික අපි සපුරලා දීලත් මේක කර ගෙන යන්නේ නැති තත්ත්වයට තිබෙනවා. ඒ ගැන මධ්‍යම රජයේ අවධානය යොමු කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මොකද, බුලත්සිංහල ජනතාවගේ ලොකු අපහසුතාවයක් ගමනාගමනය තුළින් දකිනවා. ගංගාවලින් එගොඩ වෙන්න ඕනෑ. විදුලිය නැති ප්‍රදේශ තිබෙනවා. ඒ නිසා ඒ හැම දේටම ලොකු විසඳුමක් හැටියට තමයි මේ දේ අපි බිහි කළේ. ඇත්තටම ඒකේ වටිනාකම අද ජනතාවට ලැබිලා නැහැ. ඒ නිසා ඒ වෙනුවෙන් වගකියන, ඒ වෙනුවෙන් කටයුතු කරලා, කඩිනමින් මෙය ජනතා සේවයට පත් කරන්න අවශ්‍ය කටයුතු කරන්නය කියලා ගරු නියෝජ්‍ය සභාපතිතුමාගේ මාර්ගයෙන් මේ අවස්ථාවේදී මධ්‍යම රජයේ ඒ අදාළ ඇමතිතුමා ඇතුළු අයට මම යොමු කරනවා. බොහොම ස්තූතියි.

# පෞද්ගලික මන්ත්‍රී යෝජනාව : I
PRIVATE MEMBERS MOTION: I

## පළාතේ පාසල් දරුවන්ගේ දෙමව්පියන්ගෙන් මුදල් එකතු කිරීම නතර කිරීම
TERMINATING MONEY COLLECTING FROM SCHOOL CHILDREN'S PARENTS OF THE PROVINCE

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පහත සඳහන් යෝජනාව මම ඉදිරිපත් කරනවා.

*"බස්නාහිර පළාත තුළ මේ වන විට පාසල් දරුවන්ගෙන් දෙමව්පියන්ගෙන්, විටින් විට මුදල් අය කිරීම් සිදුවේ. පළමුවන ශ්‍රේණිය, හයවන ශ්‍රේණිය සහ දොළොස්වන ශ්‍රේණිය සඳහා දරුවන් ඇතුළත් කර ගැනීමේදී මෙන්ම වෙනත් පන්තිවල අවශ්‍යතා සඳහා ද දරුවන්ගේ දෙමවුපියන්ගෙන් මෙලෙස මුදල් එකතු කිරීම නිසා ඔවුන් ඇඩි දුෂ්කරතාවයට පත්ව ඇත. එබැවින් බස්නාහිර පළාත*

[ගරු මහින්ද ජයසිංහ]

*තුළ දරුවන්ගේ දෙමවුපියන්ගෙන් මුදල් එකතු කිරීම (පහසුකම් ගාස්තු හැර) නතර කළ යුතු යැයි මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව අදහස් කරයි."*

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

***[විසින් ස්ථිර කරන ලදී. ]***
*[Seconded]*

[අ.භා. 12.03]

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විශේෂයෙන්ම මෙම යෝජනාව මා විසින් ඉදිරිපත් කරලා දැන් සැලකිය යුතු කාලයක් වෙනවා. න්‍යාය පත්‍රයේත් මාස ගණනාවක් තිස්සේ දිගින් දිගටම දිග්ගැස්සුනා. කෙසේ වෙතත් මේ මොහොතේ හරි මේ යෝජනාව සාකච්ඡාවට ගැනීමට අවස්ථාව ලැබීම පිළිබඳව සතුටු වෙනවා. විශේෂයෙන්ම මේ ප්‍රශ්නය මම මේ වසරේ මුල ඉදිරිපත් කළේ. මොකද, මේ වසරේ මුලදී තමයි මේ ප්‍රශ්නය බරපතළ විධියට මේ ප්‍රදේශයේ ජනතාවට, අපේ පළාතේ ජනතාවට විශේෂයෙන්ම දැනුනේ. නමුත් මේක එතැනින් අවසන් වන ප්‍රශ්නයක් නොවෙයි. හැම වසරකම, හැම මොහොතකම දෙමව්පියෝ බරපතළ ලෙස පීඩාවට පත් වන ප්‍රශ්නයක්. විශේෂයෙන්ම දැන් අපි කවුරුත් දන්නවා, අධ්‍යාපනය සඳහා මේ වන විට පවතින වර්තමාන ආණ්ඩුවත්, ඔවුන්ගේ පැත්තෙන්, ඔවුන්ගේ ප්‍රතිපත්ති ප්‍රකාශවල. ඒ වාගේම 2015 ජනවාරි 08 වැනදා ජනාධිපතිවරණයේදී. ඒ වාගේම අගෝස්තු 17 මහ මැතිවරණයේදී. මේ අවස්ථා දෙකේදීම රටේ ජනතාවට පොරොන්දු වුණා, අධ්‍යාපනය සඳහා දළ ජාතික නිෂ්පාදනයෙන් 6% ක් වෙන් කරන බවට. අපි කවුරුත් දන්නවා. අධ්‍යාපනය සඳහා දළ ජාතික නිෂ්පාදිතයෙන් 1977 වාගේ වෙන කොට 6% කට ආසන්න මුදලක් වෙන් වුණා. නමුත් ක්‍රමානුකූලව වසරින් වසර අයවැය මගින් එම ප්‍රතිපාදන කප්පාදු කරනු ලැබුවා.

**ගරු සුමිත් ලාල් මෙන්ඩිස් -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Sumith Lal Mendis - Chief Government Whip

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අධ්‍යාපන ඇමතිතුමා මෙතැන නැහැ. එතුමාව පොඞ්ඩක් ගෙන්නුවා නම් හොඳයි. අධ්‍යාපන ඇමතිතුමාගේ අවධානයට යොමු වෙන්න ඕනෑ මේ ප්‍රශ්නය. අධ්‍යාපන ඇමතිතුමා එහා පැත්තේ ඉන්නවා නම් කැඳෙව්වා නම් හොඳයි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

න්‍යාය පත්‍රයේ තිබෙනවා. එතුමා දැන ගන්න ඕනෑ, මේ වෙලාවේ එතුමා සම්බන්ධව -

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

බොහොම ස්තුතියි. අවධානය යොමු කිරීම සම්බන්ධව.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු සංවිධායකතුමා, ඔබතුමා පණිවිඩයක් යවලා ගෙන්වන්න. ගරු මන්ත්‍රීතුමා කථා කරන්න.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

සුමිත් ලාල් මැන්දිස් ආණ්ඩු පක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමාගේ ඒ අවධානය යොමු කිරීම පිළිබඳව බොහොම ස්තුතිවන්ත වෙනවා. ඒ නිසා දැන් ප්‍රශ්නය මතු වෙලා තිබෙන්නේ මෙන්න මේ මූලික කාරණයත් එක්ක. මේ අධ්‍යාපනය සඳහා වෙන් කරන ප්‍රතිපාදන සෑම වසරකම අයවැයෙන් කප්පාදු කිරීමේ ප්‍රතිඵලයක් විධියට තමයි දෙමව්පියෝ මත මේ බර පැටවිලා තිබෙන්නේ. 2015 සඳහා ඉදිරිපත් කරපු අයවැයෙන් 1.2% යි දළ ජාතික නිෂ්පාදිතයෙන් වෙන් කළේ. මේක 2012 දී 1.86% ක් වුණා. 2013 දී 1.5 දක්වා බැස්සා. මේ විධියට ක්‍රමානුකූලව අඩු වෙලා ඇවිල්ලා දැන් වන කොට 1.2% දක්වා බැහැලා තිබෙනවා. විශේෂයෙන්ම අපට මතකයි පසුගිය කාලයේ විශේෂයෙන්ම අධ්‍යාපනය සම්බන්ධයෙන් ලොකු සංවාදයක් ඇති වුණා. අපේ රට ආසියාවේ දැනුමේ කේන්ද්‍රය බවට පත් කරනවා කියලා තමයි කයිවාරු ගැහුවේ. හැබැයි, සිද්ධ වුණේ මොකක්ද? 2006 දී අධ්‍යාපනය සඳහා අයවැයෙන් 2.8% ක් වෙන් කළා. 2015 වන කොට 1.2% දක්වා ඒක පල්ලම් බැස්සා. ඒක තමයි සිදු වුණේ. එහි ප්‍රතිඵලයක් විධියට තමයි බස්නාහිර පළාතේත් මම මේ ගෙනැල්ලා තිබෙන යෝජනාවට අනුව පාසල් නඩත්තු කිරීම සඳහා දෙමව්පියන්ට අධික බරක් දරන්න සිදු වෙලා තිබෙන්නේ.

ඒ නිසා විශේෂයෙන්ම දැන් මා කැමැතියි, ඔබතුමාගේ අවධානයට යොමු කරන්න. විශේෂයෙන්ම දෙමව්පියන්ගේ කර මත මේ පාසල් නඩත්තු කිරීමේ බර පටවන්න මූලිකම අඩිතාලම වැටුණේ මෙන්න මේ චක්‍රලේඛය හරහා. මේ චක්‍රලේඛය 2008/35. 2008.09.15 වැනිදා නිකුත් කරපු පාසල් නගා සිටුවීමේ නියාමන වැඩ සටහන. එවකට අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් එම්.එම්.එන්.ඩී. බණ්ඩාර මහතා විසින් තමයි මේ චක්‍රලේඛයට අත්සන් කළේ. මේ හරහා පාසල් -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

අධ්‍යාපන ඇමතිතුමා මේ අවස්ථාවට සම්බන්ධ වුණා. ඔබතුමා කථා කරන්න.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මේ චක්‍රලේඛය රටේ නියාමන ව්‍යාපෘතියක් විධියට තමයි ක්‍රියාත්මක කළේ. තෝරා ගත්ත පාසල් කිහිපයක. කලාප 18 ක පාසල් කිහිපයක් තෝරා ගෙන. ඊට පස්සේ 2009 දී මේ චක්‍රලේඛය මුළු රටේම සියලුම පාසල්වලට අදාළ වන විධියට බලාත්මක කළා. සියලුම පාසල්වලට අදාළ වන විධියට මේ චක්‍රලේඛයම බලාත්මක කළා. පාසල් නඩත්තුව සඳහා දෙමව්පියන්ගෙන් මුදල් එකතු කිරීම, ඒ සඳහා විවිධ ව්‍යාපෘති දියත් කිරීම, ඊළඟට දෙමව්පියන්ගේ, සුභ පතන්නන්ගේ මුදල් එකතු කිරීම ආදී කරුණු ගණනාවක් උදෙසා මේ චක්‍රලේඛය මගින් ඉඩකඩ සැලසුවා. එතැන් පටන් මේ කරුණුම පාවිච්චි කරමින් සමහර විදුහල්පතිවරු - අපි කවුරුත් දන්නවා. සියලුම දෙනාට මේකේදී දොස් කියන්න බැහැ. සමහර විදුහල්පතිවරු මේක ආයුධයක් බවට පත් කර ගෙන විවිධ මූල්‍ය අක්‍රමිකතා සිදු කරන තැනට පත් වුණා. ඉතින් මේ තත්ත්වය වෙනස් කළ යුතුව තිබෙනවා. නමුත් අවසානයේදී මොකක්ද සිද්ධ වුණේ? අපි දන්නවා. ජනවාරි 08 වැනිදා යහපාලන ආණ්ඩුව නිර්මාණය වුණාට පස්සේ - මේ තිබෙන්නේ, ජනවාරි මස 29 වැනිදා 05/2015 යනුවෙන් පාසල්වල අවිධිමත් ලෙස මුදල් අය කිරීම තහනම් කිරීම කියලා නිකුත් කරපු චක්‍රලේඛය. මේකේ මාතෘකාව නම් හරි ෂෝක්. මොකක්ද? පාසල්වල අවිධිමත් ලෙස මුදල් අය කිරීම තහනම් කිරීම. නමුත් මේ චක්‍රලේඛයේ 06 වන වගන්තියේ මොකක්ද කියන්නේ. මේ යහපාලන ආණ්ඩුවේ අකිල විරාජ් කාරියවසම් අධ්‍යාපන ඇමතිතුමාගේ යටතේ උපාලි මාරසිංහ අධ්‍යාපන ලේකම්තුමා නිකුත් කරපු චක්‍රලේඛය. මේකේ 6 වන වගන්තියේ මෙහෙම කියනවා. පාසලේ අත්‍යාවශ්‍ය වියදම් ඇස්තමේන්තුවක් සකසන්න ඕනෑ. එම ඇස්තමේන්තුව අනුව අධ්‍යාපන අමාත්‍යාංශයෙන් හෝ වෙනත් රාජ්‍ය ආයතනවලින් හෝ ලැබෙන මුදල් පුරෝකථනය කොට 'අ' සහ 'ආ' අතර පරතරය ගණනය කිරීම. ඒ කියන්නෙ අර ලැබෙන මුදලුයි, පාසලේ මුළු අවශ්‍යතාවයයි ගණනය කරලා, මේ දෙක අතරේ පරතරය ගණනය කරන්න ඕනෑ. මේ දෙක අතරේ පරතරය ගණනය කරලා, ඊළඟට මොකක්ද කරන්නේ? එම පරතරය පාසලේ සිසුන් සංඛ්‍යාවෙන් බෙදා, එක් සිසුවකට අදාළ වන මුදල් ප්‍රමාණය ගණනය කිරීම. මේ අවශ්‍ය මුදල් ප්‍රමාණය ගණනය කරලා, ඒක බෙදන්න ඕනෑ පාසලේ ශිෂ්‍ය සංඛ්‍යාවෙන්. ඊට පස්සේ ඒක එකතු කරන්න පුළුවන්. *"ඒ අනුව සකස් කළ වාර්තාව අධ්‍යාපන අමාත්‍යාංශයට එවා, එක් සිසුවෙකුගෙන් පාසලේ වියදම් පියවා ගැනීමට අවශ්‍ය මුදල් අය කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීම."* එතකොට ජාතික පාසල්වල නම් යවන්න ඕනෑ, ඡේඛීය අධ්‍යාපන අමාත්‍යාංශයට. පළාත් සභා පාසල්වල නම් ඒක පළාතේ අධ්‍යාපන ලේකම්වරයාට යවලා අනුමැතිය ගන්න ඕනෑ. මේ මොකක්ද කියන්නේ? මේ වෙන මොකක්වත් නොවෙයි. අනුමැතිය අරගෙන, මේ මුදල් එකතු කිරීම නීත්‍යානුකූල කරලා තිබෙන්නේ. ඒ නිසා අපි යෝජනා කරනවා. දැන් මේ ආණ්ඩුව දිගින් දිගටම කියමින් ආවා අධ්‍යාපනය සඳහා 6% ක් වෙන් කරනවාය කියලා. අපි දැක්කා පසුගිය දවස්වල අගමැතිතුමාත් ප්‍රසිද්ධියේ කියනවා, අධ්‍යාපනය සඳහා දළ ජාතික නිෂ්පාදිතයෙන් 6% ක් වෙන් කරනවාය කියලා. හැබැයි, මේ ආණ්ඩුවේ අධ්‍යාපන ඇමතිවරයා මොකක්ද කරලා තිබෙන්නේ? කලින් දින 100 දී හිටියේත් මේ අධ්‍යාපන ඇමතිමයි. අද ඉන්නේත් මේ ඇමතිමයි. ඒ ඇමති යටතේ චක්‍රලේඛ නිකුත් කරනවා, පාසල්වල මුදල් එකතු කිරීම නීත්‍යානුකූල කරලා.

ඒ නිසා අපි පළාත් සභාව ලෙස එක පැත්තකින් මේ චක්‍රලේඛයට විරෝධය පළ කළ යුතුයි. අපට ප්‍රතික්ෂේප කරන්න බැහැ. ඡේඛීය අමාත්‍යාංශයෙන් ගහන චක්‍රලේඛයක් මුළු රටටම අදාළයි. හැබැයි, මේ චක්‍රලේඛයට විරෝධය පළ කළ යුතුයි. මේක මේ පළාතේ විතරක් නොවෙයි. මුළු රටේම දරුවන්ගෙන් මුදල් එකතු කිරීම නීත්‍යානුකූල කරලා තිබෙන්නේ. දැන් හරි පැහැදිලියි. මම පාසල් වශයෙන් කියන්න අවශ්‍ය වෙන්නේ නැහැ. විපක්ෂයේත්, ආණ්ඩු පක්ෂයේත් ගරු මන්ත්‍රීවරු හැමෝම

දන්නවා, බරපතළ විධියට පාසල්වල මුදල් එකතු කරනවා. එතකොට දැන් එහෙම කරන්නේ ඇයි? එහෙම කරන්න සිද්ධ වෙලා තිබෙනවා. දැන් එහෙම නොකර, පාසල් නඩත්තු කරන්න බැහැ. පාසල් පවත්වාගෙන යන්න බැහැ. එහෙම නොකළොත් සිදු වෙනවා, විදුහල්පතිවරයාට පාසල තිබෙන විධියට තියාගෙන යන්න. පාසල සංවර්ධනය කරන්න බැහැ. පාසලේ වහළයක් කැඩුණාම, පාසලේ බිත්ති ටික අවපැහැ ගැන්වුණාම, එහෙම නැත්නම් ඩෙස් පුටු අබලන් වුණාම ඒවා සකස් කර ගන්න, පිළිසකර කර ගන්න දෙමව්පියන්ගෙන් මුදල් එකතු කරලා ඒ පාසල් නඩත්තු කර ගෙන යන්න විදුහල්පතිවරුන්ට සිද්ධ වෙලා තිබෙනවා. මොකද, ආණ්ඩුවෙන් දෙන මුදල් කිසිසේත්ම ප්‍රමාණවත් නැහැ.

පසුගිය කාලයේ අපට මතකයි, සුපසන් නිම්තෙර කියලා හිටපු මහ ඇමතිතුමාගේ යටතේ පාසල්වලට සුළු මුදල් ප්‍රමාණයක් වෙන් කර ගෙන ගියා. හැබැයි, ලක්ෂ 10 ක් 15 ක් ඕනෑ තැනට රු. 50,000/- ක් රු. 100,000/- ක් දෙනවා. ඒකෙන් ඒ පාසලේ සමස්ථ අවශ්‍යතාවය ඉටු කර ගන්න බැහැ. ඒ නිසා 10% ක් විතර දීලා 100% ක වැඩ කරන්න කියන්න බැහැ. ඒ නිසා දෙමව්පියන්ගෙන් මුදල් එකතු කරන්න සිදු වුණා. විදුහල්පතිවරුන්ට සිදු වෙලා තිබෙනවා, අකමැත්තෙන් හරි දෙමව්පියන්ගෙන් මුදල් එකතු කරලා මේ පාසල් නඩත්තු කර ගෙන යන්න. එහෙම නැත්නම් අවසාන චූදිතයා බවට පත් වෙන්නේ විදුහල්පතිවරයා සහ ඒ පාසලේ ගුරු මණ්ඩලය. විශේෂයෙන්ම විදුහල්පතිවරයා. මේ අහවල් විදුහල්පතිවරයාගේ යටතේ තමයි මේ පාසල කඩා වැටුණේ. මේ අහවල් විදුහල්පතිවරයා යටතේ තමයි මේ පාසල අබලන් වුණේ, අභාවයට ගියේ කියන චෝදනාව දෙමව්පියන්ගෙන් ආපිට එනවා. ඒ නිසා ඔවුන්ට සිදු වෙලා තිබෙනවා අකමැත්තෙන් හරි මුදල් එකතු කරමින් මේ පාසල් නඩත්තුව පවත්වාගෙන යන්න.

ඒ නිසා බස්නාහිර පළාතේ අපි යෝජනා කරනවා, විශේෂයෙන්ම මේ මුදල් ගැනීම වහාම නතර කළ යුතුයි. ඊළඟ අයවැය එනවා. 2016 වසර සඳහා. ඒ අයවැයේදී ප්‍රමාණවත් ප්‍රතිපාදන අධ්‍යාපනය සඳහා වෙන් කරලා - විශේෂයෙන්ම අපි හිතනවා, පළාත් සභාවට අයිති විෂයයන්වලින් ප්‍රධානම විෂය අධ්‍යාපන විෂය. පාසල් 1300 කට වඩා තිබෙනවා, අපේ පළාතේ. ඒ නිසා වැඩියෙන් අයවැයෙන් මුදල් වෙන් කරලා, මේ බස්නාහිර පළාත තුළ පාසල් නඩත්තුව සඳහා දෙමව්පියන්ගෙන් මුදල් එකතු කිරීම වහාම නතර කළ යුතුයි කියලා මම යෝජනා කරනවා. ඒ වාගේම අවධාරණය කරන්න ඕනෑ. නීත්‍යානුකූල චක්‍රලේඛ අනුව - මේ 2015 ජනවාරි 29 උපාලි මාරසිංහ මහතා අකිල විරාජ් අමාත්‍යතුමාගේ උපදෙස් මත නිකුත් කරපු 05/2015 චක්‍රලේඛයට අනුව නම් දැන් ඕනෑ විධියට සල්ලි එකතු කරන්න පුළුවන්. හැබැයි, මීට කලින් තිබුණේ නීත්‍යානුකූල ලෙස සල්ලි එකතු කරන්න පුළුවන්, 1 සිට 5 ශ්‍රේණිය දක්වා රු. 36/- ක් පහසුකම් ගාස්තුත්, පහෙන් ඉහළ හයේ සිට ශ්‍රේණි සඳහා රු. 60/- ක් පහසුකම් ගාස්තුත් පමණයි. එපමණයි එකතු කරන්න පුළුවන්. හැබැයි, මීට පිටින් දැන් මුදල් එකතු කරනවා. දැන් මේ චක්‍රලේඛයේත් ඒක නීත්‍යානුකූල කරලා තිබෙනවා. ඒ නිසා අපි යෝජනා කරනවා, බස්නාහිර පළාත තුළ මේ මුදල් එකතු කිරීම වහාම නතර කළ යුතුයි. විශේෂයෙන්ම ඇමතිවරුන්ගෙන්. පළාත් සභාවේ මහ ඇමතිතුමා ඇතුළු අමාත්‍ය මණ්ඩලයට මම යෝජනා කරනවා. ලබන අයවැයෙන් ඒ අවශ්‍ය මුදල් ප්‍රමාණ වෙන් කරලා දෙමව්පියන්ගෙන් මුදල් එකතු කිරීම සම්පූර්ණයෙන්ම නතර කළ යුතුයි. පහසුකම් ගාස්තු හැර අනෙකුත් සියලුම මුදල් එකතු කිරීම නතර කරමුයි කියලා යෝජනා කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 12.14]

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බොහොම කාලයක් න්‍යාය පත්‍රයේ තිබිලා මේ යෝජනාව අද සාකච්ඡාවට ලක් වන අවස්ථාවේදී මගේ මතකයට එන්නේ, අපි පාසල් යන කාලයේදී නම් සත පනහක පහසුකම් ගාස්තුවක් තමයි ඒ කාලේ අපෙන් අය කළේ. හැබැයි, මේ විෂය ධාරාවන් වැඩි වෙන කොට අවශ්‍යතාවයන් වැඩි වෙන කොට පාසල්වලට විවිධ අංග අලුතෙන් ඒකරාශී වන කොට රජයට හෝ පළාත් සභාවට ඒ වියදම දරන්න අමාරු අවස්ථාවක තමයි දරුවන් ඇතුළත් කිරීමේදී නීත්‍යානුකූල නොවන ආකාරයට මෙවැනි සන්තෝෂම්, එහෙම නැත්නම් විද්‍යාලයේ දියුණුව සඳහා මුදල් අය කිරීමේ ක්‍රමයක් මේ රටේ බිහි වෙලා ආවේ. දැන් අපේ යෝජනාව ඉදිරිපත් කළ ගරු මන්ත්‍රීතුමා කිව්වා, 1977 වාගේ කාලයේදී 6% කට

ආසන්න ප්‍රමාණයක් දළ ජාතික ආදායමෙන් පාසල් නඩත්තුව සඳහා, අධ්‍යාපනය සඳහා වෙන් කළා කියලා. ඉතින් අවසාන කාලය වන කොට, 2014, 2015 වන කොට මේ ප්‍රමාණය 1.4% ක, 1.2% ක ප්‍රමාණයට අඩු වෙලා තිබෙනවා. ඒ නිසා තමයි පසුගිය කාලයේ දේශපාලන වේදිකාවේ, ජනාධිපතිවරණය කාලයේත්, පාර්ලිමේන්තු මැතිවරණය කාලයේත් මේක බොහොම සාකච්ඡාවට බඳුන් වන යෝජනාවක් විධියට, විශේෂයෙන්ම එක්සත් ජාතික පක්ෂයේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේත් 6% ක් පාසල් අධ්‍යාපනය සඳහා යොදවන්නට ඕනෑය කියලා තීරණය කරලා තිබෙන්නේ. අපි විශ්වාස කරන ආකාරයට ඉදිරියේදී පැවැත්වෙන ජාතික අයවැය සකස් කරන අවස්ථාවේදී මේ සඳහා අවශ්‍ය කරන ප්‍රතිපාදන වෙන් කරයි කියන විශ්වාසය අප තුළ තිබෙනවා.

විශේෂයෙන්ම පළාත් සභා පාසල් ගැන අපි කථා කරද්දී දැන් අලුත් චක්‍රලේඛයක් ඇවිල්ලා තිබෙනවා, 2016 ඉඳලා පාසලට ළමයි ඇතුළත් කිරීමේදී ළමයි 35 කට සීමා කරන්න ඕනෑය කියලා. මෙහෙම 35 කට සීමා කරන්න ඕනෑය කියලා දැන් කටයුතු කර ගෙන යන කොට සමහර වෙලාවට මගේ පෞද්ගලික විශ්වාසය ඒ පාසලට අයිති පෝෂිත ප්‍රදේශය ඇත්ත වශයෙන්ම පන්ති පහක් හෝ හයක් තිබෙනවා නම්, ඒ අවශ්‍ය ළමයින් ප්‍රමාණය නැහැ. ඇත්ත වශයෙන්ම පිටින් තමයි මේකට ළමයි එන්නේ, මේකට ප්‍රමාණය සකස් කර ගන්න. එතකොට මොකක්ද සිද්ධ වෙන්නේ? පසුගිය කාලයේ මේ පළාත් සභාවේ පාසල්ම කීයක් වැහුණාද? සංඛ්‍යා ලේඛන දිහා බැලුවොත් එහෙම අපි දන්නවා. කැලණිය කලාපයේ, මීගමුව කලාපයේ එහෙම පාසල් විශාල ප්‍රමාණයක් වැසී ගියා. ඒ ශිෂ්‍යයෝ නැති නිසා. එතකොට මේ යෝජනාව අනුව හරියට ක්‍රියාත්මක වෙනවා නම්, මේ පාසල් නැවත සක්‍රීය කරන්නට පුළුවන්. සිසුන් ප්‍රමාණයක් පන්තිවලට ඇතුළත් කරන්න පුළුවන්. හැබැයි, එහෙම ඇතුළත් නොවෙන්නේ දෙමව්පියෝ ජනප්‍රිය පාසල් සොයා ගෙන යෑමේ ප්‍රශ්නය නිසා. එතකොට මේ අලුත් සක්‍රීය කරන පාසල්වලට අවශ්‍ය කරන මූලික පහසුකම් ටිකවත් මොනවාද කියලා අපි තෝරා ගන්නට ඕනෑ. ඒ නිසා මම හිතන්නේ, විදුහල්පතිවරු එක එක්කෙනාගේ, තම තමන්ගේ පෞද්ගලික අභිමතාර්ථයන් ඉෂ්ට කර ගන්න විවිධ විධියට පාසලට යෝජනා ගේනවා. සමහර වෙලාවට ක්‍රීඩා පිට්ටනියක් නැති පාසල් තිබෙනවා. ළමයින්ට මිදුලට බැහැලා සෙල්ලම් කරන්න බැරි තැනක්. ඒ වාගේම පන්ති කාමරයට අවශ්‍ය කරන මූලික සුදුසුකම්වත් නැති පාසල් තිබෙනවා. එතකොට මේ පළාත් සභාව හරහා ඒ මූලික පහසුකම්වත් නැති පාසල්වලට ප්‍රමුඛතාවය දෙන්න ඕනෑ.

අපි දැක්කා පසුගිය කාලයේ තමන්ගේ ප්‍රතිරූපය නංවන්න පාසල් බිහි කළා. උදාහරණයක් හැටියට ගත්තොත් එහෙම මිනුවන්ගොඩ ප්‍රදේශයේ ජාපාල වත්ත රෙජී රණතුංග කියන විද්‍යාලය. මම මේ කියන්නේ බොරුවක් නම් ගිහිල්ලා බලන්න. මොන තරම් පහසුකම් ප්‍රමාණයක් ඒ විද්‍යාලයට දුන්නාද? මම හිතන්නේ ගුරුවරුද? සම්පත්ද? එතකොට ඒ අවට තිබෙන පාසල්වලට ගිය කල දන්නවා. තමුන්නාන්සේලා මම මේ කියන කථාව විශ්වාස කරනවා නම්, මේ පළාත් සභාවේ හිටපු පරණ මන්ත්‍රීවරු දන්නවා. එක විද්‍යාලයක් නම් කර ගෙන සියලු පහසුකම් දෙනවා. එතකොට වටේ තිබෙන අනෙක් විද්‍යාල වැහිලා යනවා. ඒක තමයි පසුගිය කාලයේ සිද්ද වුණු දේ. ඒ නිසා සමහර වෙලාවට ඒ අවස්ථාව නැති කර ගන්න ඉන්න විදුහල්පතිවරයාට, එහෙම නැත්නම් පාසල් සංවර්ධන සමිතියට සිද්ධ වෙනවා, දෙමව්පියන්ගෙන් මුදල් එකතු කරලා මේ විද්‍යාලය නඩත්තු කර ගෙන යන්න අවශ්‍ය මූලික පහසුකම් ටික සොයා ගන්න. ඒ නිසා අපි පෞද්ගලිකව පාසල්වලට ළමයින් ඇතුළත් කිරීමේදී මුදල් ලබා ගැනීම සම්පූර්ණයෙන්ම නතර කරන්න ඕනෑ. ඒක මගේ පෞද්ගලික මතයක්ව තිබෙනවා. අපේ කණ්ඩායම විධියටත් මම හිතන්නේ, අපි ඒක තීරණය කරනවා. ඒක හොඳ දෙයක්. හැබැයි, එතැනදී තීරණය කරන්න ඕනෑ. පාසලේ අත්‍යවශ්‍ය අංග - දැන් මේ අලුත් අධ්‍යාපන ක්‍රමය යටතේ පළමු වැනි ශ්‍රේණිය ද, හය වැනි ශ්‍රේණිය ද, උසස් පෙළ ද - විෂය ධාරාවන් වැඩි වෙලා තිබෙනවා. පහසුකම් වැඩි වෙන්න ඕනෑ. එතකොට මේ පළාත් සභාවේ අඩුම තරමින් ඒ තිබෙන අවම පහසුකම් ටිකවත් සපුරන්න. එහෙම නැතිව ගියාම මොකක්ද සිද්ධ වෙන්නේ? මම දැන් උදාහරණයක් කියන්නම්. මම ඉන්න කලාපයේ එක විද්‍යාලයක් තිබෙනවා. උසස් පෙළ ළමයින්ට අලුතෙන් පන්තියක් හැදුවා. ඉන් පස්සේ විද්‍යා විෂය ධාරාව එතැන කර ගෙන යන කොට අවට විද්‍යාලවල ගුරුවරු ටික දුන්නාම එක ළමයයි පන්තියේ ඉතිරි වුණේ. ළමයින් විසි ගණනක් හිටපු උසස් පෙළ පන්තියේ. ඉතින් එවැනි තත්ත්වයක් තිබෙනවා. ඒ නිසා මේක නියම විධියට නියාමනය කරන්න - ඒ අධ්‍යාපන බලධාරීන් - අපි දන්නවා. දේශපාලඥයෝ වැඩිය මැදිහත් වෙනවාට කැමැති නැහැ. කථාව පටන් ගන්න කොටත් මුලදී කිව්වා, සමහර

[ගරු සිරිකමල් ෆිලිෂියන් ද සිල්වා]

අවස්ථාවලදී විද්‍යාලයේ ක්‍රීඩා උත්සවය වෙලාවට පළාත් සභාවේ මන්ත්‍රීවරයා නිකම්ම නිකම් ආරාධිතයෙක් විතරයි. හුඟක් වෙලාවට අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඉන්න අය ප්‍රධාන අමුත්තා හැටියට එනවා. ඉතින් එවැනි කටයුතු සිද්ධ වෙලා තිබෙනවා. ඒ නිසා මේවා මේ අධ්‍යාපන බලධාරීන්ගේ තනි වුවමනාවට විතරක් නොවෙයි, විශේෂයෙන්ම මේ පළාත් සභාව ඇතුළේ ප්‍රධාන ඇමතිතුමා දැන් අධ්‍යාපන විෂයෙන් ඈත් වෙලා තිබෙනවා. මම ඒක පෞද්ගලිකව දකිනවා. පසුගිය කාලවල ප්‍රධාන අමාත්‍යවරයාට අධ්‍යාපන විෂය වැටුණාම දරා ගන්න බැරි තරම් වැඩ ප්‍රමාණයක් තිබෙනවා. පළාත් පාලනය තිබෙනවා. විදුලි බලය තිබෙනවා. අධ්‍යාපනය තිබෙනවා. මහජන සාමය තිබෙනවා. මේ ඔක්කොම තිබෙනවා. හැබැයි, දැන් හුදෙකලා කරලා වෙනම අමාත්‍යවරයෙක්ව පත් කරලා තිබෙනවා. ඒක හොඳයි. (බාධා කිරීමක්) එතකොට එතුමාට පුළුවන් වෙනවා, මේ පළාත් සභාව ඇතුළේ තිබෙන දියුණු කළ යුතු පාසල් මොනවාද කියලා තමන්ට ඒ පැවරිලා තිබෙන විෂය පථය සීමා වෙලා තිබෙන නිසා මම හිතන්නේ, මීට වඩා හොඳ සේවාවක් මේ පළාත් සභාව ඇතුළේදී කරන්න.

මේ යෝජනාවේදී කියවෙන්නේ සම්පූර්ණයෙන්ම නතර කරන්නය කියලා. එහෙම නතර කරන කොට අසාධාරණයට ලක් වෙන පාසල්. ඒ පහසුකම් අත්‍යවශයෙන්ම පවත්වාගෙන යන්න ඕනෑ පාසල්. උදාහරණයක් හැටියට කිව්වොත්, සමහර විද්‍යාලවල ක්‍රීඩා ගුරුවරු නැහැ. සමහර විද්‍යාලවල සෞන්දර්යය ගුරුවරු නැහැ. සමහර විද්‍යාලවල පරිගණක විද්‍යාව උගන්වන්න ගුරුවරු නැහැ. එතකොට මොකක්ද සිද්ධ වෙන්නේ? එතකොට අනිවාර්යයෙන්ම පිටින් ගුරුවරු අරගෙන ඒ විද්‍යාලයේ අවශ්‍ය කරන කටයුතු ටික සම්පූර්ණ කර ගෙන යන්න සිද්ධ වෙනවා. දැන් මේකට තමයි උත්තරේ සොයන්න ඕනෑ. ඒ උත්තරේ සොයන කොට මුදල් සම්බන්ධව විදුහල්පතිවරයා හෝ ආචාර්ය මණ්ඩලය හෝ වෙන අපහසුතාවය ගැන හෝ අපි මොහොතක් කල්පනා කරන්න ඕනෑ. දැන් මේවා නියාමනය කරන්න ඉස්සෙල්ලා මේ තිබෙන ප්‍රශ්න මොනවාද කියන එක අපි ලබන අවුරුද්දට යන්න ඉස්සෙල්ලා, ඊළඟ මේ පළාත් සභාවේ අයවැය ලේඛනය සකස් කරන්න ඉස්සෙල්ලා මොනවාද කියන එක තේරුම් බේරුම් කර ගන්න ඕනෑ. අපි දැකලා තිබෙනවා. විශේෂයෙන්ම මේ සභාවේ හුඟක් අවස්ථාවලදී කථා කරලා තිබෙන දෙයක්. ආගම විෂය උගන්වන්න ගුරුවරු නැහැ. මේ ගැන අපි අනන්ත අප්‍රමාණ කථා කරලා තිබෙනවා. ආගම කිව්වාම, බෞද්ධාගම නොවෙයි. සමහර විද්‍යාලවල කතෝලික ආගම උගන්වන්න ගුරුවරු නැහැ. එතකොට මොකද කරන්නේ? කොළඹ අගරදගුරු පදවියේ ඉන්න පියතුමා ගුරුවරුන්ව දාලා අගරදගුරු පදවියෙන් රු. 3,000/- ක විතර දීමනාවක් දීලා ඒ කටයුතු කර ගෙන යනවා. දැන් මේවා ඒ විධියට නියාමනය නොවුණොත් මොකද සිද්ධ වෙන්නේ?අනිවාර්යයෙන්ම විදුහල්පතිවරයාට සිද්ධ වෙනවා, දරුවන් ඇතුළත් කිරීමේදී හෝ එහෙම නැත්නම් හය වන ශ්‍රේණියද, උසස් පෙළ ද, පළමුවැනි පන්ති ද සුභ පතන්නන් විධියට යම්කිසි මුදලක් ඒකරාශී කර ගන්න. ඒක තමයි මේ ප්‍රශ්නයේ මූලිකත්වය තිබෙන්නේ. ඒ නිසා අපි මේ ප්‍රශ්නයට මූලික විසඳුම සම්පූර්ණයෙන්ම නතර කරන්න ඉස්සෙල්ලා අවශ්‍ය කරන විසඳුම, යටිතල පහසුකම් ටික සපයන්න ඕනෑ කරන විසඳුම් ටික, මුදල් ටික වෙන් කර ගන්න ලබන අවුරුද්දේදී ඒ කටයුත්තට අපි පෙළ ගැසෙමු කියලා ඉල්ලා සිටිමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 12.21]

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමා හොඳ යෝජනාවක් ගෙනැල්ලා තිබෙන්නේ. නමුත් එතැනදී මේ කියවෙන්නේ පළමුවැනි පන්තියට, හයේ පන්තියට, උසස් පෙළ පන්තියට සහ වෙනත් පන්තිවලට ළමයින් ඇතුළත් කර ගැනීමේදී පහසුකම් හා සේවා ගාස්තු හැර වෙනත් කිසිම මුදලක් අය කිරීම කරන්න එපාය කියලයි. එතකොට මම හිතන්නේ මේ වන විට පහෙන් පහළ පන්තිවලට පහසුකම් හා සේවා ගාස්තු ලෙස රු. 36/- කුත්, පහෙන් ඉහළ පන්තිවලට රු. 60/- කුත් තමයි ගෙවන්නේ. මම හිතන්නේ, රජයක් වශයෙන්, පළාත් සභාවක් වශයෙන් පාසල්වලට චෝක් කෑල්ල දෙනවා. හුණුකෑල්ල. ගුරුවරයා දෙනවා. පන්ති කාමර දෙනවා. තව තවත් භෞතික පහසුකම් දෙනවා. ගුරුවරු දෙනවා. ඒ හැරුණු කොට මම හිතන්නේ, අධ්‍යාපනය කියන්නේ ඔතැනින් එහාට යනවා පාසල්වල. මේ දෙමව්පියෝ සල්ලි දීලා ඒ තැන්වලට යන්නේ ඇයි? ගමේ ඉස්කෝලේ තිබෙනවා. ගමේ ඉස්කෝලෙත් ගුරුවරු ඉන්නවා. බිල්ඩින්

තිබෙනවා. උගන්වනවා. ඒත් ඉන්නේ උපාධි ගුරුවරු. නමුත් බලාගෙන ගියාම ඊට කිලෝ මීටර් තුනක් පමණ එහා පැත්තේ ලොකුයි කියන ඉස්කෝලෙට දෙමව්පියෝ ළමයින් ඇතුළත් කරන්න උත්සාහ කරනවා. ඇයි මේ? ඒකේ ස්විමිං තිබෙනවා. ක්‍රීඩාව තිබෙනවා. බස් එකක් තිබෙනවා. ළමයින්ට පහසුකම් තිබෙනවා. ක්‍රීඩා පිට්ටනියක් තිබෙනවා. ක්‍රීඩා ගුරුවරු ඉන්නවා. හවස උගන්වනවා. හොඳ බෑන්ඩ් එකක් තිබෙනවා. මේ අපේ අත්දැකීම.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

හරියට ජාපාල වත්තේ ඉස්කෝලේ වාගේ.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

එතකොට මම දන්න තරමින් ඒවා පවත්වාගෙන යන්න අමතර මුදලක් ඕනෑ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ අමතර මුදල පහසුකම් හා සේවා ගාස්තුවලින් ගන්න බැහැ. ඒක මදී. ඒවා දෙමව්පියන්ගෙන් සහ සුභ පතන්නන්ගෙන් ගන්න වෙනවාමයි. දැවැද්ද කියන එක දෙන්නේ බැඳලා යන දවසට. හැමදාම නැන්දම්මා, මාමණ්ඩි සල්ලි දෙන්නේ නැහැ නේ? (බාධා කිරීම්) ඒ වාගේ පාසලට ඇතුළත් වන මොහොතේ පමණයි යම් මුදලක් ගන්න සිද්ධ වෙන්නේ. මම කියන්නේ නැහැ මේක හරියි කියලා. ඒ වුණාට ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේකට ක්‍රමවේදයක් ඕනෑ. මෙහෙම නොවන්න තමන්ගේ දරුවාට ඇති හැකි තිබෙන කෙනාගෙන් අර ගෙන අර ළමයින් 2,000 ටම 3,000 ටම යම් සාධාරණයක් වෙනවා. නමුත් පෞද්ගලික පාසල්, අර්ධ පෞද්ගලික පාසල්, අර්ධ රාජ්‍ය පාසල් - semi government තිබෙනවා. ඒවායේ ලක්ෂ දෙක, තුන, හතර, පහ ගන්නවා. මම දන්නවා මීගමුව ප්‍රදේශයේ පාසල්වල. ඒවා ගැන කථා කරන්න කවුරුවත් නැහැ. අර හොඳයි කියන පාසලට කොහොම හරි දා ගන්න බැරිව ගියාම, අඩු ගණනේ - මේ චක්‍රලේඛයට අනුව අහළ පහළ ළමයින් විතරයි ගන්න පුළුවන්. එයිට පිටින් ළමයෙක් ගන්න බැරිව ගියාම ලක්ෂ ගණන් දීලා අර පාසල්වලට දානවා. එතකොට ඒවා ගැන කථා කරන්න කවුරුවත් නැහැ. මේකෙන් වෙන්නේ වැඩිපුර International School වලට ළමයින් යන එක වැඩි වීමයි. නමුත් මම සල්ලි ගන්න එක හරියි කියන්නේ නැහැ. නමුත් ඒ පාසල් පවත්වාගෙන යන්න, ලයිට් බිල ගෙවන්න, වතුර බිල ගෙවන්න, අමතර පහසුකම් දෙන්න, ක්‍රීඩාව දියුණු කරන්න, අපේ සිරිකමල් පිලීෂියන් ද සිල්වා ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ, තව ක්‍රීඩා ගුරුවරයෙක් පිටින් ගන්න ඒ වාගේ දේවල්වලට අමතර මුදලක් අවශ්‍යයි. ඒවාට ක්‍රමවේදයක් තිබෙන්න ඕනෑ.

ඒ එක්කම මම හිතන්නේ, මේ අධ්‍යාපන අමාත්‍යාංශයේ චක්‍රලේඛය ඇවිල්ලා තිබෙනවා. 35 දක්වා ළමයින් අඩු කරන්න කියලා. එක පාරටම මේ 35 දක්වා ළමයින් අඩු කරන කොට ඒ ප්‍රදේශයේ ඉතිරි ළමයි යන්නේ කොහාටද? එක්කෝ එක පන්තියක් වැඩි වෙන්න ඕනෑ. අපි හිතමු දැන් පන්ති හතරක් තිබෙනවා. දැන් 45 ගණනේ ගන්නවා. 45 ඒවා හතරක් 180 යි. 180 වුණාම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අර ඉතිරි ළමයින් යන්නේ කොහේටද? ඉතිරි ළමයි සල්ලි දීලා International School වලට යනවා. මම හිතන්නේ, මේවා වෙනස් වෙන්න ඕනෑ. පළාත් සභාවක් වශයෙන් අපි එහෙම 35 කරනවා නම්, ඒ පන්ති ප්‍රමාණය වැඩි කරලා ඒ දරුවන්ට සාධාරණයක් ඉෂ්ට කරන්න ඕනෑය කියන එකයි මගේ පුද්ගලික මතය.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම පාසල් සංවර්ධන සමිතියක ලේකම්වරයෙක් වශයෙන් වසර තුනක් හිටියා. මම එතැනදී දැක්කා, ඒ පාසල පවත්වාගෙන යන්න අනිවාර්යයෙන්ම අමතර මුදලක් අවශ්‍යයි. රජයෙන් සල්ලි දෙන්නේ නැහැ. රු. 5000 ට වඩා වියදම් කරන්න දෙන්නේ නැහැ. ඒකත් කොහේ හරි ලියලා තමයි ගන්නේ. එහෙම පාසල් දුවන්න බැහැ. ඒ නිසා ක්‍රමවේදයක් හදන්න ඕනෑ. සල්ලි ගත්ත විධිය නොවෙයි සොයන්න ඕනෑ. සල්ලි වියදම් කරපු විධිය. පාසලක ගත්තු සල්ලි දරුවා වෙනුවෙන් වියදම් කරලා තිබෙනවා නම්, කිසි ප්‍රශ්නයක් නැහැ. ගත්ත සල්ලි යටිමඩි ගැහිලා තිබෙනවා නම්, 100 ක් ගනිද්දී 60 ක් යටි මඩි ගහලා 40 ක් වියදම් කළා නම් තමයි අසාධාරණය වෙන්නේ. ඒ නිසා මේකට ක්‍රමවේදයක්, මොකද ලංකාවේ පාසල් නව දහස් ගණනක් තිබෙනවා. ඒකෙන් 347 යි ජාතික පාසල් තිබෙන්නේ. ඉතිරි ඔක්කොම පාසල් තිබෙන්නේ පළාත් සභාවට. බස්නාහිර පළාත් සභාව ගත්තොත් පාසල් 1264 ක් තිබෙනවා. ඒකෙන් 43 යි ජාතික පාසල්. ඉතිරි ඔක්කොම පළාත් සභා පාසල්. එහෙම නම් අපේ පළාත් සභාවට සිද්ධ වෙනවා යම් - මෙතුමා කියපු යෝජනාවේත් සත්‍යයක් තිබෙනවා. ඒ පැත්තත් බලලා, දරුවාගේ පැත්තත් බලලා, මේ International School වලට යන ප්‍රමාණය අඩු කර ගන්න. පාසල කොහොමද

[ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා]

සංවර්ධනය කරන්නේ කියලා සුභ පතන්නන්ගේ සහ දෙමව්පියන්ගෙන් ගත හැකි දෙයක්, සාධාරණ විධියක් සකසන්න කියලා අපේ අලුත් අධ්‍යාපන අමාත්‍යතුමාට මගේ අදහසක් වශයෙන් ගරු නියෝජ්‍ය සභාපතිතුමා හරහා ඉදිරිපත් කරමින් ඒ යෝජනාව ගෙනාපු මන්ත්‍රීතුමාට බොහොම ස්තුතිවන්ත වෙනවා.

[අ.භා. 12.26]

**ගරු මංජුල ප්‍රසන්න සම්පත්**
Hon. Manjula Prasanna Sampath

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාව ඉතාමත්ම කාලෝචිත සහ බස්නාහිර පළාත් සභාවේ අද දවසේ ඉතාමත්ම වැදගත් යෝජනාවක්. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බස්නාහිර පළාත් සභාව, මේ රටේ පවතින පළාත් සභාවලින් පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් බහුතරයක් අධ්‍යාපනය ලබන පළාත තමයි බස්නාහිර පළාත් සභාව. මේ පළාත් සභාව මගින් පසුගිය කාල සීමාව තුළදී අපේ පළාතේ පාසල් දියුණු කරන්නට යම්කිසි විශේෂ වැඩ පිළිවෙළක් සකස් කළත්, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි මම දැක්කා, විශේෂයෙන්ම ගම්පහ දිස්ත්‍රික්කයේ - අනෙකුත් දිස්ත්‍රික්ක පිළිබඳව මට අවබෝධයක් නැහැ. ගම්පහ දිස්ත්‍රික්කයේ මම නියෝජනය කරන බියගම සහ කැලණිය කලාපයේ මේ හැම වැඩ සටහනක්ම මූලික වුණේ, දේශපාලනීකරණ ක්‍රියාමාර්ග. නමුත් වර්තමානයේදී, ජනවාරි මාසේ 08 වැනිදායින් පස්සේ මේ රටේ නව මෛත්‍රී පාලනයක් ඇති වුණාට පස්සේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත්, එක්සත් ජාතික පක්ෂයත් එකතු වෙලා අපේ රටේ පැරණි ක්‍රමය පැත්තකට දාලා ඒ ජනවාරි මාසේ 08 වැනිදායින් පස්සේ නව යුගයක් ආරම්භ කළේ අපේ රටේ ජනතාවගේ බලාපොරොත්තු ඉෂ්ට කරන්න. අපේ මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ, වර්තමානයේදී අපේ පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් බොහොම අමාරුවෙන් අම්මලා තාත්තලා තමන්ගේ රැකියාව කරලා තමන්ගේ දරුවාට උගන්වන්න යන කොට - පාසල්වල ඉතාමත්ම විශිෂ්ට විදුහල්පතිවරු ඉන්නවා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. ඒ එක්කම සමහර පාසල්වල පහසුකම් ගාස්තුවලට අමතරව ආණ්ඩුවෙන් දෙන උපදෙස්වලටත් අමතරව මහා පරිමාණයෙන් මුදල් එකතු කරලා, මේ තමන්ගේ දරුවාගේ පාසල් අධ්‍යාපනය උදෙසා කියමින් අපේ දෙමව්පියන්ට කරදර කරනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විශේෂයෙන්ම අපි මේ අවස්ථාවේදී ඉල්ලීමක් කරනවා. ගරු අධ්‍යාපන ඇමතිතුමාගේත්, ගරු මහ ඇමතිතුමාගේත් අවධානය යොමු කරන්න කියලා. විශේෂයෙන්ම මා නියෝජනය කරන බියගම කොට්ඨාශයේ, කැලණිය කලාපයේ පසුගිය කාල සීමාව තුළ දී අපේ පාසල්වලට පළමු වසරට ඇතුළත් කර ගැනීමේදී ප්‍රශ්නයක් තිබෙන්නේ, විදුහල්පතිවරු පහසුකම් ගාස්තුවලට අමතරව සල්ලි එකතු කරනවාටත් අමතරව, තමන්ගේ දරුවා ඒ සම්මුඛ පරීක්ෂණයෙන් අසමත් වුණාට පස්සේ මම දැක්කා, මහජන නියෝජිතයින් විශාල ලෙස මුදල් ලබා ගෙන ඒ දරුවා ලක්ෂ එකහමාරක්, දෙකක් අර ගෙන ඒ දරුවාව පාසලට දානවා. ඒකට විදුහල්පතිවරුන්ට කරන්න දෙයක් නැහැ. ඒ ප්‍රදේශය නියෝජනය කරන මහජන නියෝජිතයෝ ඒ දෙමව්පියන්ට කථා කරලා, ලක්ෂ එකහමාරක්, දෙකක් අරගෙන තමයි මේ පාසල්වලට දාන්නේ. එතකොට විදුහල්පතිවරු අසරණ වෙනවා. මෙක දිගටම අරගෙන යනවා ගරු සභාපතිතුමනි. (බාධා කිරීම්) මේ සභාවේදී මම නම් කියන්න යන්නේ නැහැ.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ඇයි ශාරීරික අල්ලස්. ඒවා වුණා පහුගිය කාලවලදී.

**ගරු මංජුල ප්‍රසන්න සම්පත්**
Hon. Manjula Prasanna Sampath

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම ඔබතුමාට පසුගිය කාල සීමාව තුළදී මුහුණ දුන් ඒ දරුවන්ගේ දෙමව්පියෝ පෙන්වලා මෙම ගරු සභාවට කියන්නම්. පසුගිය කාල සීමාව තුළදී මම හිතනවා, දරුවෝ පාසලට ඇතුළු කරන කොට - (බාධා කිරීම්) අපේ මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ, විශේෂයෙන්ම මේ මහජන නියෝජිතයෝ මුදල් ලබා ගත්තාය කියලා මම ප්‍රකාශ කළේ -

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ගරු සභාපතිතුමනි, 36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක්.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, පොඩ්ඩක් ඉන්න. ඔබතුමාට කථාවට අවස්ථාව දෙන්නම්.

**ගරු මංජුල ප්‍රසන්න සම්පත්**
Hon. Manjula Prasanna Sampath

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමාගේ කථාවට අවස්ථාව දෙන්නම්. ගරු මන්ත්‍රීතුමා, මෙතැන මහජන නියෝජිතයින් කිව්වාම, පාර්ලිමේන්තු මන්ත්‍රීවරු ඉන්නවා. ඇමතිවරු ඉන්නවා. ප්‍රාදේශීය සභාවේ අය ඉන්නවා.

**ගරු මංජුල ප්‍රසන්න සම්පත්**
Hon. Manjula Prasanna Sampath

මම කිව්වේ නැහැ පළාත් සභාවේ කියලා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමා පැහැදිලි කර දෙන්න වෙනවා, මේ ඉන්න පළාත් සභා මන්ත්‍රීවරුන්ට ඇඟිල්ල දික් කරන්නේ නැති ආකාරයට. එහෙම දික් කළොත් ඔබතුමාටත් ඇඟිල්ල දික් වෙනවා. මෙහෙම වෙන්න පුළුවන් කියලා -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

කවුද කියලා නම් කියන්න.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, 36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක්.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

එහෙම කෙනෙක් ගැන ඔබතුමා ළඟ තොරතුරු තිබෙනවා නම්, බය නැතිව නම කියන්න. එහෙම නැත්නම් -

**ගරු මංජුල ප්‍රසන්න සම්පත්**
Hon. Manjula Prasanna Sampath

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මගේ කථාවට බාධා කරන්න එපා. මම කාගේවත් -

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා - විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා**
Hon. U. George Perera - Chief Opposition Whip

මහජන නියෝජිතයෝ කියලා කිව්වේ. අපි දන්නේ නැහැ.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක්.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමාගේ නම කිව්වේ නැහැ නේ?

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ඉස්සෙල්ලාම සභාවේ නීතිරීතිවලට අනුව කථා කරන්න ඔබතුමා අලුත් කට්ටයට උගන්වලා නැති නිසා නේ මේ දේ එහෙම වෙන්නේ? එතුමාගේ වරදක් නොවෙයි නේ? ලේකම්තුමා ඉක්මනටම ක්‍රියාත්මක වෙන්න. අලුත් මන්ත්‍රීවරුන්ට මේ සභාවේ නීතිරීති කියලා දෙන්න. දැන් 36(1) යටතේ කථා කරන්න ඉල්ලුවා. එතුමා දන්නේ නැහැ නේ? ඒ නිසා මෙතුමා කියවනවා. (බාධා කිරීම්)

ගරු සභාපතිතුමනි, ගම්පහ දිස්ත්‍රික්කයේ ජීවත් වන මන්ත්‍රීවරයෙක් වශයෙන්, බියගම ආසනයේ ජීවත් වන මන්ත්‍රීවරයෙක් වශයෙන් ගම්පහ දිස්ත්‍රික්කය තුළ දේශපාලන අධිකාරිය, මන්ත්‍රීවරු සල්ලි ගන්නවා කියලා කිව්වා. මමත් අයිතියි. මෙතුමාත් අයිතියි. අපේ ජෝර්ජ් පෙරේරා විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා, රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමිය ඉන්නවා. ඒ නිසා කරුණාකර එක්කෝ -

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා - විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා**
Hon. U. George Perera - Chief Opposition Whip

මහජන නියෝජිතයෝ කියලා කිව්වේ. ඔබතුමා තොප්පිය දා ගන්නේ නැතිව ඉන්න.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

එතුමාට කියන්න කියලා කියන්න කවුද මහජන නියෝජිතයා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

පාර්ලිමේන්තුවේ අය ද පළාත් සභාවේ අයද කියලා කියන්න ඕනෑ.

**ගරු මංජුල ප්‍රසන්න සම්පත්**
Hon. Manjula Prasanna Sampath

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මගේ අවස්ථාව මට ලබා දෙන්න. මම කරුණු කියන්නම්.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

එතුමා කියනවා, එතුමා ඇතුළු. ඒ නිසා එතුමාට අවස්ථාව දෙන්න.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

අපි අරන් නැහැ. කවුද කියන්න ඕනෑ.

**ගරු මංජුල ප්‍රසන්න සම්පත්**
Hon. Manjula Prasanna Sampath

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මගේ අවස්ථාව ලබා දෙන්න. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම හිතන්නේ මම කියන මේ අදහස සැලකිල්ලට ගෙන - කාගේවත් හිත් රිදෙන්න මම මේ ප්‍රකාශය කළේ නැහැ. පසුගිය කාල සීමාව තුළදී අපි ළඟට දෙමව්පියෝ ආවා. ඒ ආපු සත්‍ය කථාව තමයි මේ ගෞරවනීය සභාවේදී ප්‍රකාශ කරන්නේ. ඒ නිසා විශේෂයෙන්ම අධ්‍යාපන ඇමතිතුමාගේ අදහස අනුව - යම්කිසි මුදලක් කවුරු හරි අරගෙන තිබෙනවා නම්, ඒකට ඒ කට්ටියගේ හිත රිදෙයි. මම පළාත් සභාවේ මන්ත්‍රීවරු කියලා කිව්වේ නැහැ. මම කිව්වේ මහජන නියෝජිතයෝ කියලා. අපි ළඟට එනවා. ඔබතුමාගේ අවධානය යොමු කරලා, අධ්‍යාපන ඇමතිතුමාගේ අවධානය යොමු කරලා, මහ ඇමතිතුමාගේ අවධානය යොමු කරලා, අපි පසුගිය කාල සීමාවේදී කෙරුණු දේවල් පැත්තකට දාලා, අපි අලුත් මහ ඇමතිතුමාගේ මූලිකත්වයෙන් ඉදිරි කාල සීමාව තුළදී මේ පළාත් සභාව නව මගකට ගේන්න ඕනෑ. මිනිස්සු බලාගෙන හිටියා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඉදිරි කාල සීමාව තුළදී මිනිස්සුන්ට යහපතක් වෙයි කියලා. ඒ නිසා අපි බලාපොරොත්තු වෙනවා, පසුගිය කාල සීමාව තුළදී දරුවෝ, දෙමව්පියෝ පුදුමාකාර දුකක් වේදනාවක් වින්දා තමන්ගේ දරුවා පළමු වැනි පන්තියට දා ගන්න. එහෙම හම්බ වුණේ නැහැ. ඒ නිසා මම හිතනවා, මේ පළාත් සභාවේ සියලු දෙනාගේම අවධානය යොමු කරලා, අපි ඉදිරි කාල සීමාව තුළදී තමන්ගේ දරුවා පළමු වැනි වසරට දා ගැනීමේදී - ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, තව එක ගැටළුවක් තිබෙනවා. අපේ ඒ දෙමව්පියන්ගේ ඉඩමේ ඔප්පුව ඕනෑ. මේක ප්‍රායෝගික ගැටළුවක්. පසුගිය කාල සීමාව තුළදීත් අපි කථා කළා. ප්‍රාදේශීය සභාවේදීත් අපි කථා කළා. සමහර අවස්ථාවලදී ඒ දෙමව්පියන්ගේ පළමු වැනි වසරට දා ගන්න කොට ඔප්පුව දරුවාගේ දෙමව්පියන්ගේ නමට තිබෙන්න ඕනෑ. නමුත් ඒ ඔප්පුව අම්මා ලියන්නේ නැහැ තමන්ගේ දරුවාගේ නමට. ඒ නිසා අපි පළාත් සභාව මැදිහත් වෙලා, මේ පළාත් සභාවේ පාසල්වලට හරි මේ ඔප්පුව කියන නිර්නායකය පැත්තට දාලා අපේ දරුවා පළමුවැනි ශ්‍රේණියට ඇතුළත් කර ගැනීමට මේ සභාවේ අවධානය යොමු කරන්නය කියලා ඉල්ලීමක් කරනවා.

ඒ වාගේම මම මේ සභාවේදී මම මේ කරන දෙවැනි කථාවේදී මම බොරුවක් කිව්වේ නැහැ. මම අවංකව පසුගිය කාල සීමාව තුළදී මම බියගම ප්‍රාදේශීය සභාවේ අවුරුදු නවයක් සභාපතිවරයා වශයෙන් හිටියා. අවුරුදු හතරක් විපක්ෂ නායකවරයා වශයෙන් හිටියා. ඒ කාල සීමාව තුළදී අපි ළඟට මිනිස්සු එනවා. මිනිස්සු අඬ අඬා ඇවිල්ලා කියනවා, මේ ඉස්කෝලෙට දා ගන්න මෙපමණ මුදලක් ගත්තාය කියලා. අපි ඉදිරි කාල සීමාව තුළදී ඔබතුමාට ඕනෑ නම්, අධ්‍යාපන ඇමතිතුමාට ඕනෑ නම්, මහ ඇමතිතුමාට ඕනෑ නම් -

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ඇයි ප්ලෑන් පාස් කරන්න ගන්න ගණන.

**ගරු මංජුල ප්‍රසන්න සම්පත්**
Hon. Manjula Prasanna Sampath

ඒ තොරතුරු මේ සභාවට ඉදිරිපත් කරනවා කියමින් ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ඇයි ප්ලෑන් පාස් කරන්න ගත්තේ නැද්ද? සභාපතිවරයා වශයෙන්.

**ගරු මංජුල ප්‍රසන්න සම්පත්**
Hon. Manjula Prasanna Sampath

අපි ගත්තා නම් අපි අද මෙතැන නැහැ නේ?

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ගත්ත උන් උඩ ඉන්නේ. නොගත්ත උන් ගෙදර.

[අ.භා. 12.34]

**ගරු ගාමිණී තිලකසිරි** (කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන අමාත්‍යතුමා)
Hon. Gamini Thilakasiri (Minister of Agriculture, Land, Irrigation, Animal Production and Health and Agrarian Development.)

ගරු සභාපතිතුමනි, මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව පිළිබඳව අදහස් ප්‍රකාශ කිරීමේදී එතුමාගේ ඒ මතයට ගරු කරන අතර, මා විශ්වාස කරනවා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි සාමාන්‍යයෙන් දන්නවා මේක අද ඊයේ වුණු දෙයක් නොවෙයි. දේශපාලන ඉතිහාසය තුළ, පළාත් සභා ඉතිහාසය තුළ අපි හැමදාම කියපු දෙයක් තමයි මේ මුදල් එකතු කිරීම පිළිබඳව. මේක නිකම් හැමදාම කථා වන දෙයක්. නමුත් කොයි තරමින් මේ කථාව ගියත් ඒකේ අවසානයක් දකින්න අපට කවදාවත් ලැබුණේ නැහැ. මමත් අධ්‍යාපනය වෙනුවෙන් සිසු දරුවන්ගේ සම්මන්ත්‍රණ වෙනුවෙන් මගේ ලැබෙන ප්‍රතිපාදනවලින් ලක්ෂ 10 ක් වෙනමම වෙන් කරනවා. මොකද, අධ්‍යාපනයට බොහොම ලැදි කෙනෙක් හැටියට. අපි දන්නවා, සමහර පාසල් තිබෙනවා. අපි හිතන තරම් සම්පත් ඒ පාසල්වල නැහැ. පාසලේ යම්කිසි උත්සවයක් කරන්න සිද්ධ වුණාම ඒක කර ගන්න පුළුවන් තත්ත්වයක් නැහැ. ජනප්‍රිය පාසල් තිබෙනවා. මැතිවරණ කොට්ඨාශයක් වුණාම ජනප්‍රිය පාසල් තිබෙනවා. අපේ ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ, දැන් මගේ හෝමාගම ආසනයේ තිබෙනවා, මහා පරිමාණයේ මෑතකදී හදපු හොඳ ජාතික පාසලක්. ඒ ජාතික පාසලට පිටින් එන දරුවෝ. දෙමව්පියොත් ඇවිල්ලා බෝඩ් වෙලා ඉන්නවා, ළමයාව ඉස්කෝලෙට දා ගෙන. අර වටේ ඉන්න දරුවා, අහළ පහළ ඉන්න දරුවා අර ඉස්කෝලේ දිහා බලාගෙන හූල්ල හූල්ලා යනවා. කිසිම ඉගෙනීමක් කෙරෙන්නේ නැති දුප්පත් අහිංසක පාසලකට. ඔන්න ඔය සංස්කෘතිය තමයි පසුගිය කාල සීමාව තුළ ඇති කළේ. පාසල් ගණනාවක්ම කනිෂ්ට පාසල් කළා. සමහර පාසල්වලට ගමේ පාසල හින්දා දරුවෝ ගියා. සපත්තු දෙක නැහැ. ඇඳුම නැහැ. බස් එකට යන්න සල්ලි නැහැ. පහෙන් පස්සේ ඒක නැවැත්තුවාට පස්සේ ද්වීතියික පාසලට හැතැප්ම ගණන් යන්න ඕනෑ. ඒ ළමයා අධ්‍යාපනයෙන් ඈත් වෙනවා. මේ පසුගිය කාල සීමාව තුළ සිදු වුණු දේවල්. තම තමන්ගේ ප්‍රතිරූපය ගොඩ නගා ගන්න විවිධාකාරයේ දේවල් කරනවා. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම කියන්නේ, අපි දන්නවා පාසලක් වුණාම පළමු වැනි ශ්‍රේණියට ඇතුළු කරන කොට විදුහල්පතිවරයා දන්නවා මේ දරුවා 11 පාස් වෙලා, 13 පාස් වෙලා එළියට යන කල් ආයිත් සත පහක්වත් ගන්න හම්බ වෙන්නේ නැහැ. දෙමව්පියෝ දෙන්නෙත් නැහැ. දෙන්න පුළුවන්කමකුත් නැහැ. ඉතින් විදුහල්පතිවරයා සාමාන්‍යයෙන් කියනවා. මේ අදට කෙරෙන තත්ත්වය මම මේ කියන්නේ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. අනේ අපට උළු කැට 50 ක් අරන් දෙන්න. සිමෙන්ති කොට්ට 15 ක් අරන් දෙන්න. අර ගොඩනැගිල්ලක මොනවා හරි කරලා දෙන්න. ඒ විදුහල්පතිවරයා ඕක ගෙනියන්නේ නැහැ. අපි භාණ්ඩ වශයෙන් ගෙනැල්ලා දෙනවා. දරුවා පාසලටත් ඇතුළත් කෙරෙනවා. හැබැයි, මෙතැන තිබෙන්නේ විදුහල්පතිවරයා හිතන්නේ නැහැ මේ දරුවා පුළුවන් දරුවෙක්ද බැරි දරුවෙක්ද කියන එක.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විවිධාකාරයේ ක්‍රම උපයෝගී කර ගන්නවා තමන්ගේ දරුවා පාසලට දා ගන්න. එක වසර, හය වසර, දොළහ වසර. මේ පන්ති තමයි විශාල වශයෙන්ම දරුවන් ඇතුළත් කර ගැනීමට දෙමව්පියෝ මහන්සි වෙන්නේ. අපි මේවාට විසඳුම් දෙන්න ඕනෑ. දැන් උදාහරණ වශයෙන් කිව්වොත්, 5 වසර සමත් වන හෝමාගම මැතිවරණ කොට්ඨාශයේ පාසල් ගණනාවක් තිබෙනවා. ඒ දරුවන්ට පහ වසර සමත් වෙලා යන්න පාසලක් නැහැ. පාසල් දෙකයි තිබෙන්නේ. එක්කෝ ජනාධිපති විද්‍යාලය. එහෙම නැත්නම් මහා විද්‍යාලයට. ඒකේ ඉන්න දරුවෝ හයේ පන්තියට යන කොට පිටින් දරුවෝ ගන්න බැහැ. ගමේ තිබෙනවා, මහා විශාලව ජාතික පාසලක් හදලා. ඒ ඉස්කෝලෙට යන්නත් බැහැ. ලකුණු ගණනක් දාලා. ඒ විවිධාකාරයේ මේ ක්‍රම නිසා. පාසල් තිබෙනවා. හය වසරට යන්න බැහැ. ඒ නිසා මම කියන්නේ. මෙතැන හදන්න ඕනෑ ඔක්කෝටම ඉස්සෙල්ලා. ඒ සල්ලි ගන්න එක නවත්වන එක නොවෙයි වැඩේ. දැන් සමහර පාසල් තිබෙනවා, අවුරුද්දක පාසලක කරන්නේ කාරණා දෙකයි. එකක්, ක්‍රීඩා උත්සවය. අනිවාර්යයෙන් ක්‍රීඩා උත්සවයක් කළ යුතුමයි. දරුවන් වෙනුවෙන් අවුරුද්දකට වරක් පවත්වනවා. අවුරුද්ද අවසානයේ

[ගරු ගාමිණී තිලකසිරි - අමාත්‍යතුමා]

කලා උළෙලක් පවත්වනවා. දරුවන්ගේ සහජ හැකියාවන් දෙමව්පියන් ඉදිරියේ ප්‍රදර්ශනය කරන්න. ඔය දෙකවත් කර ගන්න බැරි පාසල් අනන්ත අප්‍රමාණ තිබෙනවා. ක්‍රීඩා උත්සවයක් කරන්නේ නැත්තේ - දැන් සමහර පාසල් ක්‍රීඩා උත්සව කරන්නේ අවුරුදු දෙකකට සැරයක්. සල්ලි නැහැ. එකතු කර ගන්න බැහැ. දුප්පත් අහිංසක දෙමව්පියෝ. ඉතින් ඒවාට අපි විකල්පයක් සොයලා දෙන්නේ නැතිව, මේ මාර්ගයට යන එක ඒ තරම්ම සුදුසුයි කියලා මම විශ්වාස කරන්නේ නැහැ. මම මේ විදුහල්පතිවරු පෝෂණය කරන්න කථා කරනවා නොවෙයි.

අපි දන්නවා, සමහර පාසල්වලට ගියාම උළු කැට දහය පහළොව කැඩිලා. වහළය තෙමෙනවා. පරාලය තෙමෙනවා. කොහොමද කර ගන්නේ? විදුහල්පතිවරයාගේ අතින් සල්ලි දෙන්නද? විදුහල්පතිවරු ඉන්නවා, තවම වැඩ බලන විදුහල්පතිවරු. මේ බස්නාහිර පළාත ගත්තොත් වැඩ බලන විදුහල්පතිවරු වැඩි හරියක් ඉන්නේ. ඒ මිනිස්සුන්ට ලැබෙන මුදල කීයද? ඒ මනුස්සයාට පුළුවන්ද මේ උළු කැටයක් දාන්න. පරාලයක් දාන්න. හරි අමාරුවෙන් ජීවත් වෙන්නේ. ඒ නිසා මේකට ක්‍රමවත් වැඩ පිළිවෙළක් සකස් කර ගත යුතුයි. දෙමව්පියන්ගේ මුදල් ගැනීම වැරදි ආකාරයෙන් සිද්ධ වෙන්න පුළුවන්. බලහත්කාරයෙන් මුදල් ගන්නවා නම් ඒක සම්පූර්ණ වැරදි වැඩක්. ජනතාව දැනුවත් කරන්න ඕනෑ, කිසිම වෙලාවක බලහත්කාරයෙන් මුදල් - තමන්ගේ කැමැත්තෙන් පාසලේ දියුණුව වෙනුවෙන් යම්කිසි දෙයක් කරනවා නම් - පෙරෙයිදා තිබුණා. මමත් අපේ විපක්ෂ නායකතුමාත් ගියා. හෝමාගම ජනාධිපති විද්‍යාලය. අද ගොඩනැගිල්ලක් නැතිව ඉන්නේ. මෙවර මහ ඇමතිතුමා වෙන් කළ මුදල්වලින් අපි ඒකට බොහොම අමාරුවෙන් මුදලක් වෙන් කර ගත්තා. අපි ගියා. ආදි ශිෂ්‍ය සංගමය නාට්‍යයක් ගෙනැල්ලා පෙන්වනවා. අපි දෙන්නා ගිහිල්ලා පොල්තෙල් පහන පත්තු කරලා ආවා. මොකටද මේ? මේ ඉස්කෝලේ තිබෙන අඩුපාඩු ටික හදා ගන්න. වහළය හදා ගන්න. ගොඩනැගිල්ල හදා ගන්න. බැම්ම හදා ගන්න. වැසිකිළිය හදා ගන්න. මම ඇහුවා, මේ සල්ලිවලට මොකද කරන්නේ කියලා. අපි ගන්න ලාභය අපි ඉස්කෝලෙට දෙනවා සර් කියලා කිව්වා. මෙවැනි තත්ත්වයක් මේ පාසල්වල තිබෙන්නේ. ජනප්‍රිය පාසල්වලට නම් මේක හොඳයි. ජනප්‍රිය පාසල් ගන්නේ ලක්ෂ දෙකයි, තුනයි, හතරයි. සමහර පාසල් ලක්ෂ පහයි Target එක. ඒවා ගැන කථා කරන්න බැහැ. මේ අහිංසක දුප්පත් පාසලක්, රුපියල් හාර පන්සියයක් ගත්තාම, රුපියල් දෙදාහක්, ගල් ටිකක්, වැලි ටිකක් ගත්තාම ඒක තමයි සේරටම ජේන්නේ. ඒ නිසා අපි මේ අහිංසක මිනිස්සුන්ගේ දරුවන්ට - ඒ මිනිස්සු බලහත්කාරයෙන් මුදලක් දෙනවා නොවෙයි නේ මේක. තමන්ගේ කැමැත්තෙන් දෙන්නේ මුදලක්. බැරි මිනිස්සු ඉන්න පුළුවන්. ඒ නිසා ක්‍රමවත් වැඩ පිළිවෙළක් සකස් කර ගත යුතුයි කියන එක මම දිගින් දිගටම කථා කරන්න යන්නේ නැහැ. ක්‍රමවත් වැඩ පිළිවෙළක් සකස් කර ගන්නා තුරු, දෙමව්පියෝ හරි, ආදි ශිෂ්‍ය සංගමය හරි, සුභ පතන්නන් හරි මුදලක් දෙනවා නම් අපි ඒක හාර ගත්තාට කමක් නැහැ. සමහර අය ඉන්නවා පුරුද්දක් හැටියටම කරන අය. අපි දන්නවා, ඒ මාර්ගයෙන්ම ජීවත් වන විදුහල්පතිවරු ඉන්නවා. ජනවාරි මාසය වන කොට කීයක් හරි ගාණක් සොයා ගන්නවා අවුරුද්දේ ජීවත් වෙන්න. ඒ පිළිබඳව වැඩි අවධානයක් යොමු කරලා,මේකට සර්ව සාධාරණයක් - මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමා බොහොම සද්භාවයෙන් මේ යෝජනාව ඉදිරිපත් කළේ. ඒක සොයලා බලලා, ඒ අවශ්‍යතාවයන් අනුව කටයුතු කරනවා ඇරෙන්න පාසලකට ලැබෙන මුදලක් අවහිර කිරීම ඒ තරම් සුදුසු නැහැ. මම ඔබතුමාගේ මාර්ගයෙන් අධ්‍යාපන ඇමතිතුමාව ඒ පිළිබඳව දැනුවත් කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 12.42]

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි දරුවන්ට අධ්‍යාපනය ලබා දීම ගැන කථා කරනවා. දෙමව්පියන්ගේ බලාපොරොත්තුව තමයි තමන්ගේ දරුවාට හොඳ අධ්‍යාපනයක් ලබා දෙන එක. 1947 මැයි 27 වැනිදා එවකට රාජ්‍ය මන්ත්‍රණ සභාව සම්මත කර ගන්නවා අධ්‍යාපන පනතක්. ඒ අධ්‍යාපන පනත අනුව මේ රටේ සියලුම සිසුන්ට නිදහසේ, නොමිලයේ අධ්‍යාපනය දෙන්න තීරණය කරනවා. අපි ලෝකය ඉදිරියේ කයිවාරු ගහනවා, අපේ රටේ නිදහස් අධ්‍යාපනය ක්‍රියාත්මක වෙනවා කියලා. හැබැයි, ඒක යථාර්ථයක් නොවෙයි කියලා අද වන කොට අපට තේරුම් ගිහිල්ලා ඉවරයි. සමහරු කියනවා, 1977 ආණ්ඩුව එන කොට, නව ලිබරල්වාදී ආණ්ඩුවක් එන කොට මේ අධ්‍යාපනය විනාශ වුණාය කියලා. හැබැයි, ඊට පස්සේ

පත් වුණු ආණ්ඩු මේක නිවැරදි කරන්න උත්සාහ කළාද කියන ප්‍රශ්නය ගොඩ නැගෙනවා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. අපි දන්නවා. අද වන විට දරුවා පාසලට යවලා එතැනින් නතර වෙන්න බැහැ. දෙමව්පියන්ට සිද්ධ වෙනවා, පාසලේ සියලු කටයුතුවලට මුදල් වියදම් කරන්න. අඩුම වශයෙන් සමහර දෙමව්පියන්ට තමන්ගේ දරුවාට සපත්තු දෙක, බෑග් එක අරන් දෙන්න වත් බැරි පරිසරයක් තුළ කොහොමද මේ පාසල්වලින් ඉල්ලන ගාස්තු ගෙවන්නේ කියන ප්‍රශ්නය ගොඩ නැගෙනවා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. පාසල් දරුවන් වෙනුවෙන් දෙමව්පියන්ගෙන් මුදල් එකතු කිරීම තහනම් කිරීමට අපි දන්නවා, චක්‍රලේඛ ගණනාවක් තිබෙනවා. හැබැයි, ඒ එකක්වත් මේ විදුහල්පතිවරුන් තඹ සතයකට මායිම් කරන්නේ නැහැ. එක එක ව්‍යාපෘති එනවා. විවිධ ව්‍යාපෘති හඳුන්වලා දීලා විවිධ ආකාරයෙන් මුදල් එකතු කරනවා. මේක ජාවාරමක් බවට පත් වෙලා තිබෙනවා, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. මේකට විවිධ උපක්‍රම පාවිච්චි කරනවා. සමහරු අර කාඩ් එකක කොටු ගහලා, ඒ කොටු කපනවා. තවත් සමහරු ටිකට් එකක් ගහලා දෙනවා, ළමයින්ට සල්ලි එකතු කර ගෙන එන්නය කියලා. හැබැයි, දෙමව්පියන්ට තමයි සල්ලි ගෙවන්න වෙන්නේ. මොකද, දෙමව්පියෝ බයට සල්ලි ගෙවනවා. එහෙම නැත්නම් තීන්ත ගානවා. එහෙම නැත්නම් විදුහල්පතිවරු තවත් මොකක් හරි කටයුත්තක් සැලසුම් කරනවා, දරුවන්ගෙන් මුදල් ලබා ගන්න.

සමහර වෙලාවට අපි දන්නවා. උසස් පෙළ දරුවෝ කියනවා, මේ වාගේ ව්‍යාපෘතිවලට අපට රු. 3000/- ක් ගෙවන්න වෙලා තිබෙනවා. එක ළමයෙකුට රු. 4000/- ක් ගෙවන්න වෙලා තිබෙනවාය කියලා. මේක බරපතළ තත්ත්වයක්. අපට මතකයි, මීට කාලයකට පමණ ඉහතදී හොරණ ප්‍රදේශයේ දැරියක් පාසලේ තීන්ත ගාන්න ගාස්තුවක් ගෙවන්න කියලා, රු. 800 ක් සොයා ගන්න පොල් හොරකම් කළාය කියලා අධිකරණයට ගෙන ගියා. එවැනි පරිසරයක අපි ජීවත් වෙන්නේ. අපට මතකයි, එදා හිටපු ජනාධිපතිතුමා මහින්ද රාජපක්ෂ මැතිතුමා හිටපු ඇමති බන්දුල ගුණවර්ධන මැතිතුමාට නියෝගයක් කළා. කරුණාකර, මෙවැනි දේවල් රටේ වෙනවා නම්, වහාම සොයලා බලන්න කියලා. නමුත් ඒක ක්‍රියාත්මක වුණේ නැහැ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ නිසා මෙවැනි විදුහල්පතිවරුන්ට විරුද්ධව සෘජුව ක්‍රියාමාර්ග ගන්න පුළුවන්ද? මේක තමයි අපි ඉදිරියේ අද තිබෙන ප්‍රශ්නය. ඒ නිසා මේ ගැන දැඩි අවධානයක් යොමු කරන්න ඕනෑ. අපට රට ගැන කථා කරන්න බැහැ. නමුත් අපට මේ බස්නාහිර පළාත් සභා බල ප්‍රදේශයේ මේ සම්බන්ධයෙන් ගත හැකි ක්‍රියාමාර්ග මොනවාද කියලා සොයලා බලන්න වෙනවා. ක්‍රමයක් සකස් කරන්න වෙනවා.

මම කැමැතියි, මේ සභාව ඉදිරියේදී මතක් කරන්න. ගරු ඇමතිතුමනි, මෙවැනි කාරණා වළක්වන්න චක්‍රලේඛ ගණනාවක් තිබෙනවා.

1982/02 පාසල් සංවර්ධන සමිති චක්‍රලේඛය.
2008/37 දෙවැනි ශ්‍රේණියේ සිට 11 වන ශ්‍රේණිය දක්වා සිසුන් ඇතුළත් කිරීමේ චක්‍රලේඛය.
2008/41 ආදි ශිෂ්‍ය සංගම් හා වෙනත් සංගම්වල ක්‍රියාකාරකම් පිළිබඳ චක්‍රලේඛය.
2008/35 පාසල් නගා සිටුවීමේ නියාමන වැඩ සටහන් චක්‍රලේඛය.
2012/19 පළමු ශ්‍රේණියට සිසුන් ඇතුළත් කිරීමේ චක්‍රලේඛය.

මේ චක්‍රලේඛවලට අනුව සිසුන්ගෙන් මුදල් එකතු කරන්න බැහැ. ඉතාම පැහැදිලියි. ඒ විතරක් නොවෙයි, 2008/37 චක්‍රලේඛයේ හය වන වගන්තියේ තිබෙනවා, දෙවැනි ශ්‍රේණිය සිට 11 වන ශ්‍රේණිය දක්වා සිසුන් ඇතුළත් කිරීමේදී ඒ කිසිම ආකාරයෙන් මුදල් එකතු කරන්න බැහැ. ඇතුළත් කිරීමේදී හා ඉන් පසුව පහසුකම් හා සේවා ගාස්තු සහ පාසල් සංවර්ධන සමිති සාමාජික ගාස්තු හැර වෙනත් මුදලක්, භාණ්ඩයක් එකතු කිරීම සපුරා තහනම්. අපේ මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමා පෙන්වපු ඒ චක්‍රලේඛය උපාලි මාරසිංහ අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා 2015.01.29 දින අලුතෙන් නිකුත් කරලා තිබෙනවා. එහි තිබෙන තවත් කාරණයක් මතු කරලා පෙන්වන්න මම කැමැතියි. මෙම නීත්‍යානුකූල ගාස්තු ගෙවීමට වුවද දෙමව්පියන්ට හා සිසුන්ට අනිවාර්ය කිරීමක් හෝ බල කිරීමක් නොකළ යුතුය. ඒ විතරක් නොවෙයි. නීත්‍යානුකූල ගාස්තු වුවද ගෙවීමට අපහසු නම් ග්‍රාම නිලධාරී සහතිකය මගින් ඒ බව සනාථ කළ විට ගෙවීම්වලින් එම ශිෂ්‍යයා හෝ ශිෂ්‍යයාව නිදහස් කළ යුතු අතර, එසේ ගාස්තු ගෙවීමෙන්

[ගරු සුසිල් කිඳෙල්පිටිය]

නිදහස් කළ බවට අදාළ දෙමව්පියන් වෙත ලිඛිතව දන්වා යැවිය යුතුය. ඒ නිසා මේකෙන් කිසිදු මානසික පීඩනයක් එල්ල කරන්න බැහැයි කියලත් මේ චක්‍රලේඛයේ සඳහන් වෙනවා, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. නමුත් මේ ආකාරයට කටයුතු සිද්ධ වෙන්නේ නැහැ. ඒ විතරක් නොවෙයි. මීට අදාළව අවධානය යොමු කරන්න ඕනෑ කරුණු ගණනාවක් තිබෙනවා. ඒ නිසා මම මේ පළාත් සභාවේදී අපේ ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරනවා. ගරු මන්ත්‍රීවරුන්ගේ අවධානය යොමු කරනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ නිසා අපි සියලු දෙනා එකතු වෙලා බස්නාහිර පළාතේ මෙහෙම දේවල් සිද්ධ වෙනවා නම්, ඒක වළක්වන්න කිසියම් දෙයක් කරන්න ඕනෑ. පැහැදිලිව මේකට විදුහල්පතිවරු වගකියන්න ඕනෑ. ඒ නිසා මේ විදුහල්පතිවරු හුරතල් කරන්න යන වැඩෙන් වහාම අපි මේ පළාත් බලධාරීන් ඉවත් වෙන්න ඕනෑ. සමහරු මේ විදුහල්පතිවරු සම්බන්ධයෙන් නිවැරදි ක්‍රියාමාර්ග ගන්න ඉතිහාසයේ කටයුතු කරලා නැහැ.

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya - Chief Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පළාත් අධ්‍යාපනයට සම්බන්ධ යෝජනා දෙකක් තිබෙන්නේ. ඒ නිසා කථිකයන්ගෙන් ඒ යෝජනාවට අදාළ කාලය ඉතිරි කර ගෙන පැයක කාල සීමාවක් තුළ ඒ යෝජනාවත් අරන් ඉවර කළා නම් හොඳයි. ඒ යෝජනාව මාස හයකට කාලයක් ආවා. ඒ ගැන ගරු මන්ත්‍රීවරුන්ගේ අවධානය යොමු කරලා, ඒ යෝජනාවත් අවසන් කළා නම් හොඳයි.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අවසාන වශයෙන් මම කියන්න අදහස් කළේ මෙවැනි විදුහල්පතිවරුන් සම්බන්ධයෙන් පැහැදිලිව ක්‍රියාමාර්ග ගන්න අපි පැහැදිලිව කටයුතු කරන්න ඕනෑ. ඒ වාගේම පළාතේ අධ්‍යාපනය දියුණු කරන්න මීට වඩා මුදලක් වැය කිරීම කෙරෙහි අපි කැපවීමක් කරන්න ඕනෑ. ඒ විතරක් නොවෙයි. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ගරු ඇමතිතුමනි, මම ඉල්ලීමක් කරනවා. විදුහල්පතිවරුන් සම්බන්ධයෙන් මෙවැනි චෝදනා තිබෙනවා නම්, ඒ චෝදනා සොයා බලන්න. ඒ චෝදනා පිළිබඳව කරුණු සොයා බලන්න. ඒ චෝදනා පිළිබඳව තොරතුරු එකතු කරන්න. මේ පළාත් සභා ව්‍යුහය ඇතුළේ කමිටුවක් පත් කර ගත්තොත් අපට මේ බස්නාහිර පළාත් සභා බල ප්‍රදේශය තුළ සිසුන්ට සිද්ධ වන, දෙමව්පියන්ට සිද්ධ වන මේ බලවත් අසාධාරණය වළක්වන්න යමක් කරන්න පුළුවන් වෙයි කියලා මා විශ්වාස කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 12.50]

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna sanjeeva

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරලා තිබෙන මේ යෝජනාව පිළිබඳව කථා කරන්න ලැබීම ගැන ඉතාමත් සන්තෝෂ වෙනවා. ඒ වාගේම මේ වන කොට පාසල් පිළිබඳව කථා කරන්න ගියොත්, සමහර පාසල්වල මුදල් එකතු කරන විධියත් දිහා බැලුවාම පාසලේ යම්කිසි අඩුපාඩුවක් සඳහා මේ ක්‍රියාදාමය සිද්ධ වෙනවා. නමුත් පළමු වැනි වසර ළමයෙක් ගමේ තිබෙන පාසලකට දාන කොට - ඒ පාසලේ විශාල ප්‍රමාණයේ අඩුපාඩු තිබෙනවා. උදාහරණයක් වශයෙන් අපි බේරුවල ආසනය බැලුවොත්, බේරුවල ආසනයේ තිබෙන පුංචි පාසල් ටික දියුණු කර ගන්න අවශ්‍ය කරන ශක්තිය, ගුරුවරු ටික ගෙන්වා ගන්න, නැත්නම් මේ පාසලේ තිබෙන අනෙකුත් කටයුතු ටික ක්‍රියාත්මක කර ගන්න පාසලේ විදුහල්පතිවරයා සමහර විට මේ අඩුපාඩු පෙන්නුවත් මේවා ක්‍රියාත්මක වෙන්න මහා කාලයක් යනවා. එතකොට පාසල් සංවර්ධන සමිතියත් එක්ක එක්කහු වෙලා, විදුහල්පතිතුමා ප්‍රධාන ගුරු මණ්ඩලය අඩුපාඩු කථා කරලා, අපි කණ්ඩායමක් වශයෙන් එකතු වෙලා, සමහර වෙලාවට අපි මුදල් එකතු කර ගෙන, පරිත්‍යාග වශයෙන් එකතු කර ගෙන, නැත්නම් ඒ අවට ඉන්න දානපතියන් ළඟට ගිහිල්ලා, නොයෙකුත් ආකාරයේ මුදල් එකතු කිරීමේ ක්‍රමවේදය ක්‍රියාත්මක වෙනවා. හැබැයි, මේවා කර ගෙන යද්දී පාසල හදන්න හදන විදුහල්පතිවරුන්ට විරුද්ධව සහ ගුරුවරුන්ට විරුද්ධව නොයෙකුත් කටයුතු සිද්ධ කරන සමහර පුද්ගලයෝ ඉන්නවා. එක්කෝ පාසල ඇතුළේ සමහර ගුරුවරු ඉන්නවා. සමහර දෙමව්පියෝ ඉන්නවා.

අපි ඔබතුමන්ලාගේ නායකත්වය යටතේ, මහ ඇමතිතුමාගේ නායකත්වය යටතේ, එක්කෝ අධ්‍යාපන

කොට්ඨාශය තුළ ව්‍යුහ කමිටුවට ඉදිරිපත් කරලා, ඒ ව්‍යුහ කමිටුවට යම්කිසි ප්‍රශ්නයක් ඉදිරිපත් කළත්,සමහර වෙලාවට ඒ ප්‍රශ්නයට පිළිතුරක් ලැබෙන්නේ නැහැ. ඒක උපදේශක කාරක සභාවට ඉදිරිපත් කරලා තිබ්බොත් ඒක ක්‍රියාත්මක වෙන්නෙත් නැහැ. උදාහරණක් ගත්තොත් අද බේරුවල ආසනයේ යම්කිසි පාසලක ටිකට් එකක් ගහලා මුදල් එකතු කළා. මිතුරන් අතරේ පමණයි කියලා. මිතුරන් අතරේ පමණයි කියලා මේක දුන්නේ කාටද? දරුවන්ට. මේක දරුවන්ට දීලා, සමහර ගුරුවරු දරුවන්ට බලෙන් කිව්වා, මේක අනිවාර්යයෙන්ම විකුණලා ගේන්නය කියලා. හැබැයි, මේ ප්‍රශ්නය එන කොට මම කථා කළා. ඒක කථා කළාට පස්සේ අධ්‍යක්ෂවරයෙක් ගිහිල්ලා ලොග් සටහනක් ගහලා ඇවිල්ලා, ඒ වැඩේ නවත්වලා තිබුණත්, පසුගිය කාලවල අර විභාග කාලය අවසන් වෙලා යන කොට ඒ විභාග කාලයේ විදුහල්පතිවරයා විසින් ආපහු ඒ ලොතරැයිය ඇදලා ඒ අවශ්‍ය කරන කටයුතු සිද්ධ කළා. හැබැයි, මම මේ ප්‍රශ්නය ගැන ව්‍යුහ කමිටුවේ සාකච්ඡා කළාම අද වන තුරුත් ඒකට පිළිතුරක් නැහැ. අන්න එවන් විදුහල්පතිවරුන්ට විරුද්ධව කටයුතු කරන්න ඕනෑ. හැබැයි, ඒවාට කථා කරන්න මම හිතන්නේ, සමහර නායකයෝත් පස්සට යනවා. හැබැයි, අපි කියනවා, අද පාසල් එන්න එන්නම කඩා ගෙන වැටෙන කොට -

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද මේ කථා කරන මමත් පාසල් දෙකක පාසල් නගා සිටුවීමේ කමිටුවේ ඉන්නවා. ඒ වාගේම පාසල් සංවර්ධන සමිතියේ ලේකම් වශයෙනුත් ඉන්නවා. ඒ පාසල් ටික අපි දියුණු කරන්න කටයුතු කරන්නේ - මොකද, ගරු සභාපතිතුමනි, අපි ගිය පාසල වඩාත් දියුණු කරලා, මේක අංග සම්පූර්ණ කරලා, අධ්‍යාපනයෙන් පෝෂණය කරලා, අපේ ප්‍රදේශයේ ඉන්න දරුවන්ට අවශ්‍ය කරන කටයුතු සිද්ධ කරන්නයි. හැබැයි, කොළඹ පළාතේ ලොකු ලොකු පාසල්වලට මුදල් ටික ගෙනැල්ලා, මම හිතන්නේ එක ළමයෙක් දා ගන්නත් ලක්ෂ 05 යි. 10 යි. 20 යි. හැබැයි, ඒවාට කිසිම කෙනෙක් කථා කරන්නේ නැහැ. දරුවන්ව අනිවාර්යයෙන්ම දා ගන්නවා. මේ කථා කරන මගේ දරුවොත් කොළඹ පාසල්වලට එවලා නැහැ. අපි ගිය පාසල ඥානිස්සර විද්‍යාලය. අලුත්ගම විද්‍යාලය. සංඝමිත්තා බාලිකා විද්‍යාලයට තමයි අපි ඒ දරුවෝ ටික දාලා තිබෙන්නේ. හැබැයි, ඒ පාසල්වලට සෑහෙන අඩුපාඩුකම් තිබෙනවා. ඒවා දෙමව්පියෝ එක්ක එකතු වෙලා, කථා කරලා කරන්නේ මේ කථා කරන අපිම තමයි. ඊයේ පෙරෙයිදා මහා ධාරාණිපාත වර්ෂාව. ඉස්කෝලෙට ගියාම උළු කැට ටිකෙන් වතුර ටික වැක් කෙරෙනවා. ලීයක් අර ගෙන නැගලා, ඒ ලීයේ බටයකින් තමයි අර වැක්කෙරෙන උළු කැටේ වතුර ටික නවත්වන්නේ. සමහර උළු කැට බිදිලා නම් ඒ වහළට නැගලා තමයි මේ කථා කරන අපි දාන්නේ. හැබැයි, සමහර විට සමහර විදුහල්පතිවරු මේවාට අකමැතියි. එවැනි කට්ටියත් ඉන්නවා. කැමැති කට්ටියත් ඉන්නවා. හැබැයි, හරියට පරීක්ෂණ කටයුත්තක් කරලා - මම හිතන්නේ, මේ යෝජනාව අනුව සමහර අවස්ථාවලදී ක්‍රියා කරන්න සිද්ධ වෙනවා. හැබැයි, පාසල් දියුණු කර ගෙන යන මේ වැඩ සටහනට අවශ්‍ය කරන ශක්තිය අද - අධ්‍යාපන ඇමතිතුමා මෙතැන ඉන්නවා. අපි ඔබතුමාගෙන් ඉල්ලනවා. බස්නාහිර පළාත තුළ පාසල්වල විවිධ ප්‍රශ්න තිබෙනවා. අපි ව්‍යුහ කමිටුවල කථා කරනවා. හැබැයි, මම මේවා කථා කරලා, සමහර අවස්ථාවල මෙතැන මගේ සහෝදර මන්ත්‍රීවරු ඉන්නවා. මම රණ්ඩු අල්ලා ගෙනත් නැගිටලා ඇවිල්ලා තිබෙනවා. එවන් සිද්ධි ඔබතුමාට දැන්නුවොත් අන්න ඒවාට අනුකූලව කටයුතු සිද්ධ කරන්න ඕනෑ. ඒවාට අවශ්‍ය කරන ඒ විදුහල්පතිවරුන්ට ගුරුවරුන්ට විරුද්ධව කටයුතු කරන්න ඕනෑ. එහෙම නැත්නම් මම හිතන්නේ, එන්න එන්නම පාසල් කඩා ගෙන වැටෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, දැන් උදාහරණයක් වශයෙන් සමහර පාසල්වල විදුහල්පතිවරුන්ගේ හිඟයක් තිබෙනවා. ඒ විදුහල්පතිවරුන්ගේ හිඟයට අවශ්‍ය කරන ගුරුවරයෙක් පත් කළොත් ඒ ඉන්න ගුරුවරයාට පාසල ගෙනියන්න සමහර ගුරුවරු දෙන්නේ නැහැ. හැබැයි, ඒක අපි ගිහිල්ලා කොට්ඨාශ අධ්‍යක්ෂවරයාට කිව්වොත් ඒකට පිළිතුරු ලැබෙන්නෙත් නැහැ. මොකද හේතුව, ඒ කණ්ඩායම විසින් එකතු වෙලා අර කොට්ඨාශ අධ්‍යක්ෂ හමු වෙලා, නොයෙකුත් ආකාරයේ කටයුත්තක් කරලා මේක නවත්ත ගන්නවා. අද මේ තිබෙන පුංචි පාසල් ටික මම කථා කරන්නේ බේරුවල ආසනය තුළ - කළුතර දිස්ත්‍රික්කය පුරාම අනෙක් මන්ත්‍රීවරු ඉන්නවා කථා කරන්න. මම ජීවත් වන ප්‍රදේශය, මම නියෝජනය කරන බේරුවල ආසනය තුළ අද පාසල් ටිකට අවශ්‍ය වෙලා තිබෙන කටයුත්ත මම හිතන්නේ, එකින් එක ඉදිරියේදී පෙළ ගස්වන්නම්. දැන් ඉන්න අධ්‍යාපන ඇමතිතුමාත් නොදන්න පළාතක් නොවෙයි නේ බේරුවල කියන්නේ. ඔබතුමා කළුතර දිස්ත්‍රික්කය තුළ ඒ ප්‍රදේශයේ මැතිවරණ කාලයට ඉදිරිපත් වෙලා ඔබතුමාට අවශ්‍ය කරන ශක්තිය

[ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව]

ලැබිලා තිබෙනවා. එහෙම නම් අපි විශේෂයෙන් ඉල්ලනවා. බේරුවල ආසනය තුළ ජීවත් වන කණ්ඩායමක් හැටියට අපි අපේ ජනතාවට අවශ්‍ය කරන ශක්තිය ඔබතුමාගේ ඒ ධූර කාලය තුළදී ඔබතුමාගේ අමාත්‍යාංශය තුළින් කරන්න ඕනෑ වගකීම හා ඒ අවශ්‍ය කරන කටයුත්ත ඉෂ්ට සිද්ධ කරලා දෙන්න. නොයෙකුත් චක්‍රලේඛ ශේනවා. ඒ චක්‍රලේඛ හෙට වෙන කොට ආපහු වෙනස් කරනවා. ඒක වෙනස් කරලා ඉවර වෙලා කටයුතු කරන කොට විදුහල්පතිවරු භය වෙනවා. මුදල් ටික වියදම් කරන්නත් භය වෙනවා. එහෙම නම් ඒ අවශ්‍ය කරන කටයුතු ඔබතුමාගේ නායකත්වය යටතේ අවශ්‍ය කරන ආකාරයට අපට ලබා දෙන්නය කියලා ඉල්ලා සිටිමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 12.56]

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විවිධාකාරයේ අදහස් දක්වපු මන්ත්‍රීවරුන්ට සහ ඇමතිතුමාට මම මුලින්ම ස්තුතිවන්ත වෙනවා. දැන් මේ සමහර කථා අහද්දී, පහුගිය කාලයේ ආණ්ඩු කළේ අපිද කියලා මට හිතුණා. මොකද, දැන් මට කලින් කථා කළ මන්ත්‍රීතුමාගේ දිස්ත්‍රික්කයේ තමයි අගමැතිවරයෙක් හිටියේ. ඒ වාගේම ඒ දිස්ත්‍රික්කයේ තමයි මහ ඇමතිවරු හිටියේ. ඉතින් වතුර වැටෙන වහළවල් නම් තිබෙන්නේ, ඒවාට වග කියන්න ඕනෑ කවුද කියන එක සම්බන්ධයෙන් වෙනමම ප්‍රශ්නයක් මතු වෙනවා. කෙසේ වෙතත් දැන් සමහරු යෝජනා කරනවා, මේ මුදල් ගන්න ඕනෑ කියලා. එතකොට මම දැන් අහන්නේ, සුභ පතන්නන්ගේ, දෙමව්පියන්ගේ මුදල් එකතු කරන නිර්නායක මොකක්ද? ඒ මුදල් පාවිච්චි වෙනවා කියලා අපි කොහොමද සහතික වෙන්නේ? කොහොමද තහවුරු වෙන්නේ? මොකක්ද ඒකේ සීමාව? ඒ නිසා එහෙම සීමාවන් හදන්න බැහැ. මේක ඇතුළේම තමයි මේ වංචා, දූෂණ පවා සිදු වෙන්නේ. ඒ නිසා හරි පැහැදිලිව මම නැවතත් යෝජනා කරන්නේ, මේ මුදල් එකතු කිරීම නතර කරන්න ඕනෑ. හැබැයි, ඒක නතර කරන්න නම් මධ්‍යම ආණ්ඩුවෙන් කියලා තිබෙනවා වාගේ 6% ක් වෙන් කරන්න ඕනෑ. හැබැයි, ඒක නිකම් හුදු ප්‍රකාශවලට විතරක් සීමා වුණොත්, වේදිකාවට විතරක්, මැතිවරණ ප්‍රකාශනවලට විතරක් සීමා වුණොත් මේ කටයුත්ත කරන්න බැහැ. ඒ නිසා අපි පළාත් සභාව විධියට බල කරන්න ඕනෑ, මේ ආණ්ඩුව පොරොන්දු වුණා වාගේම, මධ්‍යම ආණ්ඩුව පොරොන්දු වුණා වාගේම, අගමැතිතුමාත් මට මතක විධියට මේ ඊයේ පෙරෙයිදා පොත් ප්‍රදර්ශනයේදී කරපු කථාවකදී, ඔහුගේ පැත්තෙන් පැහැදිලිව කියනවා, අධ්‍යාපනය සඳහා 6% ක් වෙන් කරනවාය කියලා. ඒ පොරොන්දු වූ පරිදිම ඒක කළ යුතුයි.

ඒ වාගේම දැන් ඔවුන් නිකුත් කරපු චක්‍රලේඛයේ 05/2015 ජනවාරි 29 වැනිදා නිකුත් කරපු චක්‍රලේඛයේ කියනවා, ග්‍රාම සේවකවරයාගෙන් ලිපියක් අරගෙන ආවොත් මේ ගාස්තු අය කිරීමෙන් නිදහස් කරන්න පුළුවන්. මම අහන්නේ, මොන දෙමව්පියෝද ග්‍රාම සේවකවරයාගෙන් ලිපියක් අරගෙන ගිහිල්ලා තමන්ගේ දරුවාට සල්ලි ගෙවන්න බැහැයි කියලා පන්ති කාමරයේ ගුරුවරයාට දෙන්නේ. එහෙම දෙන්නේ නැහැ. දෙමව්පියන්ට එක පැත්තකින් ආත්ම අභිමානයක් තිබෙනවා. ඒ වාගේම ඔවුන් පන්ති කාමර තුළ ඔවුන්ගේ දරුවන් අපහසුතාවයට පත් වෙනවා. සමහර දෙමව්පියෝ මේකට කර ගත හැකි දෙයක් නොමැති නිසා මේ මුදල ගෙවන්න සිද්ධ වෙලා තිබෙනවා. මොකද, එහෙම නැත්නම් ඒ පන්තිය තුළ ඒ දරුවෝ එක පැත්තකින් කොන් වෙනවා. එක පැත්තකින් අසරණ වෙනවා. ඉතින් දරුවෝ කරදර කරනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඉතින් අපට මතකයි, රට පුරා විවිධ ප්‍රවෘත්ති නිර්මාණය වුණා. වලපනේ එක දරුවෙක් උඩමාදුර කනිෂ්ට විද්‍යාලයේ දරුවෙක් තමන්ගේ පාසලට ගාස්තු ගෙවන්න බැරිව සිය දිවි නසා ගත්තා. ඒ වාගේම බණ්ඩාරවෙල එක දරුවෙකුගේ පෝලියෝ හැදුනු තාත්තා කෙනෙක් වැලි ගොඩ දාන්න ගඟට බැස්සා තමන්ගේ දරුවාට ඉස්කෝලේ යන්න සපත්තු දෙකක් අරගෙන දෙන්න. ඉතින් එවැනි උදාහරණ ඕනෑ තරම් රට පුරා තිබෙනවා. ඉතින් බස්නාහිර පළාතෙත් එවැනි උදාහරණ නැතිවා නොවෙයි. අර අපේ සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ අපට මතකයි, හොරණ දැරිවියක් පාසලේ ගාස්තු ගෙවන්න බැරිව පොල් හොරකම් කළා. ඒ නිසා මේක හරි පැහැදිලිව අපි මධ්‍යම ආණ්ඩුවට බල කළ යුතුව තිබෙනවා. මේක පළාත් සභාවට විතරක් කරන්න පුළුවන් දෙයක් නොවෙයි. අධ්‍යාපනය සඳහා 6% ක් වෙන් කරන්න. එසේ කළ හැකියි. ඇයි බැරි? මොකද, අපි ලෝකය පුරා උදාහරණ ගත්තොත් කල්පනා

කරලා බලන්න. කියුබාවේ 12.8% ක් අධ්‍යාපනයට වෙන් කරනවා. ඩෙන්මාර්කයේ 8.6% ක් අධ්‍යාපනය සඳහා වෙන් කරනවා. වියට්නාමයේ අධ්‍යාපනය සඳහා 6.3% ක් වෙන් කරනවා. ඒ වාගේම එක්සත් රාජධානියේ අධ්‍යාපනය සඳහා 6% ක් වෙන් කරනවා. ජපානයේ 3.8% යි. ඉන්දියාවේ 3.9% යි. මේ ආදී වශයෙන් ලෝකය පුරාම රටවල් අධ්‍යාපනය සඳහා ප්‍රමුඛතාවය දෙනවා. විශේෂයෙන්ම මා සඳහන් කරපු සමහර රටවල්, කියුබාව, වියට්නාමය වැනි රටවල් 6% ක් ඉක්මවලා අධ්‍යාපනය වෙනුවෙන් ප්‍රතිපාදන වෙන් කරනවා.

ඒ නිසා මේක වෙන කිසිවක් නොවෙයි. 1977 න් පස්සේ අපේ රට තුළ ක්‍රියාත්මක වුණා නව ලිබරල් ආර්ථික රටාව. ඒ රටාවේ එක ප්‍රතිඵලයක් තමයි අධ්‍යාපනයට, සෞඛ්‍යයට, ප්‍රවාහනයට, විදුලියට මේ ආදී සේවාවන් කප්පාදු කිරීම. ඒ සේවාවන් කප්පාදු කිරීම ඇතුළේ තමයි අද අධ්‍යාපනයට මේ ඉරණම අත් වෙලා තිබෙන්නේ. මේ අපේ රටේ තිබෙන ආර්ථික රටාව ඇතුළේ. ඒ නිසා මේ ආණ්ඩු තවදුරටත් ජනතාව මත මේ බර පටවන්නේ නැතිව, අනිවාර්යයෙන්ම ලබන අයවැයෙන් අධ්‍යාපනයට 6% ක් වෙන් කරන්න. එහි කොටස බස්නාහිර පළාත් සභාවට දෙන්න. අන්න ඒ කටයුත්ත කරමින් බස්නාහිර පළාතේ දරුවන්ගෙන් පාසල් නඩත්තුව සඳහා මුදල් එකතු කිරීම නතර කරන්න කියන යෝජනාව නැවතත් කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

අද ගරු දිනය වෙනුවෙන් මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමාත්, ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමාත් දෙන්නාම ඉදිරිපත් කරලා තිබෙන්නේ එකම ආකාරයේ යෝජනා. බොහොම හොඳයි. කොහොම වුණත්, මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ යෝජනාවට පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරු කරුණු ඉදිරිපත් කළා. ඒ සඳහා එකඟතාවය විමසනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

## පෞද්ගලික මන්ත්‍රී යෝජනාව : II
PRIVATE MEMBERS MOTION: II

## පළමු ශ්‍රේණියට ළමුන් ඇතුළත් කිරීම විධිමත් කිරීම
REGULARIZING ADMISSION OF STUDENTS TO GRADE ONE

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පහත සඳහන් යෝජනාව මම ඉදිරිපත් කරනවා.

*"බස්නාහිර පළාත් පාසල් සඳහා පළමු ශ්‍රේණියට ළමුන් ඇතුළත් කර ගැනීමේදී දරුවන් හා දෙමව්පියන් පීඩාවට පත් කරන වර්තමාන ක්‍රමවේදය වෙනස් කිරීමේ අවශ්‍යතාවය මතුව ඇත. ඒ සඳහා දරුවන් පාසලට ඇතුළත් කර ගන්නා දින සිට මාසයක් ඉක්ම යාමට පෙර සියලු පුරප්පාඩු පුරවා අවසන් කිරීමත්, ආරක්ෂක අංශවල සේවයේ නියුක්ත වූවන්ගේ නාම ලේඛනය දරුවන් ඇතුළත් කර ගත් දිනයේ සිට සති තුනක් ඉක්ම යාමට පෙර පළාත් සභාවට ලැබීමට සැලැස්වීමත්, පාලක පක්ෂ මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත් කරන නාම ලේඛනයට අනුව ළමුන් ඇතුළත් කර ගන්නා ක්‍රමය අහෝසි කිරීමත්, සම්මුඛ පරීක්ෂණවලට සහභාගී වන සෑම දරුවෙකුටම ලැබෙන ලකුණු අනුව ස්ථිර ලේඛනයක් ලකුණු අනුපිළිවෙළට අනුව සකස් කිරීමත්, ලබා ගන්නා ලකුණු අනු පිළිවෙළට අනුව පාසලට දරුවන් ඇතුළත් කිරීමට පියවර ගැනීමත් කළ යුතු යැයිද, ඒ අනුව බස්නාහිර පළාතේ පාසල්වලට පළමු වන ශ්‍රේණියට ළමුන් ඇතුළත් කිරීමේ කටයුතු විධිමත් කර, පාසලකට දරුවෙකු ඇතුළත් කිරීමට තිබෙන මානව අයිතිය පළාතේ ජනතාවට තහවුරු කළ යුතු යැයි ද මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව අදහස් කරයි."*

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

***[විසින් ස්ථිර කරන ලදී. ]***
*[Seconded]*

[අ.භා. 01.03]

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ ඉදිරිපත් වුණු යෝජනා දෙකම ඇත්තටම දරුවෝ හැටියටත්, දෙමව්පියෝ

[ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි]

හැටියටත් පීඩාවට පත් වන තත්ත්වයක් මේ තිබෙන්නේ. අපි දන්නවා, පළමු වැනි ශ්‍රේණියට ළමයා ඇතුළත් කර ගන්නවාය කියලා කියන්නේ, විශේෂයෙන්ම තමන්ගේ පළමුවැනි දරුවා ඉස්කෝලේ යන දිනය කියලා කියන්නේ දෙමව්පියන්ට ඒක විශේෂිත දිනයක්. ඒක මංගල දිනයක්, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. නමුත් අපේ රටේ බොහෝ දෙමව්පියන්ට ඒ මංගල දිනය භුක්ති විඳින්න හැකියාවක් නැහැ. විශේෂයෙන්ම පළමු වැනි ශ්‍රේණියට ළමුන් ඇතුළත් කර ගන්නා සම්මුඛ පරීක්ෂණයට ගිහිල්ලා ඇවිල්ලා ගෙදර ඉන්නේ හරිම පීඩනයකින්. එහෙම තත්ත්වයක් තිබෙන්නේ. සමහර වෙලාවට අගෝස්තු මාසය පමණ වෙනවා ළමයා ඉස්කෝලෙට දාන්න. අල්ලපු වත්තේ එකට මොන්ටිසෝරියට ගිය අනෙක් ළමයා ඉස්කෝලෙට යනවා. ඒ ළමයා ඉස්කෝලේ යන දිහා අර පුංචි ළමයා අසරණ විධියට බලා ගෙන ඉන්නවා. මොකද, ගෙදර කථා වෙන්නේත් ඒ මාතෘකාව ගැන. අපි ලෝක ළමා දිනය සැමරුවේ ඊයේ පෙරෙයිදා. මෙන්න මේවා තමයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඇත්තටම අපේ දරුවෝ පීඩාවට පත් වන තත්ත්වයන්. ඒකේදී දරුවොත් පීඩාවට පත් වෙනවා. දෙමව්පියෝත් පීඩාවට පත් වෙනවා. මෙන්න මේ ප්‍රශ්නයට උත්තරයක් අවශ්‍යයි. විශේෂයෙන්ම පළාත් සභාවේ. මම විශ්වාස කරනවා, විශේෂයෙන්ම අපේ අලුත් මහ ඇමතිතුමා පත් වුණාට පස්සේ එතුමා කරපු පළමුවැනි කථාවේම ඇල්លුවේ මෙන්න මේ කැල්ල. එතුමා කිව්වා, ජනවාරි 18 වැනිදා වන කොට ළමයි ඔක්කොම ඉස්කෝලෙට දාලා ඉවර කරන්න මම පියවර ගන්නවාය කියලා. මම හිතන්නේ, එතුමාටත් ඒකේ මොකක් හරි දැණුනු පීඩනයක් තිබෙනවා. ඒ නිසා අපි විශ්වාස කරනවා, මේ බස්නාහිර පළාත් සභාව හැටියට වෙන මොකුත් නොවෙයි. මෙන්න මේ වැඩේ බස්නාහිර පළාතේ ඉන්න දෙමව්පියන්ට කරලා දුන්නත්, දරුවන්ට කරලා දුන්නත් මේක ලොකු දෙයක් කියලා.

විශේෂයෙන්ම පසුගිය කාලයේ මේකට ලොකු සූදානමක් තිබුණේ නැහැ. මේ තත්ත්වයට සූදානමක් තිබුණේ නැහැ. ඇත්තටම මේ කාරණය සම්බන්ධව මම ප්‍රශ්න යොමු කරලා ඒකට උත්තර ලබා ගත්තා අපේ හිටපු ගරු ප්‍රධාන අමාත්‍යතුමාගෙන්. ඒ වාගේ ඒකට ඇත්ත සූදානමක් තිබුණාද කියන සැකයක් තිබෙනවා. අපි විශ්වාස කරනවා, අලුත් ප්‍රධාන අමාත්‍යතුමා කියපු දේත් එක්ක කිසියම් ප්‍රමාණයකින් එතුමාටත් ඒ අවශ්‍යතාවය තිබෙන නිසා අපි ඔක්කොම එකට එකතු වුණොත් මේක සාර්ථක කර ගන්න පුළුවන් කියලා. මේක අමාරු කාර්යයක් නොවෙයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. එකක් තමයි මේකට අමුතුවෙන් ක්‍රමවේද හදන්න ඕනෑ නැහැ.

මම ඊයේ පෙරෙයිදාත් ඇත්තටම ඒත් ඔය දරුවන් දෙදෙනෙකුගේ කටයුත්තකට ප්‍රධාන අමාත්‍යතුමා හමු වෙන්න ආවා. අධ්‍යාපන ඇමතිතුමා හිටියේ නැහැ. එදා ප්‍රධාන අමාත්‍යතුමාට ඇත්තටම ටොයිලට් එකට යන්න විධියක් නැහැ. බාත්රූම් එකට ගිහිල්ලා එනකල් විශාල පිරිසක් දොරකොඩ ඉන්නවා. ඒ හිටපු ගොඩක් අයට තමන්ගේ ළමයා ඉස්කෝලේ දා ගන්න තිබෙන ප්‍රශ්නය තමයි තිබෙන්නේ. ඇත්තටම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපට ප්‍රශ්නයක් තිබෙනවා. අපේ රාජකාරිය, ප්‍රධාන අමාත්‍යතුමාගේ රාජකාරිය ළමයි ඉස්කෝලවලට දාන එකද කියලා. ඒකද අපට කරන්න වෙලා තිබෙන රාජකාරිය. ඒක අපේ රාජකාරියක් නොවෙයි, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි.

අපි දන්නවා, ජාතික පාසල් ටික ඇරුණාම විශාල පාසල් ප්‍රමාණයක් අයිතිව තිබෙන්නේ අපට. එතකොට ඒ පාසල්වල නොයෙකුත් ප්‍රශ්න තිබෙනවා. ඒ ප්‍රශ්න කියලා කියන්නේ, ඇත්තටම ළමයි ඉස්කෝලේ දාන එකට නොවෙයි. ඒ පාසලේ අධ්‍යාපනය පැත්තෙන් දියුණු කර ගැනීම, ඒ රේඛීය අමාත්‍යාංශය යටතේ තිබෙන වැඩ පිළිවෙළක් තිබෙනවා නම්, ඒ වැඩ පිළිවෙළ වඩාත් හොඳින් පළාත් සභාව තුළ ක්‍රියාත්මක කර ගැනීම, ඒ සඳහා අපට පළාත් සභාව ඇතුළේ සාකච්ඡා කරලා ඒ සම්බන්ධව ක්‍රමවේද හදන එක. ඒවා තමයි අපට තිබෙන වැඩ. ඇත්තටම ළමයින් ඉස්කෝලේ දාන එක නොවෙයි අපට තිබෙන වැඩේ. නමුත් අපි අර සියල්ල පැත්තකට තියලා, බොහෝ වෙලාවට අපටත් මන්ත්‍රීවරු හැටියට වෙලා තිබෙන්නේ අපේ ළඟට එන දෙමව්පියන්ගේ දුක් ගැනවිලි ඔස්සේ අපට ළමයා ඉස්කෝලෙට දාලා දෙන්න කටයුතු කරන එක තමයි වෙලා තිබෙන්නේ. ප්‍රධාන ඇමතිතුමාටත් වෙලා තිබෙන්නේ ඒක. ඒ නිසා තමයි එතුමාව මහජන දිනය දවසේ වට කර ගෙන ඉන්නේ. මෙන්න මේ තත්ත්වය වෙනස් කර ගන්න ඕනෑ. ඒ වෙනස් කිරීම් කරලා අපි මේකට නිසි ක්‍රමවේදය හදන්න ඕනෑ. ඇත්තටම කිව්වොත් එහෙම ජනවාරි මාසය ඉවර වෙන්න ඉස්සෙල්ලා මේ ළමයින් ටික පන්තිවල වාඩි කර ගන්න පුළුවන් විධියට අපි අපේ කටයුත්ත කරන්න ඕනෑ.

ඇත්තටම දැන් අපි දන්නවා, මධ්‍යම ආණ්ඩුව යටතේ දැන් කිහිප වරක්ම මේ චක්‍රලේඛ සංශෝධනය කළා. ඒ චක්‍රලේඛ කොපමණ සංශෝධනය කළත් ඒකට 100% ක් උත්තරේ එන්නේ නැහැ. ඒකට 100% ක් උත්තරේ එන්නේ නැත්තේ එක හේතුවක් තමයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අර කිව්වා වාගේම ඇත්තටම අධ්‍යාපනය පැත්තෙන් අපි වෙන් කරන ප්‍රතිපාදනවල තිබෙන තත්ත්වය. එතකොට අපි ගමේ පාසලට ළමයා ඇතුළත් කර ගන්න පුළුවන් විධියට ඒ පාසල දියුණු කිරීම එක කටයුත්තක්. මම විශ්වාස කරන්නේ නැහැ, ඒක අපට එක පාරටම කරන්න පුළුවන්ය කියලා. ඒක යථාර්ථයක් නොවෙයි. හැබැයි, අපි අවම පහසුකම් ටිකවත් ගමේ පාසලට හදන්න ඕනෑ. එතකොට ඒකෙන් යම් ප්‍රමාණයක් අර ජනප්‍රිය යැයි කියා ගන්නා පාසලට ඇතුළත් කර ගන්න තිබෙන උත්සාහයෙන් කිසියම් ප්‍රමාණයක් හෝ මේකෙන් ගැලවෙනවා. ඒ එකක්. අනික් එක තමයි, සම්මුඛ පරීක්ෂණවලදී ළමයින් ඇතුළත් කර ගන්න ඒ තිබෙන ක්‍රමවේදය. ඒකට අනුව අපි ලකුණු දෙන පිළිවෙළක් තිබෙනවා. මම කියන්නේ නැහැ, ඒ ලකුණු දෙන පිළිවෙළ සර්ව සම්පූර්ණයෙන්ම හරි කියලා. හරිම ක්‍රමය තමයි ඔය තියෙන්නේ කියලා මම කියන්නේ නැහැ. නමුත් කොහොම හරි අපට තිබෙන චක්‍රලේඛය අනුව දැන් තිබෙන ක්‍රමය ඒක. ඒ ක්‍රමය අනුව ලකුණු ගන්නා වූ අනු පිළිවෙළක් තිබෙනවා. අන්න ඒ අනුපිළිවෙළ අනුව, ඒ අනු පිළිවෙළට අපට භාර දෙන්න පුළුවන් මේ වැඩේ. ඒකේ මොකක් හරි අභියාචනා ඉදිරිපත් කරලා, ඒ අභියාචනාවලිනුත් අසාධාරණයක් වෙලා තිබෙනවා නම්, පළාත් සභාව හැටියට එක එක්කෙනාට අර විධියට ළමයි දානවා වෙනුවට, අපට ඒ සඳහා මොකක් හරි කමිටුවවක් හරි පත් කරලා, ඇත්තටම ඒ කමිටුව හරහා ඒකට සාධාරණත්වය ඉෂ්ට කරන්න අපට පුළුවන්, ඒකේ තවදුරටත් ප්‍රශ්න තිබෙනවා නම්. හැබැයි, අපට පුළුවන්කම තිබෙන්න ඕනෑ, අර ලකුණු දෙන ක්‍රමවේදයට අනුව, ඒ ලකුණු පිළිවෙළට ඉතිරි ළමයි ටික ගන්න.

දැන් මේකේ තිබෙනවා, ක්‍රියාන්විතය කියලා. දැන් ඇත්තටම ක්‍රියාන්විතයක් නැහැ. ඇත්තටම ක්‍රියාන්විතයෙන් ළමයින් දාන්නේ නැහැ. අපි දන්නවා, පසුගිය කාලයේ විශේෂයෙන්ම ජාතික පාසල්වල මේ රටේ ඇත්ත රණවිරුවන්ගේ ළමයින් ඉස්කෝලවලට දැම්මේ නැහැ. ඒ අයට තමයි අසාධාරණය තිබෙන්නේ. අනික් අයට නම්, සාමාන්‍යයෙන් සිවිල් සමාජයට නම් තිබෙනවා, තමන්ට උත්සාහයක් හරි ගන්න පුළුවන් තමන් කැමැති පාසලට ළමයා දාන්න. හැබැයි, අර රණවරුවාය කියපු ඒ මිනිස්සුන්ට ඒ හැකියාව නැහැ. ඒ මිනිස්සුන්ට ආරක්ෂක අමාත්‍යාංශයෙන් දෙන ඉස්කෝලෙට යන්න ඕනෑ. කැමැති වුණත්. අකමැති වුණත්. වෙන කරන්න දෙයක් නැහැ. ඒ නිසා ජාතික පාසල්වලත්, ඒ කෝටා එකක් ඒගොල්ලෝ තියා ගත්තාට අර රණවිරුවන්ගේ ළමයින් ඉස්කෝලවලට දාන්නය කියලා, ඔය කවුරුවත් ඒ රණවිරුවන්ගේ ළමයි ඉස්කෝලවලට දාලා නැහැ. ළමයි දාලා තිබෙන්නේ සල්ලිවලට. පසුගිය කාලේ ඒක එක තැනකින් ගිහිල්ලා තිබෙන්නේ. එක තැනකින් කරලා තිබෙන්නේ. අඩුම තරමින් අධ්‍යාපන ඇමතිවත් නොවෙයි ඒක කරලා තිබෙන්නේ. අධ්‍යාපන ඇමතිට බලතල තිබුණේ නැහැ. අධ්‍යාපන ඇමති ඒකෙන් පැත්තකට විසි කරලා තිබුණේ. එතකොට ඒවායේත් කරන්නේ ඒක තමයි. ඒ ප්‍රශ්නය මෝරන්න දීලා, ජූනි මාසේ, ජූලි මාසේ, අගෝස්තු මාසේ තමයි ඒක සම්පූර්ණ කරන්නේ. පළාත් සභා පාසල්වලටත් ඒකයි. පළාත් සභා පාසල්වලට මේ ජනප්‍රියයි කියන පාසලට ක්‍රියාන්විතයෙන් ළමයි එන්නේ නැහැ. ක්‍රියාන්විතයෙන් ළමයි එවන්නේ නැහැ. ඒගොල්ලන්ට දුන්නොත් තමයි ඒගොල්ලන්ට එන්න පුළුවන්. ඒගොල්ලන්ට ඒ සඳහා දෙන්නේ නැහැ. ඒ නිසා අර Vacancy ය තිබෙනවා. Vacancy ය ඉතිරි වෙනවා. ඒ පුටු ටික පාසලේ තිබෙනවා. 33 යි නම් ගන්නේ, ළමයි 33 යි වාඩි කරලා තිබෙන්නේ.

හැබැයි, විදුහල්පතිවරයාගෙන් ඇහුවොත් එහෙම Vacancy නැහැ. විදුහල්පතිතුමා කියන්නේ වෙන මොකක්වත් නොවෙයි. මේක මට පුරවන්න පුළුවන් එකක් නොවෙයි. මේක ක්‍රියාන්විතයෙන් එන්න තිබෙන එකක්. එතකොට ඒකෙන් ඒ ළමයින් ආවේ නැත්නම් ඒක තියෙන්නේ අධ්‍යාපන අමාත්‍යාංශයේ, පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව හරහා මේ වැඩේ යන්න ඕනෑ. පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ හරහා ඒ වැඩේ යන්නේ. පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂකගෙනුත් නොවෙයි ඒ වැඩේ වෙන්නේ. පසුගිය කාලේ එහෙම නොවෙයි වුණේ. ඒකට වෙනම ක්‍රමවේදයක් හදලා තිබුණා. ඒ ළමයි ඉස්කෝලේ දාන වැඩේට. ඔන්න ඔය ක්‍රමවේදය අහෝසි වෙන්න ඕනෑ. ඒක වෙනස් වෙන්න ඕනෑ. ඒක වෙනස් වෙලා අර ලකුණු අනු පිළිවෙළට ළමයා දාන්න පුළුවන් ක්‍රමවේදය හදන්න ඕනෑ. ඒකෙන් මම කියන්නේ නැහැ, ඔය දෙන ලකුණු ක්‍රමවේදය හරියටම සර්ව සාධාරණ ක්‍රමවේදයක් කියලා. එහෙම කියන්නෙත් නැහැ. ඒ නිසා තමයි මම කියන්නේ, ඒකේ

[ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි]

අඩුපාඩුවක් තිබෙනවා නම්, අන්න ඒ අඩුපාඩුව සම්පූර්ණ කිරීම සඳහා පළාත් සභාව ඒ සඳහා කමිටුවක් හරි පත් කරලා, අන්න ඒ කමිටුවකින් ඒ අවශ්‍ය පියවර ගන්න ඕනෑ. එක්කෙනෙකුට දෙන්නෙකුට ඒ අයිතිය දෙන්නේ නැතිව. ඒ නිසා ඇත්තටම මේ යෝජනාව හරහා අපි ක්‍රියාත්මක වුණොත් විශාල පීඩනයකින් අපේ බස්නාහිර පළාතේ මේ පාසලට පළමුවැනි ශ්‍රේණියට ළමයින් ඇතුළත් කර ගෙන දෙමව්පියන්ට මේ සඳහා ඉඩකඩක් හම්බ වෙනවා. අන්න ඒ ඉඩකඩ සලසා දීම සඳහා ඒ ඇත්ත වුවමනාවෙන් තමයි මේ යෝජනාව ගේන්නේ. ඒ නිසා මේ යෝජනාව ගෙනාවාට වැඩක් නැහැ. මේ යෝජනාවලට අනුව ඇත්තටම අපේ පළාත් සභාවේ ක්‍රමවේදය ඒ සියල්ල සකස් කරන්න ඕනෑ. නිලධාරීන්ගේ සිට ඒ තිබෙන සමහර හැදිලා තිබෙන හැටි තිබෙනවා. ක්‍රම තිබෙනවා. ඒවා වෙනස් කරලා දේශපාලන බල අධිකාරීත්වය මේ සඳහා අවශ්‍ය, අවංක පියවර ගත යුතුයි කියන යෝජනාව කරමින් මගේ යෝජනාව ඉදිරිපත් කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 01.12]

**ගරු ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාව බොහොම කාලෝචිත යෝජනාවක් විධියට සලකලා අපි සාකච්ඡාවට ගන්න මොහොතේ, ඇත්තෙන්ම ක්‍රියාන්විතයේ කියලා කොහේදෝ ඉපදුනු බ්‍රිගේඩියර්ලා, මේජර්ලා කොළඹ 07 නිල නිවසේ ඉඳගෙන ඒ දරුවන්ව ප්‍රසිද්ධ පාසල්වලට ඇතුළත් කර ගන්නවා. ලයිට් බිල බලන්නෙත් නැහැ. කිසිම දෙයක් බලන්නෙත් නැහැ. ගමේ ඉපදුණු සාමාන්‍ය දරුවා, සම්බන්ධයෙන් සියල්ල බලනවා. විවාහයෙන් පසුව වෙනම පැළක ජීවත් වෙන්න පටන් ගත්තාම තමන්ගේ දරුවා ඉපදිලා අවුරුදු පහක් යන කොට ඒ දරුවාව පාසලට ඇතුළත් කර ගන්න කොට විදුලි බිල සොයනවා. ඔප්පුව ගැන බලනවා. සාධාරණයි බැලීම. නමුත් ඒ පෙළපත අනුව හරි ඒක අනුමත කරලා ඒ දරුවන්ව ඇතුළත් කරන්නය කියලා බස්නාහිර පළාතේ අධ්‍යාපන ඇමතිතුමාට කනගාටුවෙන් හරි යෝජනා කරන්න වෙනවා.

දෙවැනි කාරණාව. ඊයේ පෙරේයිදා බේරුවල කොට්ඨාශයේ මතු වුණු කාරණාවක් ගරු අමාත්‍යතුමනි, දරුවෙක් ඇතුළු කරන්න ගියාම එක ලකුණක් අඩු වෙලා තිබෙනවා, විදුලි බිල නැහැයි කියලා. දරුවාගේ තාත්තා අම්මාව අත හැරලා ගිහිල්ලා. සීයාගේ නමින් තිබෙන විදුලි බිල වෙනස් කර ගන්න බැහැ. සීයා මැරිලා. සීයාගෙන් ලියුමක් ගේන්නය කියනවා. මරණ සහතිකය දෙන්න මරණ සහතිකය අරගෙන නැහැ. දැන් මේ දරුවා මේ වසරේදී ඇතුළු කර ගන්නේ නැහැ. එතකොට මේකට විසඳුමක් මේ ක්‍රමවේදය තුළ ඇති කරන්නට වෙනවා, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. ඒ නිසා මේ සියලු කාරණා, අරගෙන එක වසරට ළමයින් ඇතුළත් කර ගන්න කොට අපේ ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ, 90% ක් දරුවෝ සතුටින් පාසල්වලට ඇතුළු වෙන කොට ඒ ගම්වල 10% ක් දරුවෝ හඬා වැලපෙමින් දෙමව්පියෝ එක්ක මාස ගණනාවක් ගෙවල්වල ඉඳගෙන, වසර මැද තමයි පාසලට යන්නේ. ඒ වාගේම පසුගිය 2014 අවුරුද්දේ ඇතුළු වෙන්න බැරිව, අවුරුදු ගණනාවක් ඉන්න දරුවෝත් 2014 වසරට ඇතුළු වෙන්න බලාපොරොත්තුවෙන් ඉන්න දරුවෝත් සමහර අය ඉන්නවා කියන එක මතක් කරන්නට ඕනෑ. දෙපාර්තමේන්තුව කියනවා, ඒ අයට අධ්‍යාපනය ලබන්නට අපි ඉස්කෝලයක් දෙනවා කියලා. ඒ දෙමව්පියෝ අවුරුද්දක් විතර උත්සාහ කරලා, මේ ලියකියවිලි හදාගෙන ගිහිල්ලා, මේ ලියකියවිලි ඉදිරිපත් කළාම ඒ පාසලේ විදුහල්පතිතුමා මුහුණට වීසි කරලා දානවා මේක භාර ගන්න බැහැයි කියලා. ඒ දුක් වේදනාවත් එක්ක දරුවාගේ අධ්‍යාපනයත් එපා වෙලා, තමන්ගේ ජීවිතයත් නැති කර ගන්න තරමට අද මේ රට පත් වෙලා තිබෙන්නේ, මේ පසුගිය දවස්වල සිද්ධ වුණු මේ කාරණා නිසා.

ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බස්නාහිර පළාත් සභාවේ අධ්‍යාපන අමාත්‍යතුමාට මේ කාරණාව යොමු කරලා, මම හිතන්නේ යහපාලනයක් තුළ අපේ රජය, අපේ ඇමතිතුමා එක්ක මේක සාකච්ඡා කරන්නට වෙනවා. මේ ක්‍රමවේදය වෙනස් කරන්නට ඕනෑ. මම හිතන්නේ අදටත්, මේ ලබන වසර වන කොටත් යමක් කමක් තිබෙන අය, ආර්ථික අතින් පෝෂණය වුණු අය තමන් කැමැති පාසලට ඇතුළු වෙනවා. මම දන්නවා. සමහර ප්‍රදේශ. දුව විවාහ වෙන කොට රෝයල් එක ළඟ, එහෙම නැත්නම් විසාකා එක ළඟ මේ ගෙවල් දෙකක් ලියාපදිංචි කරනවා කුලියට අරගෙන. ඡන්දය ලියාපදිංචි කරනවා. දරුවා ඉපදිලත් නැහැ. දුවගේ විවාහ මංගල්‍යය යෝජනා කරන කොට එහෙම කර ගත්ත අය මම දන්නවා. මම නම්

කියන්නේ නැහැ. දරුවා ඉපදුනාම අවුරුදු පහක් කුලිය ගෙවලා, හය වන අවුරුද්දේ ඒ පාසලට ඇතුළු කළාම නුගේගොඩ පැත්තෙන්, නැත්නම් මොරටුව පැත්තෙන් ගෙයක් අරගෙන ඒ පළාතේ ඉඳලා නැවත දරුවා ඉස්කෝලේ එවනවා. ඒ නිසා මෙලෙස සූක්ෂම ලෙස ක්‍රියාත්මක වන අය ජයග්‍රහණය කරනවා. තමන්ගේ ඉපදුනු දා ඉඳලා ජීවත් වෙලා, දරුවා වැඩුණු තැන ඉන්න දරුවාට අසාධාරණයක් සිද්ධ වෙනවා. අර මම කලින් කිව්වා වාගේ, කොළඹ කොහේ හරි ඉපදුනු බ්‍රිගේඩියර්ලා ක්‍රියාන්විතයට ඇතුළු වෙලා හොඳ පාසලකට දරුවන්ව ඇතුළු කරනවා. කොළඹ ඉපදුනු, ක්‍රියාන්විතයේ යුද්ධ කරන සෙබළාගේ ඒ දරුවාව ඇතුළු කරන්න බැහැ Royal එකට. ඒ බ්‍රිගේඩියර් කියන පාසලට තමයි ඒ දරුවාව ඇතුළු කරන්න වෙන්නේ. ඒ නිසා මේ ක්‍රමවේදය වෙනස් වෙන්නට ඕනෑ. ඒ වෙනස් කරලා සාධාරණයක් ඉෂ්ට කරන්නය කියලා යෝජනා කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මෙම යෝජනාවන් දෙකම සඳහා අදහස් දැක්වීමට ගරු අධ්‍යාපන අමාත්‍යතුමාට අවස්ථාව ලබා දෙනවා.

[අ.භා. 01.17]

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම හිතන්නේ මගේ සේවා කාලය තුළම, අධ්‍යාපන ක්ෂේත්‍රය පිළිබඳව මම බොහෝ අත්දැකීම් ලබලා තිබෙනවා. ඒ වාගේම ප්‍රශ්න දෙකක් සඳහා එක විට පිළිතුරු සපයන එකම අවස්ථාවත් මේ අවස්ථාව වෙන්නට ඕනෑ. මම දන්නේ නැහැ, රීති ප්‍රකාරව කුමක්ද කියන එක. නමුත් සභාවේ එකඟතාවය තුළ මම ඒ සඳහා එකඟත්වය පළ කළා. විශේෂයෙන් අධ්‍යාපන ක්ෂේත්‍රය දුක් කම්කටොළු, සෝ සුසුම්, ඒ වාගේම තිත්ත, පැණි රහ මේ සියල්ල හොඳින් අත් විඳපු, හොඳින් ග්‍රහණය කළ කෙනෙක් හැටියටයි මම කල්පනා කරගෙන ඉන්නේ. විශේෂයෙන් මම මතක් කරන්න ඕනෑ. මේ රටේ තිබෙන අධ්‍යාපන ක්‍රමය යටතේ අපේ බොහෝ දරුවන්ට මේ අධ්‍යාපනයේ බොහෝ අවස්ථාවන් අහිමි වෙලා තිබෙනවා. ඒ නිසාවෙන් බස්නාහිර පළාත් සභාව හැටියට මම අධ්‍යාපන අමාත්‍යාංශය භාර ගත්ත දවසේම තමයි - සවස් වරුව මතක් කරන්න ඕනෑ. වැඩ භාර ගත්ත දවසේම තමයි අධ්‍යාපන කලාප 11 ම නිළධාරීන්ව කැඳවලා පළමුවැනි සාකච්ඡාව තිබුණේ. ඉතින් අද මහින්ද ජයසිංහ අපේ ගරු මන්ත්‍රීතුමාට ප්‍රථමයෙන් මම ස්තුතිවන්ත වෙනවා. එතුමා අධ්‍යාපනය කෙරෙහි බොහොම නැඹුරුවක් ඇති, බොහොම ඕනෑකමක් ඇති මන්ත්‍රීවරයෙක්. ඒ වාගේම ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමාත් දීර්ඝ කාලයක් අත්දැකීම් ලබලා, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව පවා නියෝජනය කරපු මන්ත්‍රීවරයෙක්. ඉතින් ඒ වාගේම අපේ අනිකුත් ගරු මන්ත්‍රීතුමන්ලා බොහෝ අදහස් ප්‍රකාශ කළා. අපේ ගාමිණී තිලකසිරි ගරු ඇමැතිතුමා බොහෝ අත්දැකීම් තිබෙන කෙනෙක්. ඒ වාගේම ඉෆ්තිකාර් ගරු මන්ත්‍රීතුමා අපේ මුස්ලිම් ජනතාව නියෝජනය කරන, මේ ක්ෂේත්‍රයේ එක්තරා කටුක පැත්තක් මට පැහැදිලි කළා. ඒ වාගේම ප්‍රසන්න සංජීව ගරු මන්ත්‍රීතුමා, මම ඒ පළාත දන්නවා. බේරුවල ප්‍රදේශයේ අපට ධීවර දරුවොත් ඉන්නවා. දුෂ්කරතාවයන් තිබෙන දරුවන් ඉන්නවා. ඒ වාගේම සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා, අලුත් දේවල් ඉදිරිපත් කරන අලුත් පක්ෂයකටත් ගියා. මම ඇහුවා, දැන් මාවත් ඒකට හදිස්සියේ එහෙම ගන්නවාද කියලා. ඉතින් බොහෝ අත්දැකීම් බහුල පිරිසක් තමයි මේ අදහස් ප්‍රකාශ කළේ.

මම කියන්න ඕනෑ, ඉස්සෙල්ලාම මේ අධ්‍යාපන අමාත්‍යාංශය සම්බන්ධව. අපේ ඉන්න ගුරු භවතුන්ට, විදුහල්පතිවරුන්ට සහ අපේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඉන්න අයට හොඳ ගෞරවයක් ඇති කරන්න ඕනෑ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම වැඩ භාරගත්ත දවසේ කිව්වා. මේ අධ්‍යාපන අමාත්‍යාංශයේ මීට පස්සේ නින්දා, අපහාස, ගර්ජනය කිරීම්, බැණ වැදීම්, එහෙම නැත්නම් හිංසා කිරීමේ වචනයක් පවා මේ අමාත්‍යාංශයේ ඇමැතිවරයාගෙන් වෙන්නේ නැහැ. ඒ වාගේම මේ අමාත්‍යාංශයේ කිසිම නිලධාරියෙක්ගෙන් වෙන්න මම ඉඩ තියන්නේ නැහැ. මේ අමාත්‍යාංශය හොඳට ඇහුම්කන් දෙන අමාත්‍යාංශයක් බවට පත් කරනවා. මේ අමාත්‍යාංශයට එන ගල් මුල් ඔක්කොම විඳ දරාගන්න පුළුවන් ජ්‍යෝෂ්ඨ මන්ත්‍රීවරයෙක්, අද අධ්‍යාපන ඇමැතිවරයෙක් මම. ඉතාම දුෂ්කර ප්‍රදේශවල නියෝජනය වෙලා, දීර්ඝ කාලයක් ඈත දුෂ්කර දරුවනුත් එක්ක කටයුතු කරලා - ඒක ඉතින් මම විස්තර කියන්න ඕනෑ නැහැ. කවුරුත් දන්වා නේ. අගලවත්ත, බුලත්සිංහල ප්‍රදේශයේ මගේ සේවාව වැඩියෙන්ම සිද්ධ වුණේ. කළුතර දිස්ත්‍රික්කයේ. ඒ කාලයේ චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරණතුංග මැතිනියත් එක්ක අපි, අදත් ඉන්නවා සේවය

[ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා]

කරපු කිහිප දෙනෙක්. ඒ වාගේම මොරිස් රාජපක්ෂ අපේ දිවංගත මහ ඇමැතිතුමා බොහොම හොඳ අවංක කෙනෙක්. සුසිල් ප්‍රේමජයන්ත මහ ඇමැතිතුමා අධ්‍යාපනයට හොඳ සේවාවක් කළා. ඒ වාගේම රෙජිනෝල්ඩ් කුරේ මහ ඇමැතිතුමා අධ්‍යාපනයට හොඳ සේවයක් කළා. ප්‍රසන්න රණතුංග මැතිතුමාගෙනුත් අපට සේවයක් සිද්ධ වුණා. මේ සියලු අත්දැකීම් තිබෙනවා. හැබැයි, මම දන්න දෙයක් තිබෙනවා. අපේ දරුවන්ට බොහෝ අඩුපාඩු තිබෙනවා. භෞතිකමය වශයෙන් දරුවන්ට බොහෝ පීඩනයන්වලට අද මුහුණ දෙන්න සිද්ධ වෙලා තිබෙනවා. මොකද, සම්පත් බෙදී යාමේ විෂමතාවය. මේක අපේ මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමා බොහොම හොඳින් පැහැදිලි කළා. ඒ වාගේම අනන්ද හරිස්චන්ද්‍ර ගරු මන්ත්‍රීතුමාත් පැහැදිලි කළා. මම අහගෙන සිටියා. මේ මුදල් ගන්නේ ඇයි? මුදල් ගන්න පෙළඹෙන්නේ ඇයි? මුදල් එකතු කරන්න පෙළඹෙන්නේ ඇයි? මට ප්‍රසන්න සංජීව ගරු මන්ත්‍රීතුමාත් පැහැදිලි කළා. ගාමිණී තිලකසිරි ගරු ඇමැතිතුමා කිව්වා, අපි එදා පොල් තෙල් පහන පත්තු කරන්න ගියා. මුදල් එක් රැස් කරන්න පෙළඹිලා තිබෙනවා කියලා කිව්වා. ඉතින් ඒකට ඍජු හොඳ උත්තරයක් අගමැතිතුමා දීලා තිබුණා. එය සාර්ථක වේවා කියලා මමත් හදවතින්ම ප්‍රාර්ථනා කරනවා.

මොකද, ලෝකයේ විවිධ රටවල්වල 12% සිට විවිධ මට්ටම්වලට අධ්‍යාපනය සඳහා වැය බරක් තබලා තිබෙනවා. ලංකාවේ 1.4% ක වැනි මුදල ගැන මම නම් කොහොමටවත් සෑහීමකට පත් වෙන්නේ නැහැ. 6% ක් නොවෙයි. අඩුම වශයෙන් 4% ක් වත් දුන්නොත් ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමනි, අපට මේ ගනුදෙනුව යම් තරමකට බේරගන්න පුළුවන් කියලයි මගේ හිතේ තිබෙන්නේ. මේ සම්පත් බෙදී යාමේ විෂමතාවය. මේක බරපතළ ගැටලුවක්. ඒ නිසාවෙන් තමයි මේ අධ්‍යාපනයේ සම්පත් සිරස් අතට ඒකරාශි වෙලා තිබෙන්නේ. ලංකාවේ බොහොමයක් දේවල් එහෙම තමයි. හොඳ පාරවල් තිබෙන්නේ නගරයේ. හොඳ සෞඛ්‍ය පහසුකම් තිබෙන්නේ නගරයේ. හොඳ පාසල් තිබෙන්නේ නගරයේ. ගමේ ඈත කෙළවරේ කොනේ විදුලියවත් නැති, පාරක් තොටක් නැති, අහිංසක ගොවියන්ගේ, අහිංසක කම්කරුවන්ගේ දරුවන්ට තිබෙන අඩුපාඩු එමටයි. ඒක මම මේ අධ්‍යාපන ඇමැතිතුමා වුණු නිසා කියන කථාවක් නොවෙයි. මේ අත්දැකීම මම විඳපු කෙනෙක්. ඒක කියන්න ඕනෑ.

ඒ නිසාවෙන් මම මගේ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකතුමන්ලා, මගේ ලේකම්තුමාත් එක්ක එකතු වෙලා අපි ආමන්ත්‍රණය කරලා මේ බව පැහැදිලි කළා. පළමුවෙන්ම කිව්වා, මේ අමාත්‍යාංශයෙන් ඔබට හොඳ ගෞරවයක් ලබා දෙනවා කියලා. ඔබ මේ රටට හොඳ අධ්‍යාපනයක් තිබෙන නිලධාරියෙක් සහ නිලධාරිනියක්. ඒ නිසාවෙන් ඔබට රටේ ගෞරවයක් තිබෙනවා. ඔබට මේ සමාජයේ ගෞරවයක් තිබෙනවා. ඒ ගෞරවය ගරු ඇමැතිතුමාගෙන් සහ අමාත්‍යාංශයෙන් අපේ උසස් නිලධාරීන්ගෙන් ලැබෙනවා. මම ඔබගෙන් ඉල්ලන්නේ මේ ඉදිරියට තිබෙන කාලය තුළ මගේ දරුවන්ට හොඳට උගන්වන්න. ඉස්සෙල්ලා මගේ දරුවෝ කියලා හිත හදා ගන්න ඕනෑ. මම කියන්නේ අවංකව. මම අවුරුදු 23 ක් දරුවන් එක්ක ඉඳලා තිබෙනවා. මම බොහෝ පාසල් නම කියන කොට දන්නවා.

පසුගිය සතියේ මම ගම්පහ දිස්ත්‍රික්කයේ පාසල් දෙකකට ගියා. ගුණසිරි ජයනාත් ගරු මන්ත්‍රීතුමාගේ පාසලකටයි, උපාලි ගුණරත්න ගරු මන්ත්‍රීතුමාගේ පාසලකටයි. තෙමහල් ගොඩනැඟිල්ලක් හදලා දෙන්නය කියලා මට ඉදිරිපත් කළා. මට ඉතින් පොඩි ඉවක් තිබෙනවා, ළමයින් ගණන කොපමණද? පන්ති ගණන කොපමණද? වර්ග අඩි කොපමණද? මට පොඩි ඉවක් තිබෙනවා. 90 යි 25 යි ගොඩනැගිල්ලක් එක්ක තමයි තෙමහල යන්නේ. ශ්‍රවණාගාරය 90 යි 25 යි. මම 90 යි 25 යි පැත්තකට තියලා මම ඉංජිනේරු මහත්මයාට කථා කරලා කිව්වා, දැන් 90 යි 25 යේ ශ්‍රවණාගාර හදලා වැඩක් නැහැ. මේ දරුවන් සංඛ්‍යාවත් එක්ක ගණනය කරලා අපි මේක උපරිමය එහාට ගමු. 120 කට යන්න පුළුවන්ද? පුළුවන්. මම ඒ දරුවන්ට කිව්වා, පුතා ඔය ශ්‍රවණාගාරය, මේකේ මේ පරණ පුටු, ඩෙස්ක් ටිකක් තියලා, අර සිමෙන්ති දාපු වේදිකාවක් හදන ශ්‍රවණාගාර දැන් පුතාලට අදාළ නැහැ. මම හොඳ ශ්‍රවණාගාරයක් හදලා දෙන්න කැප වෙනවා. තට්ටු තුන අපි දෙකක් හැටියට සකස් කරලා ඉඩ පහසුකම් සකස් කරලා උපරිම අරපිරිස්සමකින් මුදල භාවිතා කරමු. එතකොට වේදිකාව ලෑලිවලින් සකස් කරලා හොඳ තිර රෙදි වැටිලා, හොඳ ලයිට් ටිකක් වැටිලා, හොඳ පුටු ටිකක් එක්ක. මොකද, අධ්‍යාපනයේ කෙළවර සංස්කෘතිය පවරා දීම. සංස්කෘතිය මේ අධ්‍යාපනයට අතවශ්‍යයි. ඒකට මම අතිගරු ජනාධිපතිතුමාට ස්තුතිවන්ත වෙනවා. ගරු ඇමැතිතුමනි, ඔබතුමාට තමයි කලින් තිබුණේ. ඔබතුමා මගේ ළඟින් ඉන්නවා. ඉතින් හොඳයි.

සංස්කෘතියත් අධ්‍යාපනයට දුන්නා. ප්‍රසන්න සංජීව ගරු මන්ත්‍රීතුමනි, ක්‍රීඩාවත් අධ්‍යාපනයට දුන්නා. හරි හොඳයි.

හුඟක් වෙලා කථා කරන්නත් නරකයි නේද? විනාඩි 10 ක් විතර මට දෙනවාද?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

විනාඩි 05 කින් දීර්ඝ කරමු.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ඒ වේලාවට දීර්ඝ කරමු. ඉතින් ඒ නිසාවෙන් අද ඒ වාගේම බොහෝ දේවල් ගන්නවා. ඒක කියන්න ගියොත් ගොඩාක් අවුල් වෙනවා. මම ඍජු ලෙස මහින්ද ජයසිංහ අපේ ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කරපු අදහස්වලට පළමු කොට එකඟ වෙනවා. පළමු කොට. දෙවැනි කොට නොවෙයි. පළමු කොට ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කරපු අදහස්වලටත්, යෝජනාවලටත් එකඟ වෙනවා. ඒ නිසාවෙන් නේ අපි බෙදීමකින් තොරව ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේවා සම්මත කරන්නේ. දැන් ඉතින් මේකේ තිබෙන කටුක, අමිහිරි අත්දැකීම් මේකේ සිත් රිදවීම්, අහිංසක දරුවෝ. මගේ මනසේ චිත්‍රයක් මැවුනා ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා මේක හරි ලස්සනට කියාගෙන යමින්, හරි ලස්සනට ඉදිරිපත් කළා. මට හිතෙනවා, එතුමා ජනතා විමුක්ති පෙරමුණේ අර රණවිරු ගීත එහෙම ලියන්න හුරුවක් තිබෙන කෙනෙක්ද කියලා. මම අහලා නැහැ. මේ සංස්කෘතිමය පැත්ත හොඳයි වගේ. සරත් පතිරණ ගරු මන්ත්‍රීතුමනි, මට එහෙම හිතුනා. එතුමා ඉදිරිපත් කරන භාෂාමය හැකියාව. ඉතින් මට දැනුණා පුංචි පුතා, - මම ඉපදිලා තිබෙන්නේ සුන්දර වෙල් යායක් අබියස හරි ලස්සන තැනක. මගේ තාත්තා එතැන තමයි ගේ හදලා තිබෙන්නේ. ඉතින් මාව කවුරුත් දන්නවා. ඉතින් මම එතැනට ආවාම මට පෙනෙන්නේ වෙල් යාය සහ ඈත කෙළවරේ තිබෙන ඉස්සරහා පැත්තෙන් යන ඇළක්. පිටි පස්සෙන් යන දොළක්. ඉතින් හොඳ ලස්සන තැනක ඉන්නේ. මට තේරෙනවා මගේ ගෙවල් ළඟම තිබෙන ඉස්කෝලේ. මගේ ගේ. ඊළඟට කඳු ගැටයේ පාසල මගේ ගමේ තිබෙනවා. මම හොඳට කෙලින් කන්ද, අත්වැල්තොට, මොරපිටිය, අතලේ, හැඩිගල්ල, දික්හේන, ඔය හැම පාසලක්ම දන්නවා. බොහෝ දුෂ්කර පාසල්. තීනියාවල, යට්ටපාත, ඉහළ විස්ස, පහළ විස්ස මේ ආදී පාසල් ඕනෑ තරම් බුලත්සිංහල ආසනයේ අමර ගෙදර, පරගොඩ, දෙල්මැහැල්ල මේ ආදී අති දුෂ්කර ඕනෑ තරම් පාසල්වලට ගිහිල්ලා තිබෙනවා. වැඩ කරලා තිබෙනවා. හදලා තිබෙනවා. මහන්සි වෙලා තිබෙනවා. මේ දරුවෝ ගැන, මේ දරුවන්ට විඳින්න වෙලා තිබෙන අනන්ත අප්‍රමාණ ප්‍රශ්න ගැන දන්නවා. ඒ නිසාවෙන් අද -

# රීති අංක 30 යටතේ යෝජනාව
MOTION UNDER RULE NO : 30

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ** - අමාත්‍යතුමා
Hon. Nishantha Sriwaranasinghe - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, "*අද දින සභාවේ වැඩ කටයුතු අවසන් වනතුරු කාලය දීර්ඝ කළ යුතු යැයි*" යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

මට අහන්න ලැබුණු පොඩි හිත රිදෙන කථාවක් තිබෙනවා. ඒ තමයි මුදල් එකතු කිරීමේ කාරණාව. මට ඒක තමයි මේ යෝජනා දෙකේම ටිකක් ළඟින් ආවේ. විශේෂයෙන් මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාවේ අන්තර්ගතය, මුදල් එකතු කිරීම. මට දෙපාර්ශවයෙන්, හතර පාර්ශවයෙන්ම කිව්වේ මුදල් එකතු කරන්නත් ඕනෑ කියලා. එකතු කරන්නත් ඕනෑ. නොකරත් බැහැ. සමහර තැන්වල උළු කැට කැඩිලා. බිම සිමෙන්ති ටික කැඩිලා. වතුර පයිප්ප ටික කැඩිලා. ඩෙස්ක් එක, පුටුව නැහැ. සමහර තැන්වල ඕනෑවටත් වඩා පහසුකම්. මේක තමයි මම අර කිව්වේ සම්පත් බෙදී යාමේ විෂමතාවයක් තිබෙනවා කියලා. ඉතින් අර 2008 චක්‍රලේඛ දෙක තුනක්, 1980, 2012 යේ, මේ චක්‍රලේඛ නිකුත් කරලා තිබෙනවා. සිසුන් ඇතුළත් කිරීමේ චක්‍රලේඛ නම් හරිම විෂමයි. ඒක කියන්න ඕනෑ. ඒක කවුරු ඉදිරිපත් කළත් ඒකේ ලොකු අර්බුද රැසක් මතු කරනවා. ඒ අර්බුද රැස තුළ තමයි අපේ ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා පැහැදිලි කළේ, තිස් තුනේ කථාවයි. තිස් පහේ කථාවයි. හතලිස් දෙකට යන කථාවයි. හතලිස් දෙකෙන් එහාට යන කථාවයි. අතර මැද මුදල් ගනුදෙනු වෙන කථාවයි.

[ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා]

අර පැත්තේ ගරු මන්ත්‍රීතුමා කථා කරන කොට මම අහගෙන සිටියේ. නම මතක නැහැ. මම එළියේ සිටියේ. මම අහගෙන මුදල් සම්බන්ධව කථා කරනවා. මන්ත්‍රීවරයෙක්ගේ කියලා කියන්නේ. පැහැදිලිවම අනුන්ගේ අල්ලසක් ගන්න කෙනෙක් නොවන බවට පත් විය යුතුමයි. ඒ අභිහිරි අත්දැකීම් මේ රටේ ඕනෑ තරම් තිබෙනවා. නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු ඇමතිතුමනි, FCID එකට ඔය පෝළිමේ යන්නේ. මේ කාරණාවට, මට උදව් කරන්න ඕනෑ, ඔබතුමන්ලා. යූ. ජෝර්ජ් පෙරේරා විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා. මේ පාසල් දරුවන් ඇතුළත් කිරීමේ කාරණාවේදී මුදල් හදල් ගනු දෙනු වෙනවා නම් - පාසලට මුදල් දුන්නාට කමක් නැහැ. ඒකට අපි ක්‍රමවේදයක් හදනවා. අදත් මම දෙකට කැඳවලා තිබෙනවා, මගේ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂතුමන්ලාව. විධිමත් ක්‍රමයකට. ඒක මම පස්සේ කියන්නම්. මේකේ අවසානයේ.

දැන් මෙතැන කථා කළා නේ? මහජන නියෝජිතයන් මුදල් ගන්නවා කියලා කියනවා නේ? ගරු ඇමැතිතුමනි, අප කාටත් ලොකු ලැජ්ජාවක් නේ? මන්ත්‍රීවරයෙක් දරුවෙක්ව පාසලකට ඇතුළත් කරලා අතරමැදි මුදලක් ගන්නවා නම්, විදුහල්පතිවරයෙක් පාසලට එන අම්මා කෙනෙකුට අශීලාචාර හිරිහැරයක් කරනවා නම් - ඒක නැහැයි කියන්න බැහැ නේ? ඒක වෙලා තිබෙනවා නේ? එතකොට තවත් එක එක පඬුරු පාප්කුඩම් ඉල්ලනවා නම් - දැන් පසුගිය දවස්වල මුදල් එකතු කරනවා, කාර් එකක් අරන් දෙන්න. මට දැනුම් දුන්නා. මම කිව්වා, කවුද මේ කරන්නේ? අපේ ලේකම්තුමා හොඳ කෙනෙක්. මම ඒක කියන්න ඕනෑ. මෙතැන නැති වුණත්. මම කිව්වා, වහාම බලන්න. ඒක නවත්වන්න. තව ගුරුවරයෙක් මුදල් එකතු කරනවා, ටියුෂන් එකක් කරන්න. මේ රජයේ දීප්ත ගුරු පත්වීම ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමනි. නිදහස් අධ්‍යාපනයෙන් උගන්වලා. මෙයා පහ වසරට ශිෂ්‍යත්වයට උගන්වන්න සල්ලි එකතු කරනවා. මම ඒකයි කිව්වේ. මේක එළිවන තුරු කතා කරන්න තිබෙන මාතෘකාවක්. අපි වැඩියෙන් කථා නොකර, කෙටි කරමු. නේද? ඒ නිසා මූල්‍ය අක්‍රමිකතා පිළිබඳව ගැටලු තිබෙනවා. මුදල් ගනුදෙනු වෙන කාරණා පිළිබඳව යහපත් සිතුවිල්ලකින් සත්භාවයෙන් පාසලකට මුදලක් දෙනවා නම් ඒක ගන්න ඕනෑ කොහොමද? ඒක වියදම් කරන්න ඕනෑ කොහොමද? කියලා ක්‍රමවේදයක් ගරු ඇමැතිතුමනි, අපි සකස් කළ යුතුයි. ඒ නිසාවෙන් මම ඒ ගැන ඊට වැඩිය කථා කරන්නේ නැහැ. ඔය චක්‍රලේඛ බොහොමයක් තිබෙනවා, සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමනි. ඔබතුමාගේ සාරගර්භ අදහස්වලට මම හොඳින් කන් දුන්නා. මම එයින් බොහොමයක් මගේ සිත් හි ධාරණය කර ගත්තා කියන එක බොහොම ගෞරවයෙන් මතක් කරන්න ඕනෑ.

ඒ වාගේම ලක්ෂමන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා මේ කරුණු හරිම ලස්සනට ඉදිරිපත් කළා. මම කියන්න ඕනෑ අපේ -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු ඇමැතිතුමා, වෙලාව සීමා කරන්න.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

සීමා කරන්න ඕනෑ නැහැ. තව විනාඩි දෙක තුනක් -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

තවත් කාරණා වගයක් තිබෙනවා. ප්‍රශ්න මාලාවක් අහලා තිබෙනවා.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

පොඩ්ඩක් විනාඩි දෙක තුනක් දෙන්න. මම ඉතින් කථා කරන්න අවශ්‍ය නැත්නම් වාඩි වෙන්නම්.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

නැහැ, නැහැ, කථා කරන්න.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ඒ නිසාවෙන් එක කාරණාවකට එමු. වැඩිය ඕනෑ නැහැ. දැන් මේ මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමා සහ ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමන්ලා දෙපළම විසින් ඉදිරිපත් කළේ ඉතාම වැදගත් යෝජනා දෙකක්. ඔවුන්ගේ දේශපාලන මතවාද. ප්‍රතිපත්ති මත මේ කාරණාවට කිසිම හරස් භාවයක් නැහැ. ඉතාම හොඳින් කන් දෙනවා. මම

මේ අධ්‍යාපන අමාත්‍යාංශ පුටුවේ වාඩි වුණේ ඒ හැඟීමෙන්ම තමයි. මම යූ. ජෝර්ජ් පෙරේරා විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමාටත් ඒක කිව්වා. මම ගාමිණී තිලකසිරි ගරු ඇමැතිතුමාටත් කිව්වා. මම ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමාටත් කිව්වා. ඒ නිසාවෙන් කමිටුවක් පත් කිරීම කියන වචනයක් මට ඇහුණා. කොහොම වෙතත් මම බලාපොරොත්තු වෙනවා, ඉදිරි දවස්වල ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමනි, මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමනි, සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමනි, එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරපු අපේ මැති ඇමැතිතුමන්ලා, අපේ මන්ත්‍රීතුමන්ලා, නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු ඇමැතිතුමා, ගොඩක් ඉන්නවා. මුස්ලිම් ජනතාව නියෝජනය කරන ගරු මන්ත්‍රීතුමන්ලා. සියලු දෙනාගෙන්ම සාකච්ඡාවක් කැඳවන්න. කමිටුවක් හැටියට. එක සැරේම මට ප්‍රකාශ කරගන්න බැහැ. මොකද, සාකච්ඡා කිහිපයක් - අදත් දෙකට එකක් දාලා තිබෙනවා. මම ඉතින් තවම අඩිය තිය තියා යනවා. මේක තේරුම් ගන්න. මගේ පරමාර්ථය මෙන්න මේකයි. මේ මූලා අක්‍රමිකතා තුළ තියෙන්නා වූ මේ තත්ත්වයට හොඳ විසඳුමක් සොයා යාම. දරුවන්ට අවශ්‍ය පහසුකම් හොඳින් ලබා දීම. ඒ වාගේම දරුවන්ට හොඳ විනයක් ඇති කිරීම. පාසල තුළින් හෙට දවසේ භාර ගන්න ඉන්න දරුවන්ට. ඒ වාගේම දරුවන්ට හොඳ උසස් ප්‍රතිඵල ඇති කර දීම. වැඩ බලන විදුහල්පතිවරු වෙනුවට ස්ථිර විදුහල්පතිවරු පත් කිරීම. පත් කරන තෙක් වැඩ බලන විදුහල්පතිවරු පුහුණුවට ලක් කිරීම. ගුරු පුරප්පාඩු විෂයයට අනුකූලව ගුරුවරුන් බඳවා ගැනීමේ නිසි ක්‍රමවේදයක් අනුගමනය කිරීම සහ යම් යම් ගුරු පුරප්පාඩු පවතිනවා. පුරවන්නට බැහැ. ලංකාවේ ඒ සඳහා සුදුසුකම් ලාභීන් සුළු ප්‍රමාණයයි විද්‍යා පීඨවලින් සහ විශ්ව විද්‍යාලවලින් බැහැර වෙන්නේ. ඒ අඩුව පුරවන්න විධිමත් ක්‍රම සකස් කිරීමට බලාපොරොත්තු වෙනවා.

ඒ වාගේම යම් මට්ටමක ගුරුවරුන්ට පුහුණුවක් ලබා දීලා, ඔවුන්ගේ දැනුම උසස් මට්ටමකට පත් කරන්න බලාපොරොත්තු වෙනවා. එක් එක් විෂයයන්වල දීර්ඝ කාලීන ඉගැන්වීම් කාර්යයයේ නියැලෙන ගුරුවරුන්ට පුස්තකාල සේවාවන් සපයන්න යම් ප්‍රතිපාදනයක් - නොමිලේ දෙන්න නොවෙයි. පොඩි ණයක් වාගේ. නොමිලේ දෙන්න ඉතින් අධ්‍යාපන අමාත්‍යාංශය ටිකක් - සමහර දේවල් බැහැ නේ? නමුත් එවැනි වැඩ පිළිවෙළවල් ක්‍රියාත්මක කරනවා. මේ වාගේ බොහෝ අදහස් තිබෙනවා. ඒ නිසා මගේ උත්සාහය ඇත කෙළවරේ ගම්වල ඉන්න දරුවන්ට මේ රටේ හෙට දවස භාර දෙන්න පුළුවන් හොඳ විනයක් තිබෙන හොඳ සංස්කෘතික සිරිත් විරිත් අගය කරන මේ රටට ආදරය කරන, මේ රටේ මිනිස්සුන්ට ආදරය කරන හොඳ කුසලතා පූර්ණ දරුවන් ටිකක් හදන්නයි. ඒ සඳහා බරපතළ ප්‍රවේශයක් තමයි මේ දරුවන් පාසලට ඇතුළත් කිරීම සහ අධ්‍යාපනය විධිමත් කිරීම සහ ඔවුන්ට අවශ්‍ය පහසුකම් සැලසීම සහ ඒ අතරතුර තිබෙන මේ ගැටලු විසඳාගැනීම. ඒ නිසාවෙන් මම ඉදිරි දවස්වලදී ඔබතුමන්ලාට ආරාධනා කරනවා, ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමනි. සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමනි, ගාමිණී තිලකසිරි ගරු ඇමැතිතුමනි, ඔබතුමන්ලා මගේ අමාතයාංශයට ඇවිල්ලා අපිත් එක්ක කථා කරලා අපි හැමෝම එකතු වෙලා හොඳ වැඩ පිළිවෙළක් සකස් කරමුයි කියලා යෝජනා කරමින්, අද මේ යෝජනා දෙක ඉදිරිපත් කළ මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමාට, ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමාට සහ අදහස් ප්‍රකාශ කළා වූ ගාමිණී තිලකසිරි ගරු ඇමැතිතුමා ඇතුළු සියලුම මැති ඇමැතුමන්ලාට මගේ හෘදයාංගම ස්තුතිය පුද කරනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු ඇමැතිතුමා, බොහොම ස්තුතියි. ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමාට විනාඩි දෙකක පිළිතුරු කථාවක් කිරීමට -

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඕනෑ නැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

යෝජනාවට එකඟතාවය?

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මීළඟට කාර්යපටිපාටි රීති අංක 30 යටතේ සභාව කල් තබන අවස්ථාවේ ඇසීමට මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමා ප්‍රශ්න මාලාවක් ගරු අධ්‍යාපන ඇමැතිතුමාට ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ සඳහා අවස්ථාව ලබා දෙනවා.

## රීති අංක 30 යටතේ ඉදිරිපත් කරන ලද ප්‍රශ්න
QUESTIONS PRESENTED UNDER RULE NO : 30

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමා මම අසනීප තත්ත්වයෙනුත් ඉන්නේ. සමහර ඒවා මට පෙනෙන්නෙත් නැහැ. හැබැයි, මම එකක් කියන්න ඕනෑ. පළමුවැනි ප්‍රශ්නය සඳහා -

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මම එහෙම නම් අහන්නද?

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ඔබතුමා අහනවා නම් හොඳයි. අහන්න පුළුවන්ද?

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

පුළුවන්.

(අ) නිට්ටඹුව අධ්‍යාපන සම්පත් මධ්‍යස්ථානය නිට්ටඹුව සංඝබෝධි මහ විද්‍යාලයට පැවරීමට සැප්තැම්බර් 26 වැනිදා බස්නාහිර පළාත් ප්‍රධාන අමාත්‍යවරයා කටයුතු කළ බව ඔබ දන්නෙහිද?

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

නැත.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

(ආ) මෙම සම්පත් මධ්‍යස්ථානය එකවර ගුරුවන් 200 ක් පමණ පුහුණු වීම් කටයුතු කළ හැකි බව ඔබ දන්නෙහිද?

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ඔව්.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

(ඇ) ගම්පහ අධ්‍යාපන කලාපයෙහි ගුරු පුහුණු කටයුතු සඳහා මෙන්ම වෙනත් ප්‍රජා සංවර්ධන කටයුතු සඳහා මෙම ආයතනය දශකයකට අධික කාලයක් භාවිතයට ගත් බව ඔබ දන්නෙහිද?

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ඔව්.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

(ඈ) ගම්පහ කලාපයේ ගුරු පුහුණු කටයුතු සඳහා නීත්‍යානුකූලව යොදා ගත හැකි ආයතනය මෙය බව ඔබ පිළිගන්නෙහිද?

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ඔව්.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

(ඉ)මෙම ගොඩනැඟිල්ල නිට්ටඹුව සංඝබෝධි විද්‍යාලයට පවරා දීමෙන් කලාපයේ ගුරු භවතුන්ගේ පුහුණු වීම් කටයුතු මෙන්ම ප්‍රජා සේවා පවත්වාගෙන යාමට බරපතළ බාධාවක් ඇති වන බව ඔබ පිළිගන්නෙහිද?

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ඔව්.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

(ඊ) නිට්ටඹුව සංඝබෝධි විද්‍යාලයේ ඇති ගොඩනැඟිලි අවශ්‍යතාවය දැනට සිදු කරන ඉදි කිරීම් අවසන් කිරීමෙන් පසු ප්‍රමාණවත් බවත් බව ඔබ පිළිගන්නෙහිද? පිළි නොගන්නේ නම් ඊට අදාළ නිශ්චිත කරුණු මොනවාද?

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ඒක නම් මම බලාපොරොත්තු වෙනවා, සොයා බලා අවශ්‍ය - ගරු මන්ත්‍රීතුමා, මම ස්ථානීය පරීක්ෂාවක් කළේ නැහැ. මේ සඳහා මම ස්ථානීය පරීක්ෂාවක් කරන්න බලාපොරොත්තු වෙනවා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

(උ) ඒ අනුව ගරු ප්‍රධාන අමාත්‍යවරයාගේ තීරණය සමඟ ඔබ එකඟ වන්නේද? සම්පත් මධ්‍යස්ථානය පාසලට පැවරීමට ගරු ප්‍රධාන අමාත්‍යවරයා ගෙන ඇති තීරණයට -

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

නැහැ, දැනට එහෙම පවරා ගැනීමක් වෙලා නැහැ නේ. එහෙම වෙන්න ඕනෑ අපේ අමාත්‍යාංශය යටතේ නේ.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මට අතුරු ප්‍රශ්න තිබෙනවා. මේ ටික ඉවර වෙලා මම අහන්නම්.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ඔව්. තව එකක් තිබෙනවා, ඒකත් අහන්න.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

එසේ නම් එම පවරා ගැනීමට ගත් තීරණය පළාතේ අධ්‍යාපන අමාත්‍යවරයා ලෙස ඔබ වැළැක්වීමට පියවර නොගන්නේ මන්ද?

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

එහෙම පවරා ගැනීමක් සිද්ධ වෙලා නැහැ.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

දැන් මෙහෙමයි. මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය. පසුගිය සැප්තැම්බර් 26 වැනිදා ගරු ප්‍රධාන අමාත්‍යතුමා - මේ අවස්ථාවේ එතුමා සිටියා නම් හොඳයි. මේ පාසලට හදිසියේ ගිහිල්ලා කාගේ හරි අනුදැනුමක්, උවමනාවක් මත මේ පාසලේ ලොග් සටහනක් යොදලා තිබෙනවා, නිට්ටඹුව අධ්‍යාපන සංවර්ධන මධ්‍යස්ථානය සංඝබෝධි විදුහලට පවරනවා කියලා. එතකොට එකක් මගේ අතුරු ප්‍රශ්නය, ඔබතුමා ඒක දන්නේ නැහැයි කියලා කිව්වේ. නමුත් එහෙම ලොග් සටහනක් යොදලා තිබෙනවා. එකක් තමයි, පළාත් සභා මන්ත්‍රීවරයෙකුට හෝ ඇමැතිවරයෙකුට හෝ ප්‍රධාන ඇමැතිවරයාට හෝ එහෙම ලොග් සටහන් යෙදීමේ අයිතියක් තිබෙනවාද?

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

මම දන්නා තරමින් නම් එහෙම ලොග් සටහනක් යොදවන්න අයිතියක් නැහැ.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

එහෙම ලොග් සටහනක් යොදලා තිබෙනවා. ඒ අනුව තමයි මම අද මේ ප්‍රශ්නය කල් තැබීමේ ප්‍රශ්නයක් හැටියට ඇහුවෙත්. මොකද, දැන් වන විට මා මෙහි සඳහන් කරලා තිබෙන විදියට ගම්පහ කලාපයේ ගුරුවරුන් පුහුණු කරන මධ්‍යස්ථානයක්. ඒ ගුරු පුහුණු මධ්‍යස්ථානය හදිසියේ මේ විදියට පවරා ගත්තොත් බරපතළ ගැටලුවක් මතු වෙනවා. ඒ නිසා වහාම මේ කටයුත්ත නතර කරන්න. මේක නීති විරෝධීයි කියලා තමයි මගේ අදහස. මොකද, එතුමාට එහෙම අයිතියක් නැහැ. එතුමාට අදාළ විෂයයකුත් නොවෙයි. මේක නීති විරෝධීයි. එක්කෝ නොදැනුවත් භාවය මත කරපු කටයුත්තක් කියලා හිතනවා. ඒ නිසා වහාම නතර කරන්නය කියන ඉල්ලීම තමයි තිබෙන්නේ.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

මම ඒක පිළිගන්නවා. බොහොම ස්තුතියි.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

බොහොම ස්තුතියි.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera - Chief Opposition Whip

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, 36(1) යටතේ පොඩි වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. ගරු ප්‍රධාන අමාත්‍යතුමා පැමිණීමත් සමඟ අපට මිලියන 1.2 ක මුදලක් වෙන් වුණා. ඒකට අපේ හෘදයාංගම ස්තුතිය පුද කරනවා. රෙජිනෝල්ඩ් කුරේ හිටපු ගරු මහ ඇමැතිතුමාගේ සංකල්පය පිළිගත්තා. යාහපාලනයත් එක්ක ඒ වෙනස ඇති වුණා. දැනට අපට ඔක්කෝම අවුරුද්දට මිලියන 4.7 ක් හම්බ වෙලා තිබෙනවා. ඒ ලියුමේ තිබෙනවා, පොඩි කාණ්ඩවලට, Categories වලට වෙන් කරලා. ගරු අමාත්‍යතුමනි, දෙසැම්බර් මාසය වන විට. අපට මාස තුනයි තිබෙන්නේ. විශාල වශයෙන් නවක මන්ත්‍රීවරු ඉන්නවා. ඒ අයට මේ මුදල් වෙන් කරන ක්‍රමවේදය ඉක්මණට කර ගන්න බැරි වෙනවා. එතකොට භාණ්ඩ ගැනීමක් තමයි මාස තුනේදී වෙන්නේ. එම නිසා මේක අමාත්‍යාංශයෙන් ලැබෙනවා නම්, ගරු මහ ඇමැතිතුමා මේ දේ කළා නම් එහෙම වෙන්නේ නැතිව මොන ව්‍යාපෘතියක් හරි දාන්න පුළුවන් විධියට සංශෝධනය කරන්න කියලා ගරු නියෝජ්‍ය සභාපතිතුමා මාර්ගයෙන් ගරු ප්‍රධාන අමාත්‍යතුමාගෙන් ඉල්ලීමක් කරනවා.

ඒ වාගේම අපි දන්නවා, නවක ගරු මන්ත්‍රීවරුන්ට දැන් 1.2 යි හම්බ වෙන්නේ. එතුමන්ලාටත් මේ අවුරුද්දේ ප්‍රතිපාදන ලබා දෙන්නය කියන එක සම්පූර්ණයෙන් ඉල්ලීමක් කරනවා. පුළුවන් විධියට. ඒක ආණ්ඩු පක්ෂයටත්, විපක්ෂයටත් පොදු දෙයක්. මෙතුමන්ලාට ලක්ෂ 12 නොවෙයි. පුළුවන් නම් 75% ක් හරි, නැත්නම් සම්පූර්ණ මුදල හරි ලබා දෙන්න කටයුතු කරන්නය කියන එක ඔබතුමා මාර්ගයෙන් ඉල්ලීමක් කරනවා.

ඒ වාගේම මට දැනගන්න ලැබිලා තිබෙනවා. ඊයේ පෙරෙයිදා මේ ආණ්ඩු පක්ෂයේ උදව්යට වැසිකිළි පද්ධති නවීකරණය කිරීමේ ෆෝම් ගම්පහ දිස්ත්‍රික්කයේ බෙදෙනවා. ග්‍රාමසේවකවරු අත්සන් කරනවා. ඒ ක්‍රියාදාමයත් මොකද වෙන්නේ? කාගෙන්ද මේක වෙන්නේ. ගරු සෞඛ්‍ය ඇමැතිතුමා දුන්න ඒවාද? නැත්නම් පරණ මහ ඇමැතිතුමාද? මේ තුළ අපේ විපක්ෂයේ කණ්ඩායමේ පොඩි විවිකිච්චාවක් තිබෙනවා, මොකක්ද මේ වැඩ පිළිවෙළ. මෙහෙම දේවල් වෙනවා නම් ඒක යපාලනයද? නැත්නම් විනිවිධ පෙනෙන්නද? නැත්නම් ඒකට සාධාරණයක් ඉෂ්ට කරන්න. අනික් එක ගරු අමාත්‍යවරු අමාත්‍යාංශ මට්ටමින් දෙන මුදල්, කණ්ඩායම් වශයෙනුත් අපි ඉල්ලීමක් කළා. සාධාරණව අපටත් ලබා දෙන්න. මේ වෙනසට ඒක දායකත්වය කරගන්න කියන එක අවංක ඉල්ලීමක් කරනවා. එදා සිට මම ඒ ස්ථාවරයේ ඉන්නේ. සියලුම ගරු මන්ත්‍රීවරුන් වෙනුවෙන් කථා කරන්නේ. එහෙම අසාධාරණයක් වෙන්න දෙන්න එපා. ඒක අපේ වරප්‍රසාද කඩවීමක්. එහෙම වෙන්න එපා. පාසල් ළමයින් ඇතුළත් කිරීමේදී හරි. මොනවා හරි දෙයක් තිබෙනවා නම්. අද කථා කළේ ඒ අක්‍රමිකතා සම්බන්ධව. සාධාරණය ඉෂ්ට කරන්න කියලා තමයි මේ ඉල්ලීම කරන්නේ. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

බොහොම ස්තුතියි, යූ. ජෝර්ජ් පෙරේරා විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා. කරුණු කාරණා බොහෝ දෙයක් අද සාකච්ඡා වුණා. එහෙමනම් න්‍යාය පත්‍රය අවසානයි.

# කල් තැබීම
## ADJOURNMENT

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

*"දැන් මම මෙම සභාව කල් තබනවා."*

***ඊට අනුකූලව පළාත් සභාව පූ.භා. 01.45 ට, 2015 ඔක්තෝබර් මස 20 වන දින පූ.භා. 09.30 වන තෙක් කල් ගියේය.***

*Accordingly, the Provincial Council was adjourned at 01.45 a.m till 09.30 a.m, on 20.10.2015*